## 2026.03.10 වන දින පැවති ඇහැළියගොඩ ප්‍රාදේශීය සභාවේ.
## සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව.

මෙදින පෙ.ව 9.30 ට සාමාන්‍ය මහා රැස්වීම ආරම්භ වූ අතර පහත නම් සඳහන් ගරු සභික මහත්ම මහත්මීන් සහභාගී විය.
**නොපැමිණීම්:-**

| අනු අංක | නම | තනතුර |
|---|---|---|
| 01. | ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා | ගරු සභාපති |
| 02. | ගරු මන්ත්‍රී යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා | ගරු උප සභාපති |
| 03. | ගරු මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා | සභික |
| 04. | ගරු මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා | සභික |
| 05. | ගරු මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා | සභික |
| 06. | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා | සභික |
| 07. | ගරු මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා | සභික |
| 08. | ගරු මන්ත්‍රිනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය | සභික |
| 09. | ගරු මන්ත්‍රිනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය | සභික |
| 10. | ගරු මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා | සභික |
| 11 | ගරු මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා | සභික |
| 12 | ගරු මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා | සභික |
| 13 | ගරු මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා | සභික |
| 14 | ගරු මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා | සභික |
| 15 | ගරු මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය | සභික |
| 16 | ගරු මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා | සභික |
| 17 | ගරු මන්ත්‍රිනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය | සභික |
| 18 | ගරු මන්ත්‍රී මැතිතුමා | සභික |
| 19 | ගරු මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා | සභික |
| 20 | ගරු මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා | සභික |
| 21 | ගරු මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා | සභික |
| 22 | ගරු මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා | සභික |
| 23 | ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා | සභික |
| 24 | ගරු මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා | සභික |
| 25 | ගරු මන්ත්‍රිනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය | සභික |
| 26 | ගරු මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා | සභික |
| 27 | ගරු මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා | සභික |
| 28 | ගරු මන්ත්‍රී පී.මාලින්ද මුදන්නායක මැතිතුමා | සභික |
| 29 | ගරු මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා | සභික |
| 30 | ගරු මන්ත්‍රිනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය | සභික |
| 31 | ගරු මන්ත්‍රී ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා | සභික |
| 32 | ගරු මන්ත්‍රී එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා | සභික |
| 33 | ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා | සභික |
| 34 | ගරු මන්ත්‍රිනී සරෝජනී ජිනේන්ද්‍රානි මැතිණිය | සභික |
| 35 | ගරු මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා | සභික |

**නොපැමිණි:-**
සභික ගරු මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා.

01.එස්.කේ.අනුෂා රෝෂිණී මිය ප්‍රධාන කළමණාකරණ සේවා නිලධාරී ලෙස සහභාගී විය.

**සභාපතිතුමා :-**
අද දින ලේකම්තුමා අසනීප තත්වයේ පසුවන නිසා රත්නපුර රෝහලේ ප්‍රතිකාර ගනු ලබනවා. එමනිසා එතුමාට ඉක්මන් සුවය ප්‍රාර්ථනා කරමින්ම, අද දින පැමිණ සිටින උපසභාපතිතුමා, සියලුම මන්ත්‍රීවරුන් මන්ත්‍රීවරියන්, ඒ වගේම ප්‍රාදේශීය සභාවේ ප්‍රාධන පරිපාලන නිලධාරිතුමිය, ඒ වගේම ප්‍රාදේශීය සභාව නියෝජනය කරන නිලධාරීන් දෙපළ ඒ වගේම මාධ්‍යවේදී සහෝදර හිතවතුන් සියලු දෙනාම මම මේ අවස්ථාවේ ඉතාමත් ම ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.එහෙම නම් අපි අද දිනයේ න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරමු.

**සභාපතිතුමා :-**
**01.පසුගිය සභා වාර්තා සම්මත කිරීම.**

**01.01.**2026.02.10වනදිනපැවති සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීමටයෝජනා කරමි.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ 16වන පිටුවේ මුල් ජේදයේ වාර්ෂික වාර්තාවක් ලෙස සඳහන්ව ඇති කොටස තාක්ෂණික වාර්තාවක් ලබාගත යුතුයි ලෙසට සංශෝධනය විය යුතුයි.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පසුගිය සභා වාර්තාවේ 06.09 යෝජනාව සභාපතිතුමා විසින් 2026 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම මහා සභාවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණා.ඒ සම්බන්ධයෙන් ප්‍රසම්පාදන වාර්තාවක් අප විපක්ෂයේ මන්ත්‍රී කණ්ඩායම ඉල්ලා සිටියාට පසු විනාඩි කිහිපයකට පසු තමයි ලැබෙන්නේ. ඒක මේ වාර්තාවේ කොතනද තියෙන්නේ.එදා සිදු වුණේ අපි ප්‍රසම්පාදන වාර්තාව ඉල්ලුවා.අපිට දීල තිබුණේ නැහැ.හරි දෙන්නම් කියලා ඒ යෝජනාව පසුවට කල් තැබුවා.ඒ සම්බන්ධයෙන් මේ වාර්තාවේ නැහැ.අපි එදා කරපු කාර්යභාරය. අපි එදා දක්වපු අදහස් මේ වාර්තාවේ තිබිය යුතුයි.එය කරුණාකර මේ වාර්තාවේ ඇතුළත් කරන්න.මම බලාපොරොත්තු වෙනවා එය ලබන මස වාර්තාවට ඇතුළත් කරයි කියා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, 2025-02.10වනදිනපැවති සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව සභා සම්මත කරමි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 2026.02.10වනදිනපැවති සාමාන්‍ය මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන සහිතව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**02.සභාපතිවරයා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතු නිවේදන.**

**සභාපතිතුමා :-**
මේ අවස්ථාවේදී මම අපේ සියලුම මන්ත්‍රීවරුන්ගෙන් සහ මන්ත්‍රීවරියන්ගෙන් ඉතාමත්ම කාරුණිකව ඉල්ලා සිටිනවා, අපි සභාවේ වැඩ කටයුතු කරගෙන යද්දී ,අපි හැමදෙයක්ම කතා කරන්න ඕනේ.තර්ක විතර්ක කර හැමදෙයක්ම පෙන්වා දෙන්න ඕනේ.නමුත් සමහර වෙලාවට අපි කතා කරනවා රෙකෝඩින් එක ඇහුවත් තේරෙන්නේ නැහැ.ඔක්කොම නැගිටින්නෙ නැතුව,දෙන්නෙක් නැතුව එක්කෙනෙක් නැගිටල කතා කරන්න.මහජන ඡන්දයෙන් පත්ව සිටින මන්ත්‍රීතුමන්ලා කතා කරන්නනමුත් ඔක්කෝම නැගිටල කතා කලාට වැඩක් නැහැ.මුකුත් ඇහෙන්නෙත් නැහැ.ලියාගන්නවත් තේරෙන්නේ නැහැ.එම නිසා එකපාර එක්කෙනෙක් කතා කරලා,ඒකට උත්තර දීල එහෙම සංයමයකින් යුතුව සියලු දෙනාම කතා කරනු ඇතැයි මම ඉතාමත්ම ඕනෑකමින් ඉල්ලා සිටිනවා. එමෙන්ම විෂය කරුණු වලට අදාළ නැතුව පුද්ගලික චරිත ඒ වගේ දේවල් කතා කරන්නේ නැතුව මම කාරුණිකව ඉල්ලා සිටිනවා,අපේ න්‍යාය පත්‍රෙය් තිබෙන කරුණු වලට අනුව තර්ක විතර්ක සංවාද විසංවාද සමඟ ඉදිරියට යනු ඇතැයි කියා මම බොහොමත්ම ඕනෑකමින් ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා :-**
**03. මහා සභාවට පැමිණිය නොහැකි බව දන්වා ඇති ලිපි සභාගත කිරිම.**
ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා ලිපියක් එවා තිබෙනවා. ප්‍රාදේශිය සභා රැස්වීමට පැමිණීමට නොහැකි බව දන්වා ලිපියක් එවලා තියෙනවා.එය මේ මොහෙතේ සභාගත කරනවා.
ප්‍රාදේශිය සභා රැස්විමට සහාගීවිමට නොහැකි බව දන්වා සිටිමි.ඉහත නම් සඳහන් මා හට 2026.03.10 වන අද දින පැවැත්වෙන මහා සභා රැස්වීම සඳහා සහභාගීවීමට නොහැකි වන බව කාරුණිකව දන්වා සිටිමි.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම නිවාඩු අනුමත කිරීමේ යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමාගේ නිවාඩු අනුමත කිරීමේ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපිට ඔබතුමා ගියවර ආරාධනා කළා ඇහැලියගොඩ නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ සමාරම්භක උත්සවයට.විපක්ෂයෙන් 04 දෙනෙක් සහ ආණ්ඩු පක්ෂයෙන් 04 දෙනෙක් සහභාගී වෙන්න කියලා.නමුත් පසුව ඔබතුමා ඉල්ලීමක් කළා අපෙන් දෙදෙනෙක් සහභාගී වෙන්න කියලා. එහිදී ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු ඔබතුමා ඇතුළුව 7 දෙනෙක් සහ විපක්ෂයේ මන්ත්‍රීවරු දෙදෙනෙක් සහභාගී වුණා. ඒ වගේම කුරුවිට ප්‍රාදේශිය සභාවේ සභාපතිතුමා සමඟ මන්ත්‍රීවරු දෙදෙනෙක් සම්බන්ධ වෙලා සිටියා. කුරුවිට ප්‍රාදේශිය සභාවට ඇහැලියගොඩ නගරයෙන් නගර සීමාව පාස් කරලා මීටර් 100ක 150ක ප්‍රමාණයක් තමයි නගර සංවර්ධනයට අදාල කොටසට සම්බන්ධ වෙන්නේ.බදුවත්ත සෙරමික් හන්දියේ සිට...

**සභාපතිතුමා:-**
නැහැ මන්ත්‍රතුමා පුස්සැල්ල දක්වා ඒ සැලැස්ම තියෙනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ලේන් හතර මාර්ගය යනවද

**සභාපතිතුමා:-**
ලෙන් හතර මාර්ගය දැනට අපි සැලසුම් කරලා තියෙන්නේ බදුවත්තට පමණයි. නමුත් ඉස්සරහ අවන්හලක් තියෙනවා පරකඩුව ප්‍රදේශයේ.ඒනිසා කුරුවිට මන්ත්‍රීවරු සහභාගී වුණේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
අපිට තිබෙන ගැටළුව තමයි.ඇහැලියගොඩ අපි විපක්ෂය විදිහට මන්ත්‍රීතුමන්ලා 18 දෙනෙක් සහ ආණ්ඩු පක්ෂය විදිහට මන්ත්‍රීවරු 18 දෙනෙක් සභාවට පත්වෙලා ..ඊට පස්සේ යම් යම් බෙදීම්....

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,රීති ප්‍රශ්නයක් .අදහස් තියෙනවා නම් වෙනතත් අදහස් වෙලාවට ඉදිරිපත් කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා:-**
ඔව් අදහස් වෙනත් යෝජනා වලදී ඉදිරිපත් කරමු.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගැටළුව තියෙන්නේ අපට ලැබුණු ප්‍රමාණය මදි කියලා.අපිත් 45%කට වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබාගෙන තියෙනවා විපක්ෂය විදිහට.අපටත් නගර සංවර්ධනය සඳහා අපේ තියෙන අදහස් කියන්න අවස්ථාව දෙන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ සම්බන්ධව කතා කරන්නේ කොයි වෙලාවේද

**සභාපතිතුමා:-**
පෞද්ගලික යෝජනා තියෙනවානේ. ඒ වෙලාවේ කතා කරන්න පුළුවන්.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
මට කියන්න තියෙන කාරණාව තමයි ඔබතුමා 04දෙනෙකුට සම්බන්ධ වෙන්න කියලා දැනුම් දුන්නා.ඊට පස්සේ දෙදෙනක් සම්බන්ධ වෙන්න කියලා, අපේ මන්ත්‍රීතුමන්ලා දෙදෙනෙක් සම්බන්ධ කළා.එවිට සභාපතිතුමා අපිත් මේ නගරය සම්බන්ධ මිනිස්සු.සභාවේ එදා ඉදන් ඉන්න මිනිස්සු.අපෙත් අදහස් ගන්න තියෙනවා.ඒ ගත්ත තීන්දුව වැරදියි.

**සභාපතිතුමා :-**
බොහොම ස්තුතියි. අපි ඉදිරියට යමු.

**සභාපතිතුමා :-**
**04.ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම්,පැමිණිලි හා සන්නිවේදන.**
කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
**05.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න.**
කිසිවක් ලැබී නැත.

**සභාපතිතුමා :-**
**06.යථා පරිදි කල් දී ඇති යෝජනා.**

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.01 යෝජනාව

**06.01. 2026 අප්‍රේල් මස සාමාන්‍ය මහා සභා රැස්වීමට නියමිත දිනය වන 2026.04.14 වන දින සිංහල හා හින්දු අලුත් අවුරුද්ද යෙදී ඇති බැවින්, එදිනට පැවැත්වීමට නියමිත සාමාන්‍ය මහා සභා රැස්වීම 2026.04.07 වන දින පැවැත්වීමට යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මේක ගරු මන්ත්‍රීවරුනි.අපි සාමාන්‍යයෙන් මහා සභා රැස්වීම කරන්නේ, සෑම මසකම දෙවෙනි සතියේ අඟහරුවාදා.අපිට ඊළඟට එන්නේ අප්‍රේල් මස 14වන දින. එදින සිංහල දෙමළ අලුත් අවුරුද්ද නිසා, ඒක අපි සතියකින් ඉස්සරහට ගෙන අප්‍රේල් මස 07වන දින පැවැත්වීම සුදුසු බව තමයි අපි යෝජනා කළේ.
ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.01 යෝජනාවයටතේ,2026 අප්‍රේල් මස සාමාන්‍ය මහා සභා රැස්වීමට නියමිත දිනය වන 2026.04.14 වන දින සිංහල හා හින්දු අලුත් අවුරුද්ද යෙදී ඇති බැවින්,එදිනට පැවැත්වීමට නියමිත සාමාන්‍ය මහා සභා රැස්වීම 2026.04.07 වන දින පැවැත්වීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.02යෝජනාව

**06.02. 2026 පෙබරවාරි මස ගෙවීම් වාර්තාව සහා අනුමැතිය සඳහා යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.02යෝජනාවයටතේ,2026 පෙබරවාරි මස ගෙවීම් වාර්තාව සහා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.03යෝජනාව.

**06.03. 2026.02.09 වන දින පැවති මුදල් කමිටුව මගින් අනු අංක 2 යටතේ සඳහන් කර ඇති කරුණට අනුව ට්‍රැක්ටර් රථ ගමන් කිරීම සඳහා බේරුවාන කසළ අංගනයේ පාරවල් 05ක් සැකසිය යුතු බවත් ඒ සඳහා ඇස්තමේන්තුවක් සකසන ලෙසත් දක්වා ඇත.ඒ අනුව අංගනයේ ප්‍රධාන පාර සඳහා සකසා ඇති ඇස්තමේන්තුව ඉදිරිපත් කරන අතර, ඇස්තමේන්තුවට අනුව කසල අංගනයට ඇතුළු වන ප්‍රධාන පාර සැකසීමේ යෝජනාව ඉදිරිපත් කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.03යෝජනාවයටතේ,2026.02.09 වන දින පැවති මුදල් කමිටුව මගින් අනු අංක 2 යටතේ සඳහන්කර ඇති කරුණට අනුව ට්‍රැක්ටර් රථ ගමන් කිරීම සඳහා බේරුවාන කසළ අංගනයේ පාරවල් 05ක් සැකසිය යුතු බවත්, ඒ සඳහා ඇස්තමේන්තුවක් සකසන ලෙසත් දන්වා ඇත.ඒ අනුව අංගනයේ ප්‍රධාන පාර සඳහා සකසා ඇති ඇස්තමේන්තුව ඉදිරිපත් කරන අතර, ඇස්තමේන්තුවට අනුව කසල අංගනයට ඇතුළු වන ප්‍රධාන පාර සැකසීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.04යෝජනාව.

**06.04.කොන්ත්‍රාත්/තත්කාර්ය රියදුරු, මුරකරු සෞඛ්‍ය කම්කරු සේවකයින්ගේ දීමනා ගෙවීමෙන් පසු සභා අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය මැතිතුමා:-**
**ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.**

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම ගෙවීමට ඉදිරිපත් වන සේවක ප්‍රමාණය දැනගන්න පුළුවන්ද?

**සභාපතිතුමා :-**
පුළුවන්.සෞඛ්‍ය කම්කරු 16යි.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
මුරකරු කීයද?

**සභාපතිතුමා :-**
මුරකරු02යි

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
රියදුරෝ? මට දැනගන්න ඕනි 2025.12.31න් පසු මෙහි සේවක වැඩි වීම කොපමණදකියලා.වැඩිවෙලා තියෙනවද? අඩුවෙලා තියෙනවද?

**සභාපතිතුමා :-**
ගරු මන්ත්‍රීතුමා.න්‍යාය පත්‍රය කලින් ලැබෙනවානේ. එහි කල් දී ඇති ප්‍රශ්න යටතේ තිබෙනවා .ඒවාට දාපුවහම උත්තර දෙන්න පුළුවන් .අපි හොයල ලියල ගෙනත් දෙන්න ඕනනේ. දැන් අපරාදෙ කාලය .

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
දල වශයෙන් කියන්නකො. අදහසක් ගන්න විතරයි.මම මීට කලින් කල් දී ඇති ප්‍රශ්න යටතේ එකක් ඇහුවා උත්තර හම්බුනේ නැහැ. මම එහෙම එවලා තියෙනවා.එහෙම උත්තර හම්බෙලා නෑ.සභාවෙදි අහන්න වෙලා තියෙන්නේ ඒකයි.

**සභාපතිතුමා :-**
ඒකට සුළු මොහොතක් දෙන්න.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ඒ කියන්නේ අපි ලියල ඉදිරිපත් කරන්න අවශ්‍යද?මට තව ගැටළුවක් තියෙනවා. අපි දැන් සේවකයින් යම් ප්‍රමාණයක් අරන් තියෙනවා නම් ඔවුන් අපේ වසම් 44 ඇතුළතද පිටතද කියල උත්තරයක් දෙන්න පුළුවන්ද ?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමා,අපිට තියෙනවානේ රීති

(ඝෝෂාව)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමා,රීති ප්‍රශ්නයක්.කල් දී ඇති ප්‍රශ්න.වගන්ති අංක 19 අංක 1සිට 8 දක්වා තියෙනවා වගන්ති. ප්‍රාදේශීය සභාවේ කටයුතුවලට අදාළ ප්‍රශ්න සභාපතිවරයාගෙන් අසනු ලැබිය හැකිය. අහන්න පුළුවන්. නමුත් අපේ යෝජනා ලියන කොලේ තියෙනවානේ.එම කොලේ තියෙනවා යෝජනා සහ ප්‍රශ්න කියලා ඇල ඉරකින් වෙන් වෙලා. එහි යෝජනා කියන කෑල්ල කපලා ප්‍රශ්න යටතේ ලියන්න පුළුවන්.එම රීති අනුව කටයුතු කරමු. වගන්ති 09 ක් තියෙනවා. 9 වෙනි එකේ මෙහෙම තියෙනවා."ඉදිරිපත් වන කවර හෝ ප්‍රශ්නයක් අධිකරණයේ විනිශ්චයට භාජනය වන කරුණක් හා සම්බන්ධයෙන් අදාළ සිදුවීමක් නොවිය යුතුය."

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමා,එම රීති 09 පිළිබඳව පොඩි අවබෝධයක් තියෙනවා.ලොකු අවබෝධයක් නම් නෑ.ගැටළුවක් මතු වෙනකොට එම ගැටළුවට අදාළ ප්‍රශ්නය තමයි අපි විපක්ෂයක් විදිහට අහන්නේ. එහි නීතිමය ප්‍රශ්නයක් තියෙන්න පුළුවන්. හැබැයි මම අහන්නේ.එම ප්‍රශ්නය එම අදාළ තැන දී අහන්නේ නැතුව අපි වෙනත් අදහස් යටතේ අහනකොට එහි ගුණාත්මකභාවය පිළිබඳව අපිට ගැටළුවක් තියෙනවා.

**සභාපතිතුමා :-**
මේක මන්ත්‍රීතුමා ඒක හරි ඔබතුමා කියන එකමේක නිශ්චිතයිනේ.මේක ගැටළුවක් වෙන්නේ නැහැ. මේක වේලාසන දීපු එකක්නේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, දැන් රීතිය හරි. හැබැයි රීති ප්‍රශ්නයක් තියෙනවා. අපි යථා පරිදි කල් දී ඇති ප්‍රශ්නයක් අහන්න නම් සෙනසුරාදා ,ඉරිදා ,පෝය දින ඇරලා දවස් 07කට කලින් දාන්න ඕනි. සභා වාර්තාව අපට හම්බෙන්නේ දවස් 4 කට කලින්.ඒක හරි.එහෙම වුණොත් සභා වාර්තාව දවස් 10කට 15කට කලින් දෙන්න වෙනවා.සභාවට දාන්න නම් සභාවට දවස් 07කට කලින් අපි භාරදෙන්න ඕනි.මේ වාර්තාව ආවම අපි කොහොමද කලින් පුරෝකථනය කරලා දාන්නේ. 19.2 දෙවනි ඡේදයේ "සභාපතිවරයා වෙතින් වාචික පිළිතුරු අපේක්ෂාවෙන් ඉදිරිපත් කරනු ලබන ප්‍රශ්න ලිඛිතව සකස් කර ප්‍රශ්න ඉදිරිපත් කරන සභිකවරයා විසින් සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දින හැර සභා රැස්වීම පැවැත්වීමට දින හතකට පූර්වොක්තව න්‍යාය පත්‍රයට ඇතුළත් කිරීම සඳහා ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා වෙත භාර දිය යුතුය."අපිට සභාවට යෝජනා ඉදිරිපත් කරන්න පුළුවන්. ඔබතුමාගෙන් වාචික පිළිතුරක් හරි බලාපොරොත්තු වෙන ප්‍රශ්නයක් දින 07කට කලින් දාන්න පුළුවන්.වාර්තාවෙ තියෙන යෝජනාවක් සම්බන්ධයෙන් අපිට ප්‍රශ්නයක් ආවොත් ඒක ඒ වෙලාවේ අහන්න අවසර තියෙන්න ඕනේ සභාපතිතුමා.එහෙනම් මේ සභාව කරන්න වෙන් නැනේ සභාපතිතුමා.

**සභාපතිතුමා :-**
මන්ත්‍රීවරුන්ට ලිඛිතව දෙන්නත් පුළුවන්. හොයල බලන්නත් අයිතිය තියෙනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
හොයල බලන්න අවස්ථාව තියෙනවා.ඒක අපි පිළිගන්නවා. හැබැයි මේ ගෙනාපු තර්කය වැරදියි ගරු සභාපතිතුමා. අපි වෙනදට නිලධාරීන් ගෙන්නල මෙතන ප්‍රශ්න කරනවා.අපිටඒ අවස්ථාව නැතිවෙලානේ. මේකෙ වරදක් තියෙනවා කියන්නකො.අපි හිතාගෙන ඉන්නවා 2025 නිලධාරීන් 25 ක් හිටියා.2025 වර්ෂය අවසන් වෙනකොට 100 ක් ඉන්නවා.ඒ 100 ට සභාවේ අනුමැතිය ලැබිලා නෑ.ඒක උදාහරණයකට ගත්තේ.එතකොට අපිට ප්‍රශ්න කරන්න අයිතියක් තියෙන්න ඕනේ.කල් දී ඇති ප්‍රශ්නයි.කල් දී ඇති යෝජනායි කියන්නේ දෙකක් සභාපතිතුමා.මම පිළිගන්නවා.ඒක මට තේරෙනවා. යෝජනාවක් උනත් දවස් 07කට කලින් දාන්න ඕනි. සෙනසුරාදා ,ඉරිදා,රජයේ නිවාඩු දින ඇරලා. නමුත් මේ වෙන්නේ අද දින සාකච්ඡා වන යෝජනාවක් සම්බන්ධව මේ කතා කරන්නේ.සභාපතිතුමා ඒක ප්‍රයෝගික නැහැ. අපිට කල් දී ඇති ප්‍රශ්නයක් සභාවට මේ න්‍යාය පත්‍රයට ඔබතුමා දාල එවන්න ඕනේ.න්‍යාය පත්‍රය අපිට ලැබුණට පස්සේ ඇතිවන ප්‍රශ්නයක් අපිට ආයෙ න්‍යාය පත්‍රයට දාන්න බෑ සභාපතිතුමා.මේක ප්‍රශ්න දෙකක්.

**සභාපතිතුමා :-**
පළවෙනි ප්‍රශ්නය කියන්න ඔබතුමා

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
අපිට සභාවට කල් දී ඇති ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න පුළුවන්. කල් දී ඇති ප්‍රශ්නයක් සෙනසුරාදා ,ඉරිදා,රජයේ නිවාඩු දින හැර දින 7 ක් ඇතුළත කල් දී ඇති ප්‍රශ්නයක් දාන්න ඕනි. කල් දී ඇති යෝජනාත් එහෙමයි. ඊළඟ සභාවට දවස් දහයකට කලින් හරි දින දාල අවසාන දිනයක් දාල අපෙන් යෝජනා එකතු කර ගන්නේ.එතකොට සභා වාර්තාවත් අපිට කලින් එවන්න බෑ.එතකොට ඒ සභා වාර්තාව ලැබුණට පස්සේ ඒකෙ තියෙන ප්‍රශ්නයක් මට මතු වෙනවා. එතකොට මට ඒක අහන්න බෑ කල් දී ඇති ප්‍රශ්න ගොඩන් . මං ඒකයි සභාපතිතුමා කියන්නේ. එතකොට මට ඒ ප්‍රශ්නය සභාපතිතුමාට කෝල් කරලා අහන්න පුළුවන් .ලේකම්තුමාට කතා කරලා අහන්න පුළුවන්, මෙහෙම එකක් තියෙනවා කියලා.නැත්තන් අපිට ප්‍රශ්නයක් අහන්න තියෙන තැන තමා සභාව. සභාවෙදි අපිට ප්‍රශ්නයක් ඇති වෙනවා, ඒ ප්‍රශ්නයක් ඇති වුණාට පස්සේ සභාවෙදි තමා කතා කරන්න ඕනේ.ඒ

අවස්ථාව මඟ හැරියොත් ඕනම යෝජනාවක් අනුමත කළා ඒක එතනින් ඉවරයි.ඒ සම්බන්ධව කතා කරන්න තියෙන අවස්ථාව නැති වෙනවා.මම හිතන්නේ සභාපතිතුමාටයි උප සභාපතිතුමාටයි පැහැදිලි ඇති.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගයාෂාන් මන්ත්‍රීතුමා කිව්ව කාරණය හරි.මන්ත්‍රීවරුන්ට පුළුවන් යථා පරිදි කල් දී ඇති යෝජනා සහ යථාපරිදි කල් දී ඇති ප්‍රශ්න විදිහට සභාවට ඉදිරිපත් කරන්න.ඔවුන් කිව්වා වගේ අපිට යෝජනා දින හතකට පූර්වයෙන් අපි දෙන්න ඕනේ.එවිට ඒක න්‍යාය පත්‍රයට එනවා.ඒ කියන්නේ අර කිව්ව උක්ත ප්‍රශ්නය මේකට ඉදිරිපත් වෙලා එනවා. එවිට සභාව විදිහට නිලධාරීනුත් ඔබතුමත් ඒකට ලෑස්ති වෙලා එනවා. ඒ වගේම මෙතන කතා කරන ප්‍රශ්නයක් තියෙනවානේ.මෙතන කතා කරන යෝජනාවකට අදාළ ප්‍රශ්නක් අහන්න අයිතිය තියෙනවා.ඒක ආපහු යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න වලට දාන්න ඕනි නැහැ.දැන මෙතන යෝජනාව තියෙන්නේ කොන්ත්‍රාත්/තත්කාර්ය රියදුරු, මුරකරු සෞඛ්‍ය කම්කරු සේවකයින්ගේ දීමනා ගෙවීමෙන් පසු සභා අනුමැතිය ලබා ගැනීමට, මෙතන අහන්නේ (ඝෝෂාව) ඊට පස්සේ අහපු එක ගැන මම කියන්නේ.ඊට පස්සේ ඇහුවේ මොක්ක්ද, මෙතන සභාවේ ඒ අයගේ පදිංචි ප්‍රදේශයන්.සභාපතිතුමා ළඟ නැහැ. ඒකට කාලයක් ඕනි. (ඝෝෂාව)

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභිපතිතුමනි, උපසභාපතිතුමා රීති මාලාව කියලා 19 - කියලා කිව්වා.මම ඇහුවේ සරලව කී දෙනෙකුට ගෙව්වද කියලා.සභාව දැනගන්න ඕනි කී දෙනෙකුට ගෙව්වද කියලා.මම ඊට පස්සේ ඇහුවා2025.12.31 ට සාපේක්ෂව දැන් නිලධාරීන් කී දෙනෙකුට ගෙවනවද කියලා.එහෙනම් සභාවට ඇවිත් වැඩක් නෑ. ලිවුම් ටිකක් හුවමාරු කර ගත්ත නම් වැඩේ ඉවරයි.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමා,අපි ඔබතුමා කියන රීතිය පිළිගන්නවා. එතකොට ඒ සම්බන්ධව ප්‍රශ්න 03ක් ඇහුවා. උප සභාපතිතුමා කියන්නේ ,පළවෙනි ප්‍රශ්නෙටයි දෙවෙනි ප්‍රශ්නෙටයි ඒක ප්‍රශ්නයක් නැහැ. තුන්වෙනි ප්‍රශ්නෙට ඒක ප්‍රශ්නයක් තියෙනවා කියලා.එතකොට මාර කතාවක්නෙ මේක.ප්‍රජාතන්ත්‍රවාදීව,බොහොම සහයෝගයෙන් සභාපතිතුමාගේ වම දකුණ,එක පවුලේ එක ගෙදර ළමයි වගේ අපි වැඩ කරන්නේ.ඒ ඔක්කෝම අස්සේ, නමුත් අපි අඩුපාඩුවක් තියෙනවා නම් ඒක කථා කරලා හදාගන්න ඕනේ.ඒක ප්‍රශ්නයක් නැහැ.එතකොට ගරු සභාපතිතුමා, මේ අදාළ ප්‍රශ්නය මේ ප්‍රශ්නය ඔබතුමාලට හිත් වේදනාවක්,ප්‍රශ්නයක් වෙනවා නම් අපි අහන්නේ නැතිව ඉන්නම්.නැත්නම් අපි මහජන නියෝජිතයෙක් විදිහට ජනතාව අපිව එවලා තියෙනවනේ.ජනතාව අපෙන් අහනවා. ඇහැලියගොඩින් දැම්මා,බටහිර කලටුවාවෙන් දැම්මා,මියනකොල තැන්නෙන් දැම්මා.පලීගලින් දැම්මා.මේ කවුරුවත් නැහැ.ඒ කට්ටිය කෝ.මේ කොහේ කට්ටියක්ද මේ දැකලත් නෑ.අරෙහෙ ට්‍රැක්ටර් යනවා උදේ පාන්දර.මම නැවැත්තුවා ට්‍රැක්යරේ.මම ඇහුවා කෝ මේකෙ ලයිට් .ලයිට් නැහැ. මම කිව්වා ඔබතුමා මේ සම්බන්ධව දැනුවත් කළා ද.ඔව් ලයිට් නැහැ .අපිට දුවන්න විදිහක් නැහැ. එතකොට මම ඇහුවා ඔබතුමා දන්නවද මම කවුද කියලා,නැහැ මම දන්නේ නැහැ කවුද කියලා, එහෙම කිව්වා.පාන්දර 04යි.සත්‍ය කතාවක් කියන්නේ.

**සභාපතිතුමා :-**
ඒ අය දැන ගන්න ඕනෙද මන්ත්‍රීවරු කවුද කියලා.එහෙනම් අපි ගෙන්වල හඳුන්වල දෙමු.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ඇයි අපිව දැනගන්න ඕනි නැද්ද.සභාවේ මාර්ග කම්කරුවෙක් හෝ අතුගාන මනුස්සයෙක් හෝ මන්ත්‍රීවරු දැන ගන්න ඕනේ නැද්ද. අන්න ඒක තමයි කියන්නේ ඔබතුමාල ප්‍රායෝගික නැහැ කියන්නේ ඒකයි. ඇයි හිනාවෙන්නේ. මහජන නියෝජිතයින් දැනගන්න ඕනි සේවකයින්ව. එහෙම හිනා වෙන්න එපා (ඝෝෂාව)

**සභාපතිතුමා :-**
අපි නිලධාරී මණ්ඩලය ගෙන්නමු .නැත්නම් පවුනේ (ඝෝෂාව)

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
පවු නෙවෙයි මේක අයිතිය. ඒක සභාපතිතුමාගේ වගකීමක්. අපි 2011 ඉඳන් සභාවෙ හිටපු මිනිස්සු. අපි දන්නව මිනිස්සු. අපි මේ වගේ ප්‍රශ්නයක් ඇහුවම හැංගිලා යන්නේ ඇයි. (ඝෝෂාව)

**සභාපතිතුමා :-**
හැංගෙන්නේ නැහැ. (ඝෝෂාව)

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
සභාවේ ඕනේ දෙයක් දැනගන්න අයිතිය තියෙනවා.ඒ අයිතිය තහවුරු කරලා නෑනේ. (ඝෝෂාව)

**සභාපතිතුමා :-**
ඒකනෙ මම කිව්වේ සභාවේ නිලධාරී මණ්ඩලය ගෙනල්ල හඳුන්වල දෙමු. 2025 අපි සභා ගත්තට පස්සේ කාර්ය මණ්ඩලයේ අඩුවීමක් තියෙන්නේ.සෞඛ්‍ය කම්කරුවන් 16 දෙනෙක් ඉන්නවා.රියදුරන් 03 දෙනෙක් ඉන්නවා. මුරකරුවන් 03ක් සිටිනවා.වසම් 44 න් ඉන්නවා.සමීර මධුෂාන් කියලා රියදුරු මහතෙක් ඉන්නවා ඔහු අයගම.දෙන්නයි ඉන්නේ පිටින් අරන්.අපි සභාව පත්වෙන්න කලින් ගත්තු එක්කෙනෙක් ඉන්නවා.තව ඉන්නවා ඕ.ඩී.සමරසිංහ කියලා එක්කෙනෙක. ඔහු පරකඩුව පත්බේරිය ගමේ.ඔහු තත්කාර්ය පදනම මත ගත්තු එක්කෙනෙක්.
ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.04යෝජනාවයටතේ,කොන්ත්‍රාත්/තත්කාර්ය රියදුරු,මුරකරු සෞඛ්‍ය කම්කරු සේවකයින්ගේ දීමනා ගෙවීමෙන් පසු සභා අනුමැතිය ලබා ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**

සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.05 යෝජනාව.

**06.05.ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව විසින් ගිවිසුම් අත්සන් කරනු ලබන කඩ කාමර සඳහා වු ගිවිසුම හා වාර්ෂික බදු සඳහා වු ගිවිසුම මහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා මම යෝජනා කරමි.**

**සභාපතිතුමා :-**
මේක අවුරුදු ගානක් පැවති ගිවිසුමක්.මේ ගිවිසුම තිබිලා තියෙනවා කාලයක ඉඳන්. මේක අපි සභාවේ සම්මත කරගන්නේ නැතුව තමයි ගිවිසුම තිබිල තියෙන්නේ. එම නිසා අපි හිතුවා ඒක සභාවේ අනුමැතියෙන් ඉදිරියට ගෙනිච්චොත් හොඳයි කියලා .මේ සභාවට ඉදිරිපත් කළේ මේ යෝජනාව තිබුණ ගිවිසුම ම සභාවේ අනුමැතියක් ගන්න තමයි අපි මේක සභා සම්මත කරගන්න හදන්නේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, ඒ කියන්නේ මෙච්චර කාලයක් තිබුණක් එකක් විධිමත්ව වෙලා නැහැ. ඒක තමයි අපි මේ කරන්නේ.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.05යෝජනාවයටතේ,ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව විසින් ගිවිසුම් අත්සන් කරනු ලබන කඩ කාමර සඳහා වු ගිවිසුම හා වාර්ෂික බදු සඳහා වු ගිවිසුම මහා සභා අනුමැතිය ලබා ගැනීම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.06 යෝජනාව

**06.06.ඇහැලියගොඩ සති පොළ අසල වී හැඩ කඩකාමර11 ක් සඳහා නියෝජ්‍යප්‍රධානතක්සේරුකරු(රා.ආ.) ගේඅංකRT/RP/1197 හා 2026.02.06 දින ලද තක්සේරු වාර්තාව අනුව 2026 අප්‍රේල් මස සිට මාසික බදු කුලීය අය කිරීම සඳහා මම යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
සභාවට අයත් කඩ 11ක් තියෙනවා.වී හැඩැති කඩ කියලා අපි කියෙන්නේ.පොළ පාරේ තියෙන්නේ.ගිවිසුම තියෙන්නේ අවුරුදු 03න් 03ට තමා පොඩි මුදලක් වැඩි කරන්නේ.මේ පාර අවුරුදු 3 ඉවර වෙනවා 2026 අප්‍රේල් මාසේ.

පක්ෂ විපක්ෂයක් නැහැ අපි හැමෝටම සතුටු වෙන්න දෙයක් තියෙනවා.ඇහැලියගොඩ නගරයේම තියෙන ඉඩමක් අපි සභාවට අහිමි වීමේ තර්ජනයක් තිබුණා.නමුත් ඒක මේ මාසයේ 4වෙනිදා සභාවට සම්පූර්ණ ම අයිති වුණා.අපි සියලුම දෙනාට බොහොම සතුටු විය හැකි දෙයක් ඒක.පරණ පොළ කියන ඉඩම.දැන් ඒක සම්පූර්ණයෙන්ම අපිට බලය තියෙනවා.දැන් ඒකෙ ලොකු සංවර්ධන ව්‍යාපෘති කරන්න පුළුවන්.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
අධිකරණයෙන් නියෝගයක් අරන් තිබුණා ප්‍රාදේශිය සභාවට,නාගරික සංවර්ධන අධිකාරියට ඇතුල්වීම තහනම් කියලා.ඒ නඩුවට තීන්දුවද දැන් අරන් තියෙන්නේ.

**සභාපතිතුමා :-**
ඔව් අද ඊයෙ දාපු එකක් නෙවෙයි. ඒකට ආපු නඩු තීන්දුවක්.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, අපි ඔබතුමාට ගෞරවනීය ප්‍රණාමය පුද කරනවා ඔබතුමාගේ කාලය තුළ මේක නිමා කරගන්න හැකි වීම පිළිබඳව. අපි තමා ඕකට මුලික වුණේ.අපේ මහේෂ් මන්ත්‍රීතුමාට මතකද දන්නේ නැහැ. එම නඩු කියපු පාර්ශවය.මම කියන්නේ අපි ලොකු අපහසුතාවයකට ලක් වුණා.අපිට එම භූමියට ඇතුල්වෙන්න ඉඩ දුන්නේ නැහැ.අපේ සැලසුම් ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැහැ2013දි.ඔබතුමා වන්දිත් ගත්තනම් ඒක සභාවටනෙ.ලොකු දෙයක් එහෙම වුණා නම්. දැන් සභාපතිතුමා සභාපති වෙලා ඒ සතුට භුක්ති විඳිනවනේ.සභාපතිතුමා වාසනාවන්තයි.තව අවුරුදු සීයක් ගියත් කවදහරි ඉතිහාසගත වෙනවා අපේ බන්දුලසේන දුණුවිල ගරු සභාපතිතුමා යටතේ මේ ඉඩම භාරගත්තා කියලා.ඒක සභාගත වෙනවා.හැබැයි 2011 ඉඳන් දාපු නඩුවක් තමයි මේ.හැබැයි ඒ පාර්ශවය මාර දුකක් දුන්නා.ඒ කාලේ මන්ත්‍රී කණ්ඩායම ඇතුළට ගිහාම ලොකු බලපෑමක් ආවා.ඔවුන්ට අයිතියක් තියෙනවා කියලා තමයි අදහස් ඉදිරිපත් කළේ. දැන් ඉතින් පසුකාලීනව ඔබතුමාලගේ කණ්ඩායමේ ඉඳලා, ඔබතුමාට උදව් කරලා, ගොඩනැගිලි දීලා ඔබතුමාලා ජයග්‍රහනය කළා ඒක තමයි ඇත්ත කතාව.බොරු නෙවෙයිනේ සභාපතිතුමා.ඒ නිසා ඒකෙ ගෞරවය ඔබතුමාට දෙනවා.හැබැයි අපි තමයි ඕකෙ කට්ට කෑවේ.

**සභාපතිතුමා :-**
ඇත්තටම අපි ඒක තමයි විවාදයක් නොකර ඉමු කියලා කිවුවේ. ඒක කියන්න ගියොත් තව ගොඩක් ඒවා තියෙනවා. අපි වෙන දවසක කතා කරමුකෝ ඒක ගත්ත විදිහ. ඒක අපි දන්නේ. ඔබතුමා කිවුව කතාව හරි .ඔබතුමා කියන විදිහට ඒක තමයි මේකෙ තියෙන වෙනස. අපිට ගොඩනැගිල්ල දීල අපිට ආධාර උපකාර

කරලා ,එහෙම කරපු කෙනාගෙන් තමයි අපි මේ නඩුවටත් ගිහිල්ලා... ඒක තමයි අපි මේක වාද විවාද කරන්න ගියොත් වෙන දවසක් ඕන්නම් ගමු. (ඝෝෂාව)

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ඇත්තටම ඒ ගැන මානසික තෘප්තියක් තියෙනවා. ඔබතුමාටත් තියෙනවානේ ඒක. අපි ඒක ගමු.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ඒ සම්බන්ධයෙන් වන්දියක් ඉල්ලීමේ හැකියාවක් නැද්ද?

**සභාපතිතුමා :-**
අපි බැරිම තැන මේකට අපේ මන්ත්‍රීතුමන්ලා දැම්මා.අමිල් මන්ත්‍රීතුමා තමයි සහභාගී වුණා.එතුමා පැහැදිලි කරයි

**ඩබ්.එම්. අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම ඒ නඩුවට ගිය නිසා තමයි පොඩ්ඩක් දන්නේ. මෙතන කතා වුණා වගේ ඉස්සර ඉඳලම ලිපි ලේඛන තිබුණේ නැහැ. ඒ ලොට් අංක කිසිම දෙයක් තිබුණේ නැහැ.අලුතින් හොයාගත්තු ගොනුවකට තමයි ඉදිරියට හදාගෙන ගියේ.සෑහෙන්න පරිශ්‍රමයක් දරලා තමයි මෑත කාලයේදී ගරු සභාපතිතුමා මැදිහත් වෙලා ලොට් අංක අලුතින් හොයාගෙන,මිනින්දෝරු මහත්වරු අලුතින් හොයාගෙන ,ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන් මෙයට සෑහෙන්න වෙහෙසක් දැරුවා. දෙහිඕවිට ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරීන් වෙහෙසක් දැරුවා.එහෙම රජයේ නීතිඥයින් හරහා තමයි නඩුව නිශ්ප්‍රභා කරගත්තේ. ඉතින් මෑත කාලයේ කරපු ලොකු පරිශ්‍රමයක ප්‍රතිඵලයක් තමයි.

**සභාපතිතුමා :-**
මේ කාලයේ ඉන්න මන්ත්‍රීතුමන්ලා 36 දෙනාට ම ප්‍රණාමය මම මේ අවස්ථාවේදි පුද කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.06යෝජනාවයටතේ,ඇහැලියගොඩ සති පොළ අසල වී හැඩ කඩකාමර11 ක් සඳහා නියෝජ්‍යප්‍රධානතක්සේරුකරු(රා.ආ.) ගේඅංකRT/RP/1197 හා 2026.02.06 දින ලද තක්සේරු වාර්තාව අනුව 2026 අප්‍රේල් මස සිට මාසික බදු කුලීය අය කිරීම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.07 යෝජනාව

**06.07.ප්‍රාදේශිය සභාව අරමුදලින් රු.1,943,000.00 ක මුදලක් වැය කර ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා බිම් මහලේ වැසිකිලි පද්ධතිය සහ ගේට්ටුව අලුත්වැඩියා කිරීම සඳහා මම යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපි ආවට පස්සේ මුලින්ම මේ යෝජනාව දැම්මා. අපි දැම්මට පස්සේ අපි බලාපොරොත්තු වුණා මේක පළාත් සභාවෙන් හරි,මධ්‍යම රජයේ ප්‍රතිපාදන වලින් හරි මේක ලැබෙයි කියලා. පසුගිය අවුරුද්දම අවසන් වෙනකන් අපි උත්සාහ කළා.උපරිම ප්‍රතිපාදන ගන්න. නමුත් ප්‍රතිපාදන ලැබුනේ නැහැ. ඇත්තට ම අපි මේක අනිවාර්යයෙන්ම කළ යුතු දෙයක්.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ජල කාන්දුව සම්බන්ධයෙන්

**සභාපතිතුමා :-**
ඇත්තටම ජල කාන්දුව හොයාගන්න බැරි වුණා. අපි ඒකටත් එක්ක තමයි මේ යෝජනාව දැම්මේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.07යෝජනාවයටතේ,ප්‍රාදේශිය සභාව අරමුදලින් රු.1,943,000.00 ක මුදලක් වැය කර ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා බිම් මහලේ වැසිකිලි පද්ධතිය සහ ගේට්ටුව අලුත්වැඩියා කිරීම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.08 යෝජනාව

**06.08.ප්‍රාදේශිය සභාව අරමුදලින් රු.1,191,000.00 ක මුදලක් වැය කර ඇහැලියගොඩ සතිපොළ ඉදිරිපිට එළු මස් හරක් මස් වෙළෙඳසැළ අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කිරීම සඳහා මම යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා

**සභාපතිතුමා :-**
මස් කඩය බොහොම අබලන්.ඒ නිසා තමයි ඒක හදන්න යෝජනා කළේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.08යෝජනාවයටතේ,ප්‍රාදේශිය සභාව අරමුදලින් රු.1,191,000.00 ක මුදලක් වැය කර ඇහැලියගොඩ සතිපොළ ඉදිරිපිට එළු මස් හරක් මස් වෙළෙඳසැළ අත්‍යාවශ්‍ය අලුත්වැඩියා කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.09 යෝජනාව.

**06.09. ප්‍රාදේශිය සභාව අරමුදලින් රු.169,280.00 ක මුදලක් වැය කර විලේගොඩ ආදාහනාගාරයේ බර්නර් එක අලුත්වැඩියා කිරීම සඳහා මම යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, ඇත්තටම ඒක කාලෝචිතයි.සභා වාර කීපයකදීම දීර්ඝ වශයෙන් සාකච්ඡා වුණා. ඒකට මූලිකත්වය ලබාදීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.09යෝජනාවයටතේ,ප්‍රාදේශිය සභාව අරමුදලින් රු.169,280.00 ක මුදලක් වැය කර විලේගොඩ ආදාහනාගාරයේ බර්නර් එක අලුත්වැඩියා කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.10 යෝජනාව.

**06.10.ප්‍රාදේශිය සභාව අරමුදලින් රු.1,966,000.00 ක මුදලක් වැය කර ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ පළමු මහලේ වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා මම යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මේකටත් අපි අර විදිහටම ඇස්තමේන්තුවක් ගත්තා. සංචාරක අමාත්‍යංශයෙන් කැඳවල තිබුණත් අපිට එක හම්බුනේ නැහැ.ක්ලීන් ශ්‍රී ලංකා වැඩසටහන යටතේ මෙම වැසිකිළි පද්ධති දෙකම හදනව කියල, ඒ අය ලබන සතියේ නිරීක්ෂණ චාරිකාවක් එනව කියල තියෙන්නේ. එතකොට අපි න්‍යාය පත්‍රයට දාල ඉවරයි.බොහෝ දුරට මේ මුදල් නැතුව අපිට ඒකෙන් කරගන්න පුළුවන් වේවි. ඇහැලියගොඩ පොළේ වැසිකිලි පද්ධතියයි.ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ පළමු මහලේ වැසිකිලි පද්ධති දෙකයි.එකෙන් එකක් හරි කරලා දෙන්න නම් කිව්වා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ලක්ෂ 40කට කිට්ටු වෙන්න මෙතන වෙන් කරලා තියෙනවා.පළවෙනි සභා වාරයේදී න්‍යාය පත්‍රයට ඇතුලත් කරලා තිබුණා වැසිකිළි පද්ධතිය සඳහා ලක්ෂ 54 කට සභාවේ අනුමැතිය දුන්නා.ඒ ලක්ෂ 54 ඇස්තමේන්තුවට මේ දුන්න යෝජනා දෙක තිබුනේ නැද්ද.ඒ යෝජනාවයි මේ යෝජනාවයි අතරේ ඇස්තමේන්තුවේ මොකක් හරි අඩු වීමක් තියෙනවද? වෙනස්වීමක් තියෙනවද? ඇයි ආයේ දැම්මේ කියලා පැහැදිලි කිරීමක් කර ගන්න පුළුවන්ද?

**සභාපතිතුමා :-**
ඇත්තටම ගරු මන්ත්‍රීතුමා සංචාරක අමාත්‍යංශයෙන් කැඳෙවුවා අපිට මේක හදන්න කියලා. ඒ වෙලාවේ තමයි මිල ගණන් කැඳවලා තියෙන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ඒ කියන්නේ ගරු සභාපතිතුමා .අපි සභාවේ අනුමැතිය දැනටම හම්බවෙලා තියෙන්නේ ලක්ෂ 54ට සභා ඇමුදලින් හරි කොහෙන් හරි.සභාවේ ඒකමතිකව යෝජනා ස්ථිරත්වය දුන්නා.මේ ඇස්තමේන්තුව බලන කොට ලොකු වෙනසක් නැහැ.ආයෙත් ඇයි මේ යෝජනාව දාන්නේ කියලා මටනම් තේරෙන්නේ නැහැ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ඒ යෝජනාව මාස 06ක් පරණ නම් අලුතින් යෝජනාවක් දාන්න පුළුවන්.

**සභාපතිතුමා :-**
අපි බැලුවේ මේක සභා අරමුදලින් නැතුව කරන්න.නමුත් අපිට ඒක කරන්න බැරි වුණා.එකක් තමා අපි ලක්ෂ 20 න් එහා ඇස්තමේන්තු හැදුවොත් 18% ක් වැට් යනවා.අනිත් එක තමයි ටෙන්ඩර් ක්‍රමවේදයකට යන්න වෙනවා එහෙම වුණාම.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
දැන් පැහැදිලියි.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.10යෝජනාවයටතේ,ප්‍රාදේශිය සභාව අරමුදලින් රු.1,966,000.00 ක මුදලක් වැය කර

ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ලේ පළමු මහලේ වැසිකිලි පද්ධතිය අලුත්වැඩියා කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.11 යෝජනාව.

**06.11.දිවුරුම්පිටිය ජල යෝජනා ක්‍රමය ගැටහැත්ත ජල යෝජනා ක්‍රමය සමඟ සම්බන්ධ කිරීමට ඇස්තමේන්තු සහා අනුමැතිය සඳහා මම යෝජනා කරමි.(මුදල රු.1,673,130.20 සහා අරමුදල්)**

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සති දෙකක් පායන කොට ගැටහැත්ත ප්‍රදේශයේ ජලය නැති වෙනවා. එම නිසා දිවුරුම්පිටියේ ජල ධාරිතාවය පිළිබඳව ඇස්තමේන්තුවක් ගත්තා නම් හොඳයි.පායන කාලයට ගැටහැත්තේ කොපමණ ජල ප්‍රමාණයක් භාවිතා කරනවදෙ,දිවුරුම්පිටියේ කොපමණ ජල ප්‍රමාණයක් භාවිතා කරනවද කියලා දැන ගන්න පුළුවන් නම් හොඳයි.එම ජල ටැංකියේ විශාල ජල ප්‍රමාණයක් තිබෙන බව නම් පෙන්වනවා.එම නිසා මෙය ඉතා ඉක්මනින් කළ යුතු අත්‍යවශ්‍ය කාර්යයක් බව ප්‍රකාශ කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ගිය සැරෙත් යෝජනා කළා මෙය තාක්ෂණික ඇගයීමකට භාජනය කරලා විධිමත් ක්‍රියාවලියකට ගියා නම් හොඳයි.

**සභාපතිතුමා :-**
ඇත්තටම අපි ඒ ගැන කථා කළා. කාර්මික නිලධාරී මහත්වරුන්සහ අදාළ විෂය නිලධාරින් සමඟ ගිහින් තමයිකිවුවේ.දැනටත් මේක වැඩි පරිභෝජනයකට දෙන්න පුළුවන්. ඒක හින්දා මේ අත්‍යවශ්‍ය වෙලාවේ ඇත්තටම මීන්නාන ප්‍රදේශයේ ලොකු ජල හිඟයක් තියෙනවා.මේකට යාබදව තව ප්‍රදේශ කිහිපයකටම දෙන්න පුළුවන් කියලා.අතිරික්ත ජල ධාරිතාවය තමයි අපි මොවුන්ට ලබාදෙන්න යෝජනා කරන්නේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ගියපාරත් මේ සම්බන්ධව කතා කරනකොට යම් අදහසක් ඉදිරිපත් කළා. මට මතකයි ජී.එම්.කරුණාපාල අමාත්‍යතුමාගේ කාලයේ තමයි එම කටයුත්තට මුල් ගල තියලා ආරම්භ කරන්නේ.එම ජල ටැංකිය තිබෙන භූමිය අපිට පවරගන්න බැරිවෙලා තියෙනවා.ඒක අපෙන් වුණ අඩුපාඩුවක්නේ.අපි ඒක පිළිගන්නවා.අපි ඒ අඩුපාඩුව හදාගමු.මට මතකයි මාස තුනකට විතර කලින් කිවුවා එම පවරා ගැනීම් කටයුතු අපි කළ යුතු කියලා මම කිවුවා. අපේ විෂය දන්න අමිල මන්ත්‍රීතුමා ඉන්නවා. කවුරු ආවත් ප්‍රශ්නයක් මතු වෙනවානේ. ඒ නිසා එම පවරාගැනීම් කටයුතු මන්ත්‍රීතුමාට භාරදුන්න නම් හොඳයි.ඒ සඳහා කටයුතු කරමු.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඇහැලියගොඩටත් ජල ගැටළුව තව සති දෙක තුනක් යනකොට බරපතල විදිහට බලපානවා.මම හිතනවා තව දවසක් දෙකක් යන කොට බවුසර් භාවිතා කරන්න වෙයි.ඒකටත් සූදානම් වෙන්න වෙයි කියලා මම යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,සුජීව මන්ත්‍රීතුමා කිවුවා වගේ අපි දන්නේ නැහැ ගැටහැත්තෙයි දිවුරුම්පිටියෙයි ජල තත්වයන් කොහොමද කියලා.සමහර විට දෙක එකතු වුණා මගැටහැත්තේ වතුර හොඳ වෙන්න පුළුවන් දිවුරුම්පිටියට වඩා.දිවුරුම්පිටියේ වතුර හොඳ වෙන්න පුළුවන් ගැටහැත්තට වඩා.මේ දෙක එකතු වීම කොපමණ තාක්ෂණික මට්ටමින් යහපත්ද කියන්න දන්නේ නෑ.තාක්ෂණික වාර්තාවක් කැඳවලා ඉන්න.
අනෙක් කරුණ මේවන විට ලක්ෂ 20ක් මෝරගල වසමට පාස් වෙලා තියෙනවා.වැකඩ ප්‍රදේශයට වතුර නැහැ.අපේ කාලයේත් අපි උපරිම උත්සාහ කළා.නමුත් වැකඩ කොටසට වතුර දෙන්න බැරි වුණා.උපසභාපතිතුමා තමයි මම හිතන්නේ කොට්ඨාශයේ මන්ත්‍රීවරයා විදිහට වැඩ කරන්නේ.ඒ ලක්ෂ 20 ට තාම මොකද වුණේ දන්නේ නැහැ.ඒ ලක්ෂ 20න් කරන්න හදන්නේ දැනටමත් ඒ කන්දෙන් එහා පැත්තේ ළිඳකින් වතුර ගන්න පිරිසක් ඉන්නවා.මෙතුමන්ලා ගිහිල්ලා කියලා තියෙනවා මේ වතුර ප්‍රමාණවත් අපි බලෙන් හරි එහා පැත්තට වතුර ගහනවා කියලා.සභාපතිතුමනි ඒකට පොඩ්ඩක් මැදිහත් වෙන්න.දැනටමත් ඒ වතුර ගන්න අයට ප්‍රශ්නයක් නොවෙන විදිහට ඒ ලක්ෂ 20 ප්‍රයෝජනයට අරගෙන ඒ ජනතාවට වතුර දෙන්න ක්‍රමවේදයක් හදන්නතවත් මුලාශ්‍රයක් හොයා ගන්න ඕන් නම් පුළුවන්.ඒ ගැනත් අවධානය යොමු කරනවා ඔබතුමාට.

**සභාපතිතුමා :-**
දිවුරුම්පිටියේ එම ජල ටැංකිය මිදුලක් ඉස්සරහා තමයි තියෙන්නේ. ඒ නිසා අපේ අමිල් මන්ත්‍රීතුමා සහ රණවීර මන්ත්‍රීතුමා ඊළඟ සභාවේදී අපිට ඒක පවරාගන්න පුළුවන්ද කියලා කුමක් හෝ තොරතුරක් ලබාදෙන්න.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ජල ගැටළුව ගැන කතා කරනකොට මේක කිව යුතුමයි. බිසෝදොල ඇල්ලේ නාන්න ජලය ගන්නවා. විලේගොඩ වසමේ ගොඩක් අය තමයි ගොඩක් මේ ඇළ භාවිතා කරන්නේ.එම ඇල්ලට උඩ වත්තේ රබර් කිරි එවනවා.ලොකු ගැටළුවක් වෙලා තියෙනවා. FB (සමාජ මාධ්‍ය) වලත් ඒ පිළිබඳව පළ කර තිබුණා.සභාපතිතුමනි අපි මන්ත්‍රී කණ්ඩායම ගිහින් හරි කමක් නැහැ අපි මැදිහත් වෙලා.ඉක්මනට ඒක නැවැත්තුවේ නැත්නම් ලොකු ගැටළුවක් වෙනවා.සමහරු උයන්න පවා වතුර ගන්නේ එම බිසෝදොල ඇල්ලෙන් උදේට ගිහින් බැලුවොත් තනිකර කිරි පාටයි ඇළ. ඒ නිසා ඒ පිළිබඳව යම් මැදිහත් වීමක් සිදු කරන

ලෙස ඉල්ලා සිටිනවා.අද හවසට සභාවේ කට්ටිය ගිහිල්ලා හරි දැනුවත් කළා නම් හොඳයි.ඔවුන් ජල සම්පාදන මණ්ඩලයේ වතුර ගන්න ස්ථානයට පහළින් තමයි මේ ක්‍රියාවලිය සිදුකරන්නේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එය දීර්ඝ කාලීනව මතුවෙලා තියෙන ගැටළුවක්.මම ඒ සඳහා සංවිධානයක් නිර්මාණයක් කරලා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයත් සමඟ එක් වෙලා නඩු මගට යාමට මීට වසර 15කට විතර කලින් කටයුතු කළ අවස්ථාවේ, නැවත එම කිරි ජලය ඇල මාර්ගයට යොමු නොකරන්න වතු අධිකාරිය සමඟ සාකච්ඡා කරලා ඔවුන් එකඟ වුණා. ඒ අනුව අවුරුදු ගාණක් නැතුව තිබුණ එම ගැටළුව නැවතත් සක්‍රීය වෙලා තියෙනවා.එම මන්ත්‍රීතුමා මතු කළ ගැටළුව ඉතාමත් වැදගත්.එතනින් පහළ ස්නානය සඳහා භාවිතා කරනවා. තව සතියක් දෙකක් වුණොත් එහෙම ඇළට බහින්න බැරි තත්වයක් එනවා.ලොකු දුඟඳකුත් එක්ක.මීට කලිනුත් එම ගැටළුව මතු වුණා.සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ වාර්තාවල ඇති.සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය එක්ක ඒකට මැදිහත් වෙලා අපි පරිසර සංවිධානයක් මාර්ගයෙන් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට යොමු වුණා.ඔවුන්ට පිරිපහදු කරන ටැංකි සඳහා වතු අධිකාරියට විශාල වියදමක් දැරීමට සිදුවන නිසා එයට උපක්‍රමයක් ලෙස එම ජලය බිසෝදොල ජල මාර්ගයට යොමු කරන්නේ එම නිසා එම මැදිහත් වීමේදී එම වත්තේ තියෙන පිරිපහදු ක්‍රමවේදය පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරන්න.

**සභාපතිතුමා :-**
බොහොම ස්තුතියි. අපි මේ පිළිබඳව කතා කිරීමට කාරක සභාවක් බවට පත් කරමු. ඔබතුමා කිවුවා වගේ එම කිරි වෙනම පිරිපහදු කරලා තමයි පිටතට යොමුකල යුත්තේ.නමුත් ඒ සඳහා වෙනම මුදලක් වැය වන නිසා ඔවුන් කවුරුන් හෝ නිලධාරී කණ්ඩායමක් නිරීක්ෂණය කිරීමට යාමේදී එම ප්ලාන්ට් එක ඔන් කරනවා.එවිට පේන්නේ නැහැ.වැසි කාලයටත් දානවා නමුත් වතුර වැඩි නිසා පේන්නේ නැහැ.අපි අද උදෙත් යන්න හැදුවා. නමුත් අද සභාව නිසා අපි හෙට ගිහින් බලමු.අපිට වඩා පරිසර අධිකාරියට තමයි මේක සොයා බැලිය යුත්තේ.මේ වැරැද්ද නිසා ලොකු පරිසර විනාශයක් වෙනවා.මෙකෙන් වැරැද්ද එයාලට භාර වුණොත් කර්මත ශාලාව වහන්න පවා සිද්ධ වෙනවා.මේ සම්බන්ධයෙන් කතා කිරීමට කාර්මික නිලධාරී මහතා පැමිණ සිටිනවා ඒ නිසා මහ සභාව කාරක සභාවක් බවට පත්කර තොරතුරු දැන ගනිමු.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මහ සභාව කාරක සභාවක් බවට පත්කිරීමට මම යෝජනා කරනවා.

**සභික ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

මෙතැන් සිට මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කාරක සභාව මහ සභාවක් බවට පත්කිරීමට මම යෝජනා කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,කාරක සභාවේදී දිවුරුම්පිටියේ ජල ගැටළුව සම්බන්ධයෙන් වූ යෝජනාව තමයි ජලය කොපමණ තිබේද යන්න පිළිබඳව කාර්මික නිලධාරී වාර්තාවක් ලබාගෙන ඉදිරි කටයුතු සිදුකිරීමටත් ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබාදීමටත් යෝජනා විය.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.11 යෝජනාවයටතේ, දිවුරුම්පිටිය ජල යෝජනා ක්‍රමය, ගැටහැත්ත ජල යෝජනා ක්‍රමය සමඟ සම්බන්ධ කිරීමට ඇස්තමේන්තුව සහා අනුමැතිය සඳහා ඉදිරිපත් වූ යෝජනාවසඳහා ජලය තිබේ ද යන්න පරීක්ෂා කිරීමට කාර්මික නිලධාරී වාර්තාවක් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.(මුදල රු.1673130.20 සහා අරමුදල්)

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.12යෝජනාව.

**06.12. යාන්ත්‍රිකපතල් කරණය ( බැකෝ පතල් ) මත දැඩි ලෙස අර්බුදයට ලක්ව ඇති ගැටහැත්ත පානීය ජල යෝජනා ක්‍රමයේ ගැටලු විසඳීමට දියුරුම්පිටිය පානීය ජල යෝජනා ක්‍රමයේ නළ පද්ධතිය ඒ හා සම්බන්ධ කරලීමේ දී කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයේ උරහිස පළුදු කිරීමේ ගාස්තුව ලෙස රු.15,91,899.29 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවීමට සුදුසු බවට යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
අපි මේක කලින් කතා කරපු යෝජනාවක්.මේ පිළිබඳව ලොකු විශ්වාසයක් තියෙනවා ඇමතිතුමාගේ හෝ අධ්‍යක්ෂ ජනරාල්තුමා මාර්ගයෙන් මෙම මුදල ලබා නොදී වැඩේ සිදුකර ගැනීමට.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.12යෝජනාවයටතේ,යාන්ත්‍රික පතල් කරණය ( බැකෝ පතල් ) මත දැඩි ලෙස අර්බුදයට ලක්ව ඇති ගැටහැත්ත පානීය ජල යෝජනා ක්‍රමයේ ගැටලු විසඳීමට දියුරුම්පිටිය පානීය ජල යෝජනා ක්‍රමයේ නළ පද්ධතිය ඒ හා සම්බන්ධ කරලීමේ දී කොළඹ රත්නපුර ප්‍රධාන මාර්ගයේ උරහිස පළුදු කිරීමේ

ගාස්තුව ලෙස රු.15,91,899.29 ක මුදලක් මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.13 යෝජනාව.

**06.13. ගැටහැත්ත අනුර විදුහල අසල ජල ටැංකිය අලුත් වැඩියා කිරීම සඳහා රු.363,400.00 වටිනා ඇස්තමේන්තුව සහා අරමුදලින් ඉටු කිරීම සඳහා සහා අනුමැතිය සඳහා මම යෝජනා කරමි.**

**ඩබ්.එම්. අමිල් නිමේෂබණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
දැනට එම කොන්ක්‍රීට් එක කැඩිලා තියෙනවා.එය අලුත්වැඩියා කිරීම සඳහා තමයි මෙම ඇස්තමේන්තුව.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.13 යෝජනාවයටතේ, ගැටහැත්ත අනුර විදුහල අසල ජල ටැංකිය අලුත් වැඩියා කිරීම සඳහා රු.363,400.00 වටිනා ඇස්තමේන්තුව සහා අරමුදලින් ඉටු කිරීම සඳහා සහා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.14 යෝජනාව.

**06.14. ඇහැලියගොඩ පොළ භූමියකොන්ක්‍රිට් නොකළ කොටස් සඳහා අන්තර්බද්ධිත කොන්ක්‍රිට් ගල් ඇල්ලීම සඳහා රු.11,100,000.00 වටිනා ඇස්තමේන්තුව සභා අරමුදලින් ඉටු කිරීම සඳහා සහා අනුමැතිය සඳහා මම යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
විශාල පොළ භූමියක් තියෙනවා අපිට.එකෙ විශාල භූමි ප්‍රමාණයක් කොන්ක්‍රීට් කරලා නැහැ.අපේ බලාපොරොත්තුවක් තියෙනවා නගරයේ තියෙන පදික වෙළඳුන් ප්‍රමාණය සහ බස් රථ ඇහැලියගොඩ පොළට ගාල් කරන්න ඔවුන් මැසිවිලි නගනවා ඇහැලියගොඩ පොළට සෙනග එන්නේ නැහැ කියලා.ඒ නිසා පාරේ දෙපැත්තේ තියෙන බස් පොළට දාල නැවතුම්පලක් හදන්න තමයි කටයුතු කරන්නේ.නමුත් එම මාර්ගයේ සිටින පදික වෙළඳුන්ට අපිට එකපාරට මෙතෙන්ට තල්ලු කරන්න බැහැ.නමුත් අපි මේක හදලා ලස්සන කරලා දුන්නොත් ඔවුන්ට තැනක් තියෙන නිසා සාර්ථක කර ගන්න පුළුවන් වෙයි.ලොකු මුදලක් මෙක.වැට් එකක් තමයි ලොකු මුදලක් යන්නේ.වැට් අඩු වුණොත්ලොකු මුදලක් අපිට අඩු වෙනවා. ලක්ෂ 86කින් විතර කරන්න පුළුවන්.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ සභාවට තියෙන ලොකුම ඉඩම මේක. ලොකු සංවර්ධන කටයුත්තකට යොදාගන්න පුළුවන්.බස් රථ නැවතුම්පල සහ දුම්රිය ස්ථානය අපිට නගර සංවර්ධනයේදී ලැබෙනවා.මේ යෝජනාව දැම්මට පස්සේ,ඇස්තමේන්තුව හැදුවට පස්සේ තමයි ප්‍රතිපාදන ටික ආවේ.ප්‍රජා ශක්ති වලින් මිලියන 29ක් .එම මිලියන 29 ට අපි යෝජනා කරලා තියෙනවා, හරිත ආශ්‍රිත කලාපයක්, මම අහලා බැලුවා කාර්මික නිලධාරී මහතාගෙන් එක්කෝටි ගාණක් යන්නේ ඇයි කියලා.ලක්ෂ අසූ ගාණක් තමයි යන්නේ.වැට්වලට තමා ලොකු ගාණක් යන්නේ.ටෙන්ඩර් කරද්දී කෙනෙක් ඉදිරිපත් වුණොත් ඒකයි.පරිපාලන වියදම් එක්ක තමයි මෙම මුදල වැය වන්නේ.අපි බලමු ප්‍රජා ශක්ති ප්‍රතිපාදන කොහොම හරි ගන්න.මෙය අත්‍යවශයෙන් ම කළ යුතු නිසා තමයි මෙය සභාවට ඉදිරිපත් කළේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි සභා අරමුදලින් මේ වගේ දෙයක් වැය කරනවා කියන්නේ ජාතික අපරාධයක් ඔබතුමාට මතක ඇති මම මුලින්ම මුදල් කමිටුවේදී මම යෝජනා කළා බේරුවාන යාඩ් එකේ අත්‍යවශය කටයුතු සඳහා විශාල මුදලක් ගෙවනවා.එ නිසා අපි බැකෝ යන්ත්‍රයක් ගමු කියලා.නමුත් අපිට ඒක තවම කර ගන්න බැරි වුණා.නමුත් අපි මේක වෙනත් මූලාශ්‍රයකින් භාවිතා කරන්න උත්සාහ දරමු. හොඳයි මේක කළ යුතු වැඩක්. අපි අගය කරනවා. අපි සහයෝගය දෙනවා. නමුත් සභා අරමුදලට වැඩිය වෙනත් මූලාශ්‍රයක් භාවිතා කරමු.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම ව්‍යාපෘතියේ අදහස හොඳයි. නමුත් සභා අරමුදලින් සිදුකළ යුතු ව්‍යාපෘතියක්.මෙය අත්‍යවශය කටයුත්තක් සේ සලකා මෙයට ප්‍රමුඛතාවය ලබා දෙන්න.කොන්ක්‍රීට් ගල් ගන්නකොට හැකිනම් ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාවගෙන් ගන්න.ප්‍රමිතියෙන් යුතු ගල් ලබාගන්න .

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,සුජීව මන්ත්‍රීතුමා පැවසූ පරිදි කෝටියකට වැඩි ප්‍රමාණයක් සභා අරමුදල් වැය කරනවාට වඩා,මොනයම් හෝ අමාත්‍යංශයකින් ලබාගෙන.මම හිතන්නේ ඇහැලියගොඩ නගරයේ කසළ ගැටළුව තවමත් තියෙනවා.එම නිසා ට්‍රැක්ටර් රථ ගමන් කල නොහැකි මාර්ග තියෙනවා තවමත්.සමහර පාරවල් තියෙනවා ට්‍රැක්ටර් යන්න බැරි.එම මිනිසුන් පැමිණිලි කරනවා අපි වරිපනම් බදු මුදල් ගෙවනවා නමුත් කසළ රැගෙන යාමට පැමිණෙන්නේ නැහැ කියලා.මම හිතන්නේ ඒ මුදල් වලින් ට්‍රැක්ටර් රථ ගමන් කළ නොහැකි පාරවල්වල ඒ ස්ථානවලට ගමන් කළ හැකි පොඩි වාහනයක් ගත හැකි නම් හොඳයි.මේ අදහස ඉතාමත් මවටිනවා,

කාලෝචිතයි.නමුත් මේ මුදල වියදම් නොකර කොහෙන් හෝ ලබාගෙන,ඒ මුදල් සභාවේ කටයුතු සඳහා යොදවනවානම් හොඳයි කියන එක තමයි මගේ අදහස.

**සභාපතිතුමා :-**
ඇත්තට ම අපිට ප්‍රජා ශක්තිවලින් මුදල් ලැබුණා.අපි එම මුදල වසම් වලට කොටස් වශයෙන් බෙදලා අපි මිලියන 29ක් ඉතිරි කර ගත්තා.ඒකත් කරලා ඉතුරුත් වෙනවා.ඒ නිසා අපි බැලුවේ ඒකත් වසම් වලට බෙදලා දෙන්නේ නැතුව පොළ භූමියේ හරිත නගරයක් විදිහට පොඩි කඩ පේළියකුත් ස්ථාපිත කරලා,ඒ මුදල ඒකට තමයි වියදම් කරන්න හිතුවේ.ඉතින් අපිට මේ මුදල ඉතිරි කරගත්තොත් වෙන කාර්යයක් සඳහා යොදවන්න පුළුවන්.මන්ත්‍රීවරු සියලු දෙ නාම එයට එකඟ වුණා.එම කාර්යය අපිට සිදුකරගන්න පුළුවන් වෙයි කියලා මම හිතනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, නගර 10 වැඩේට පොළ අයිති වෙන් නැද්ද?

**සභාපතිතුමා:-**
නගර දහයේ වැඩේට පොළ අයිති නැහැ.ප්‍රජා ශක්තිවලින් රත්නපුර දිස්ත්‍රික්කයට ආවා මිලියන 1036ක් ඒක පළාත් පාලන ආයතනවලට බෙදුවහම, අපිට ආවා 70.9ක්. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ඒකෙන් අපිට ඇහැලියගොඩට ලැබෙනවා මිලියන 79ක්. ඒක අපි වසම් 44 ට මිලියනය ගාණේ බෙදුවා.ඒ කියන්නේ වසම් මන්ත්‍රීවරයට ලක්ෂ 10 ගාණේ බෙදුවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒකට පොඩි ඌන පූරණයක් කරන්නම්. දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හරහා ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට තමා ලැබුණේ.ඒකෙන් ඇහැලියගොඩට ලැබුණා මිලියන 79ක්. ඇහැලියගොඩ ප්‍රාදේශිය ලේකම් කාර්යාලයට තමයි ඒක ලැබුණේ. එයින් අපි වසම් 44ටම මිලියනය බෙදුවා.ඉතුරු ටික තමයි නගර සංවර්ධනය සඳහා පොළ භූමිය සඳහා යොදවලා තියෙන්නේ.
අපිට මේක ගිය වසරේත් වුණා.පහළ තියෙන වැසිකිලි පද්ධතියට අපි අමාත්‍යාංශ කිහිපයකින්ම බලාපොරොත්තු වුණා.නමුත් ලැබුණේ නැහැ.මේකට ඇත්තට ම මුදල් පාස් වෙලා තියෙනවා.සභාවෙන් හරි කරන්න අනුමත කර ගත්තොත් අඩුම ගාණේ මේක සභාවෙන් හරි කරන්න පුළුවන්.නගරයේ තියෙන ප්‍රධානම තැන.නගරයේ හැම තැනම අක්‍රමවත් සංචාරක වෙළෙන්දන් ඉන්නවා, පදික වෙළෙන්දන් ඉන්නවා. ඒ අය සියල්ලම එතෙන්ට ගෙනල්ලා.නගරය ක්‍රමවත් කරලා.තාවකාලික බස් නැවතුම්පල මෙතෙන්ට ගෙනල්ලා.හරිත ආර්ථික කලාපයක් විදිහට දියුණු කරන්න ඕනි.අපේ ආදායම් එන්නේ නැති, වත්කම් ආදායම් ඇතිවෙන වත්කම් බවට පත් කරන්න ඕනි.ඒකට තමයි මේ යෝජනාව.ආදායම් උත්පාදන ව්‍යාපෘතවලටත් අපි මේක දැම්මා.මේ වියදම වැඩියි තමයි.ඒක අපිට දරාගන්න පුළුවන්.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි දැන් ඒක විමසුවේ, අපිට මේ තොරතුරු ටික සභාව හරහානේ එන්නේ.නැත්නම් අපි දන්නෙත් නැහැ.කොට්ඨාශය ජයග්‍රහණය කරපු මන්ත්‍රීවරයා විදිහටවත් දන්නේ නැහැ ඒක තමයි අපි මේ ඉල්ලීම කළේ.ඔය වගේ තොරතුරු අපි අපේක්ෂා කරනවා.සමාවෙන්න කල්දී ඇති ප්‍රශ්න යටතේ දාපු නැති එකට

**සභාපතිතුමා:-**
නැහැ ඒවා මෙතෙන්ට ආපු ප්‍රශ්නනේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීමේ උත්සවේදී කතා වුණා සියලු ම බස්රථ පොළට ගෙනියනවා කියලා.රත්නපුර බස් පටන් ගන්නේ මැණික් සංස්ථාව ළඟින්.එතකොට ඒ බස් රථ එතනින් පටන් ගන්නවද නැත්නම් තැන් දෙකකින් පටන් ගන්නවද කියලා දැනගන්න කැමතියි.
දෙවෙනි එක තමයි එදිනම කතා වුණා මාර්ගය දෙපස තියෙන පදික වේදිකාවේ පදික වෙළඳුන් සියලුම දෙනා එක ස්ථානයකට ගෙනියනවා කිව්වා. එවිට එම සියලුම දෙනාම එතෙන්ට ගෙනියනවද කියලා පොඩ්ඩක් පැහැදිලිව දැනගන්න කැමතියි.

**සභාපතිතුමා:-**
ඒ ගැන අපි වෙළඳ සංගමය පිළිබඳව සාකච්ඡා කළා.නගර සැලැස්මේ තියෙන්නේ,රත්නපුර-ඇහැලියගොඩ හා ඇහැලියගොඩ- අවිස්සාවේල්ලට යන බස් සියල්ල නතර කරන්න දැනට තියෙන ඇහැලියගොඩ පොළ භූමියේ.පසුවනේ අපිට අනෙක් පොළ භූමියේ අයිතිය හම්බ වුණේ.රත්නපුරේ යන බස් එකත් මෙතනින් පටන් ගන්නවා නමුත් ඔවුන්ට පුළුවන් පොලිසිය ළඟට ගිහිල්ලා එතනට යන්න නමුත් අවිස්සාවේල බස් පොළේ නතර වෙන්නේ.ඔවුන්ටත් පුළුවන් මාර ගහ හන්දියට ගිහින් යන්න.පාරේ නවත්වන්නේ නැහැ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ප්‍රායෝගිකව ගැටළුවක් වෙනවා.අවිස්සාවේල්ල බස් එක ගත්තොත් එතනින් ටවුන් එක මැද්දට ඇවිල්ලා ටවුන් එක මැද්දෙන් යන්න ඕනේ උඩහ හන්දියට.උඩහ හන්දියෙන් හරවන්න තැනක් නෑ සභාපතිතුමා.පහළ හන්දියට ගිහින් පොලිසිය ගාවින් බස් එකක් හරවන්න තැනක් නැහැ.ඒ සම්බන්ධවත් අවධානය යොමු කරන්න වෙනවා.නැත්නම් වෙන්නේ,විනාඩි 15න් 15ට ඇහැලියගොඩ මෙම ඒ4 ප්‍රධාන මාර්ගයේ දෙපැත්තටම.එවිට නගරයේ විශාල තදබදයක් ඇති වෙනවා. අපිට මන්තීරු 4 වුණාටඅපි භාවිතා කරන්නේ මන්තීරු 02යි.අපි හැම වෙලේම මන්තීරු 02ක් දෙපැත්තේම පාකින් වලට අයින් කරලා තියෙනවා.එවිට ලොකු ගැටළුවක් වෙන්න ඉඩ තියෙනවා.
**සභාපතිතුමා:-**
එම නතර තියෙන එක තමයි ගොඩක් ගැටලුවක් වෙන්නේ.අපි හිතමුකෝ රත්නපුරේ යන බස් තුන හතරක් නිතරම කමර්ෂල් බැංකුව ගාව නිතරම නවත්වලා තියෙනවා.අපි කියන්නේ ඒ ටික ඔක්කොම ඇහැලියගොඩ

නතර කරන්න.යනකොට යන්න පැය කාලක් තියෙද්දී නතර කළාට කමක් නැහැ.ඒ ටර්න් එකත් එක්ක තමයි ඔවුන් ආරම්භ කරන්න ඕනි.අනිත් එක තමයි පොළට සෙනඟ එන්නෙ නෑ කියලා මතයක් තියෙනවානේ .අපි පුළුවන් තරම් බලන්නේ පොළ ලොකු සම්පතක්නේ,එය ප්‍රචලිත කරන්න තමයිප්‍රජා ශක්ති අරමුදල් වලින් සිදු කරන්නේ.එහි අරමුණ බහුමානා දරිද්‍රතාවය තුරන් කිරීම තමයි. නමුත් ඒකෙ කොටසක් හරි දාල මේක සංවර්ධනය කරන්න හදන්නේ,පොළේ වෙළෙන්දන්ගේ තියෙන මැසිවිලි වලට උත්තරයක් එයි කියලා බලාපොරොත්තුවෙන්.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,පොළ භූමියට සෙනඟ ගියාට වෙළඳාමක් වෙන්නේ නැහැ.වෙළඳාම වෙන්න පොළ භූමියේ, එහි තියෙන භාණ්ඩ වල මිල අඩුවෙන්න ඕනි.මම ගියපාර සභාවෙදිත් පැහැදිලි කළා ඇයි තල්දූවේ සහ ගැටහැත්තේ පොළට මිනිස්සු යන්නේ කියලා.එම නිසා මේ පොළේ වෙළඳාම තමයි අපි වැඩි කරන්න ඕනේ.ටවුන් එකේ තියෙන කඩ තියෙනවානේ සමහර ඒවයේ සෙනඟ නැහැ.ඒ මොකක්හරි වෙළඳාමේ තියෙන දුර්වලතාවයක්.මම මේ විවාදයකට යනවා නෙවෙයි.නමුත් ඒ පිළිබඳව ටිකක් සලකලා බලන්න. පොළේ වෙළෙන්දන් වැඩිකර ගන්න ඕනි.මේකෙන් වෙන්නේ නැවත දින 07 ම පොළ තියෙනවා.අපේ දින 02 තියෙන එක නැති වෙනවා.පොළේ මිනිස්සු ඉන්නකොට වෙළඳාමක් කරන්න උත්සාහ කරනවා.එම නිසා ඒ පිළිබඳව සිතා බලන්න කියලා මම ප්‍රකාශ කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම හේවායින්න ප්‍රදේශයේ මරණ ගෙදරකට ගිය අවස්ථාවක එම ප්‍රදේශයේ හිතවතුන් පිරිසක් විශේෂයෙන්ම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරන්න කිව්වා,අවිස්සාවේල්ලෙන් එන බස් එක මැද හොල්ට් එකේ නවත්වලා බස් එක දානවලු පිට්ටනියට.රෝහලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යන අය ත්‍රීවිල් එකක් අරන් යන්න ඕනිලු. ඔබතුමාට කියන්න කිව්වා අනිවාර්යයෙන්ම ඒ ක්‍රමය නවත්වලා,ඒ එන බස් යාය පාර හන්දියට ගිහිල්ලා එතනින් නවත්වලා සෙනඟ බැස්සලා, පසු නැවත පිට්ටනියේ නැවැත්වීමට අවශ්‍ය කටයුතු සලසා දෙන්න කියලා.

**සභාපතිතුමා:-**
ඒ ගැන කීපදෙනෙක් ම කිව්වා.පොළ හන්දියේ නතර කළාම මාර්ග තදබදයක් එනවා.අනිත් එක තමයි එම මගීන්ට තියෙන අපහසුතාවයක් ඒක.

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අවිස්සාවේල්ලෙන් එන බස් මග තමා නවත්වන්නේ.එතකොට රෝහලට,ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යන මගීන් අපහසුතාවයට පත් වෙනවා.ත්‍රී රෝද රථයක් අරන් නැවත යාමට සිදු වෙනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙතන ප්‍රායෝගික ගැටළුවක් තියෙනවා.උදාහරණයක් විදිහට රත්නපුර ,ස්ටෑන්ඩ් එකේ කොළඹ යන බස් එක ඔරලෝසු කණුව ගාවින් හරවනවා.බලන්ගොඩ පැත්තට යන බස් එක එහෙම්ම ම යනවා.අවිස්සාවේල්ල බස් නැවතුම්පලේ බස් එක පොලීසිය ගාවින් ගිහින් ටවුන් එක වටේ යන් නෑ.එවිට කවුරුවත් වැරදියට හිතන්න එපා අපි අවිස්සාවේල්ල රත්නපුර බස් එක ස්ටෑන්ඩ් එකෙන් පටන් ගත්තොත් සහ නැවත බස් නැවතුම්පලෙන් ඉවර කරන්න ගත්තොත් ස්ටෑන්ඩ් එකෙන් ආයෙ බස් එකක් යනවා.මේ බස් සංගම්වලඇහැලියගොඩ බස් තමා දුවන්නේ.පිට බස් දුවන් නෑ.එවිට මේ පැත්තට කමර්ෂල් හරියේ බස් නැවතුම්පලක් නැහැ. ගානට් එක ගාව තමයි අපි හෝල්ට් එකක් විදිහට භාවිතා කරන්නේ. ඒ අතර මීටර් 100 ක් විතර තියෙන්නේ.මං හිතන්නේ ඒ අතර මුදල් අය කරන් නෑ. ප්‍රායෝගිකව කරනකොට ලොකු ගැටළුවක් වෙනවා. ඒ ගැනත් සොයා බලන්න.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපි කවුරුත් තේරුම් ගන්න ඕනි ,අපේ නගරය විධිමත්ව සංවර්ධනය වූ නගරයක් නෙවෙයි.පාර දෙපැත්තේ කඩවල් හැදිලා කි.මී.3ක විතර රේඛිය නගරයක් ලෙස තමයි හැදිලා තියෙන්නේමේ පළාතේ දිගම,ලොකුම නගරය මේක.කොහේ නගරයකවත් බස් නැවතුම්පල තැන් තැන්වල නැහැ.මෙතන සිටින මන්ත්‍රීතුමන්ලා සියලු දෙනාම දන්නවා පොළ භූමිය සංවර්ධනය කළ යුතුයි. එම නිසා අපි මේ යෝජනාව සභා අනුමැතිය අරගෙන, ප්‍රජා ශක්ති වලින් ගන්න උපරිම උත්සාහයක් දරමු.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
අපි මිලියන 11 ක් වියදම් කරනවා.එවිට කොහේ හරි තැනක් අපි අරගෙන ඉදිකිරීමක් කරන්න පටන් ගන්න හරි.ඒ වගේ ප්‍රයෝගික දෙයකට ගියොත් හොඳයි.රුපියල් 50 දාහක 60 දාහක වැක් නෙමේනෙ.මේක පොඩි මුදලක් නෙමේ.ඒ එක්ක තව ප්‍රශ්න එනවා.ටොයිලට් හදන්න ඕනේ, ලයිට් දෙන්න ඕනේ,ඒ වගේ තව ප්‍රශ්න එනවා.එතකොට තවත් මිලියන දහයක පහළොවක වියදමක් මේ ගොඩට එකතු වෙනවා.ලයිට් දාන්න ඕනි.කුණු ගන්න ඕනි.පොළේ කට්ටිය ඉල්ලනවා පොළට එකයි හමහජනතාවට එකයි විදිහට බාර්ත්රූම්.ඒ වගේ ප්‍රශ්න ටිකක් දීර්ඝ කාලීනව එනවා.එවිට තැනක් තියෙනවා නම් දැනට එතන සංවර්ධනය කරලා ගොඩයන්න පුළුවන් තත්වයක තියෙනවා නම් අපි සංවර්ධනය කරලා බලමු.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,වැරදි අවබෝධයක්.අපි හදන්නේ බස් නැවතුම්පලක් නෙවෙයි,පොළ භූමියක්.ආර්ථික මධ්‍යස්ථානයක් විදිහට අපි ඒක සංවර්ධනය කරන්න බලාපොරොත්තු වෙන්නේ.එතන සංවර්ධනය නොකළ කොටසක් තියෙනවා.විශාල ප්‍රදේශයක්.කොන්ක්‍රීට් යොදලා නැහැ.සතිපොළ ඒ කාලයේ සංවර්ධනය කරද්දී සමහර විට ප්‍රතිපාදන අඩු වෙන්න හරි ඇති.ඒ නිසා තමයි එහෙම වෙලා තියෙන්නේ. දැන් අපිට ඒක සංවර්ධනය කර ගන්න ඕනේ.ඇයි අපි සංවර්ධනය කරගන්නේ,එතන ලොකු භූමියක් පර්චස් 40ක 50ක විතර ලොකු භූමියක්.ඒ භූමිය අපි අඩු ගානේ රථ ගාලක් විදිහට හරි භාවිතා කරන්න ඕනේ.ඒ නිසා තමයි අපි මේ යෝජනාව දැම්මේ.එතන දැනට ජලය අරන් තියෙනවා.වැසිකිළි පද්ධතියක්

තියෙනවා.කාණු පද්ධතියක් තියෙනවා.මේ යෝජනාව යොමු කරන්නේ, එතන භූමිය සංවර්ධනය කරන්න විතරයි.ඉන්ටර්ලොක් අල්ලලා, පිළිවෙලට ලස්සන කරන්න.ඒ නිසා වැඩේ කෙරෙන පැත්තට අපි කතාකරන්නේ.ප්‍රතිශීලී විදිහට අපි භාරගමු.එතන ලොකු සක්‍යතාවයක් තියෙනවා.නගරයට ලොකු සෙනඟත් එනවා.බස් ටිකත් අපි එතෙන්ට ගෙනල්ලා නගරය ක්‍රමවත් කරගන්න ඕනේ.නගරේ ඉන්නවා වෙළෙන්දො.අපිට බැහැ ඔවුන්ට ඇවිත් මඩ ගොඩේ ඉන්න කියන්න.මේක අත්‍යවශ්‍ය ව්‍යාපෘතියක්.මෙය අපතේ යන්නේ නැහැ.මේක අපිට ඉතුරු වෙනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,දැන් ඔබතුමාලා මේ යෝජනාව යොමු කරන විට, අර තවත් මූලාශ්‍රයක් ගැන කතා කළානේ ඒක දැම්මා නම් හරි.විනාඩි 45ක් විතර ගියා මේ ගැටළුවට.මම පොඩි කාරණාවක් කියන්නේ,මෙන්න මේ යෝජනාව පළාත් පාලන කොමසාරිස්තුමාට යොමු කරලා, නැත්නම් අපි අදාළ නාගරික සංවර්ධන අධිකාරියේ අමාත්‍යාංශයට යොමු කරලා කරනවා කියලා විශ්වාසයක් ගොඩනගන්න ඕනේ.
මම පොඩි අදහසක් කියන්නේ,අපේ ආණ්ඩුව කාලේ යෝජනාවක් ගේනවා,අපේ වාසුදේව ඇමතිතුමා, පවිත්‍රා වන්නිආරච්චි ඇමතිතුමිය, කරුණාපාල ඇමතිතුමා හරහාත් අපි අදාළ ඇමතිතුමාට කෝල් එහෙකුත් දෙනවා. ඊට පස්සේ කරන්නේ, සභාපතිතුමා හරි උපසභාපතිතුමා අමාත්‍යාංශයට යවනවා පොඩි ලියුමකුත් එක්ක.මේවා පොඩි පොඩි කාරණා. අපි මේවා අත්දැකීමෙන් කියන්නේ. පිළිගන්නවා නම් පිළිගන්න පුළුවන්. නැත්නම් අයින් කරන්නත් පුළුවන්.ගැටළුවක් නැහැ.ඒ නිසා මම කියන්නේ මේ වගේ මාතෘකා මේ තරම් දුර යායුතු නැහැ.මේවා කළ යුතුම දේවල්.නමුත් අපි කවුරුන් හරි සභාපතිතුමාගේ නියෝජිතයෙක් ඇමතිතුමාට ගිහින් කියලා බලෙන් ගන්න ඕනේ.නැත්නම් ලියුම් ලිව්වට මේවා වෙන්නේ නැහැ ගරු සභාපතිතුමා.විශ්වාසවන්තවඑහෙම කතා බහ කරලා ප්‍රායෝගික ක්‍රමයක් හදාගන්න ඕනි.(ඝෝෂාව)

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, පොළ භූමිය සංවර්ධනය කරනවාට මම නිතරම කැමති පුද්ගලයෙක්.මංගල සභා වාරයේදී මම කිව්වා මේක ආර්ථික මධ්‍යස්ථානයක් කරන්න.
මෙන්ම අවිස්සාවේල්ල රත්නපුර මාර්ගය,දෙහිඕවිට පැත්තෙන් එන මාර්ගවල මගීන්ගේ තාක්ෂණික ගැටලු අදාළ පාර්ශව සමඟ සාකච්ඡා කරලා විසඳලා.ඒ මගීන්ට සාධාරණයක් ඉටුකර දෙන මෙන් මම ඉල්ලා සිටිනවා.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, නගර නිර්මාණය සහ පොළ නිර්මාණය පිළිබඳව විධිමත් නගර සැලැස්මක් දැන් ක්‍රියාත්මක වෙනවා.පොළ සම්බන්ධව තමයි දැන් අපි කතා කරන්නේ.පොළේ වැඩසටහනත් මේවන විට කතිකා කරගෙන යනවා.එවිට දැන් අපි බස් පිළිබඳව ප්‍රවාහනය සම්බන්ධව සිටින අය සමඟ සභාපතිතුමා කතා කරා.යම් කිසි එකඟතාවයකට ඇවිත් තියෙනවා.දැන් ලොකු ගැටළුවක්නේ බස් මගින් නවත්වන එක.එහෙම වැඩසටහනක් හදන කොට අඩුපාඩු තියෙනවා.අඩුපාඩු තිබුණට ඒක නගර නිර්මාණයට ගැළපෙන ක්‍රමවේදයක් විය යුතුයිනේ.එවිට මේ දෙකම එකට යන්න ඕනි.සමහර විට රේල් පාර පැමිණි විට රෝහලට යන පාර වෙනස් වෙන්න පුළුවන්.ඒවා කතාකර ගෙන යනවා.ඒවා සියල්ල ගැළපිය යුතුයි.ප්‍රජා ශක්ති මුදල අමාත්‍යතුමා හරහා සාකච්ඡා කරලා තමයි වෙන් කර ගන්නේ.ඒකට තමයි සැලසුම් හදන් යන්නේ.ඒක අපි පැහැදිලි කර ගන්න ඕනේ.මම හිතනවා ගරු සභාපතිතුමනි මෙම නගර සැලැස්ම පිළිබඳවත් අනිකුත් මන්ත්‍රීතුමන්ලාට දැනුවත් කිරීමක් කළා නම් හොඳයි.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.14යෝජනාවයටතේ,ඇහැලියගොඩ පොළ භූමියකොන්ක්‍රීට් නොකළ කොටස් සඳහා අන්තර් බද්ධිත කොන්ක්‍රීට් ගල් ඇල්ලීම සඳහා රු.11,100,000.00 වටිනා ඇස්තමේන්තුව සහා අරමුදලින් ඉටු කිරීමට සභා අනුමැතිය සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.15 යෝජනාව.

**06.15.රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ඉටු කිරීම සඳහා නියමිත මෝරගල හොරගොඩ පාර අසල පාලම ඉදි කිරීම යෝජනාව සභා අනුමැතිය සඳහා යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
අපිට ඇහැලියගොඩට ඇවිල්ලා තියෙන්නේ පළවෙනි ව්‍යාපෘතිය විදිහට මෙම මෝරගල හොරගොඩ පාර අසල පාලම.ඒකට අනුමැතිය හම්බ වෙලා ඇස්තමේන්තු හදලා තියෙනවා.ඒකට සභා අනුමැතියක් අවශ්‍යයි කියලා ඒ ඇලිවුමෙම තියෙනවා.ඒ නිසා තමා සභා අනුමැතියට දැම්මේ.ඒකට මුදල් යන්නේ අපෙන් නෙවෙයි. පළාත් පාලන අමාත්‍යාංශයෙන්, අපිට ඇස්තමේන්තුවක් හදලා එවලා තියෙනවා . එහි තියෙනවා මෙයට සභා අනුමැතිය අවශ්‍යයයි කියලා.

**සභික ආර්.වත්සලා නිශාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, මගේ සභාවේ පළවෙනි යෝජනාව තමයි මේ පාලම.ඒකට තමයි මුදල් පාස් වෙන්නේ. එම නිසා මම ස්තුතිවන්ත වෙනවා. සතුටු වෙනවා ඒ පිළිබඳව.

**සභික පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,වත්සලා මන්ත්‍රීතුමිය තමයි මෙය යෝජනා කළේ. ඇස්තමේන්තුව කරන්න කියපු වෙලාවේ අපි එහි මැනුම් කටයුතු සිදු කළා.දැනට තියෙනවට වැඩිය ඒක වෙනස් කරලා , වැසි කාලයේදී උඩුමත්ත ඉහළ

ප්‍රදේශයෙන් විශාල ජල කඳක් එන නිසා දැනට තිබෙන පොඩි හියුම් පයිප්පයට වඩා වෙනස් කර විශාල කර පාලම සෑදීමට තමයි යෝජනා කරන්නේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඒ බෝක්කු දෙකම එකතු කරලා හදන්නේ නැහැ නේද.දැනට මාර්ගය අඩි 12 පාරක්.මෙම මාර්ග කොටස නැති වුණොත් නැවත ලබාගන්න බැහැ.ඒ නිසා අඩි 12ටම ඒ මාර්ගය හදන්න.

**සභාපතිතුමා :-**
පිට්ටනියට යන මාර්ගය නේද .ඒක නගර සැලසුමෙත් තියෙනවා මං තීරු 2කට සැකසිය යුතුයි කියලා.රත්නපුර දිස්ත්‍රික්කයේ තියෙන විශාලම පිට්ටනිය.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.15යෝජනාවයටතේ,රාජ්‍ය පරිපාලන පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යටතේ ඉටු කිරීම සඳහා නියමිත මෝරගල හොරගොඩ පාර අසල පාලම ඉදි කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.16යෝජනාව.

**06.16. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක ඉඩම් සැලසුම්, ඉඩම් අනුබෙදීම් හා ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම, අනුමත කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සහා අනුමැතිය සඳහා යෝජනා කරමි.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මෙම අතුරු ව්‍යවස්ථාව 2023.3.14 ත් සභාවට ඇවිල්ලා තියෙනවා.නමුත් අඩුපාඩු තිබුණ නිසා තමයි නැවත මෙය ඇවිල්ලා තියෙන්නේ.මෙය පළාත් පාලන අමාත්‍යාංශයෙන් ආණ්ඩුකාරවරියගේ අනුදැනුමින් තමයි මෙය මෙම අතුරු ව්‍යවස්ථාව වැළඳගැනීම සඳහා අපිට මෙය ඇවිත් තියෙන්නේ.අතුරු ව්‍යවස්ථා කමිටුව අපි රැස්වුණා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම අතුරු ව්‍යවස්ථා කමිටුව සඳහා මම සහභාගී වුණා.මෙය 2023 වසරේදී පැමිණි අතුරු ව්‍යවස්ථාවක්.ඔබතුමා කිවුවා මෙය ප්‍රාදේශීය සභා කිහිපයකම වැළඳගෙන තියෙනවා කියලා.එවිට අපි ඒ පිළිබඳව සාකච්ඡා කරන විට අපිට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට අදාළ වන විදිහට අපි ඒ යෝජනා ඉදිරිපත් කළා.මේන් මේ කොටස අපි ඉදිරිපත් කළේ නෑ.දෙවන පිටුව උප ලේඛනය ලෙස ඉඩම් අනුබෙදුම් සැලැස්මක් සම්බන්ධව අනුමැතියට අදාළ බිම් කොටසක් සඳහා කියන එකේ පර්චර් 6 සිට 10 දක්වා රු. 500.00යි.පර්චස් 11 සිට 20 දක්වා රු.1500.00යි කියලා තියෙනවා.මට ගැටළුවක් තියෙනවා පර්චස් 10.5ක් රු.1000.00යිද රු.1500.00ද කියන එක පිළිබඳව.මේක අපිට ප්‍රශ්නයක්.මේක නිශ්චිත නෑ.මං කිවුවා මෙහෙම දාන්න එපා කියලා.කවුද ලේකම්තුමෙක් කිවුව කියලා දාල තියෙන්නේ.ලේකම්තුමා කවුද කියලා කියන් නෑ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ වට්ස් ඇප් එකට දාල තියෙන එක වෙනස්.දැන් මේ දුන්න ප්‍රින්ට් එකේ තියෙන්නේ පර්චස් 6 සිට 10 දක්වා රු.500.00, පර්චස් 10 සිට 20 දක්වා රු.1000.00, පර්චස් 20 ට වැඩි රු.1500.00, වශයෙන්.

**සභාපතිතුමා :-**
ඒදා ලේකම්තුමා හිටියෙත් නෑ.අපි ඒහෙනම් නැවත කමිටුව රැස් වෙලා ඊළඟ මහා සභාවට දාමු.අපි සංශෝධනය කරමු.අපි මෙහෙම දැම්මෙත් සංහෝධන තියෙනව නම් කරන්න.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අතුරු ව්‍යවස්ථා කමිටුවක් වුණා ම අපිට වගකීමක් තියෙනවනේ.අපි ඒදා ඇවිල්ලා ඒ වගකීම ඉෂ්ඨ කළා.ඒ අතුරු වයවස්ථා කමිටුවේ හිටපු නැති, මං දන්නෑ ඒ ලේකම් කෙනෙක් කියලා කිවුවේ.ඒදා අතුරු ව්‍යවස්ථා කමිටුවේ හිටපු නැති කෙනෙක් තමා ඒක වෙනස් කරන්නේ.ඒහෙම වෙන්න බෑ.ඒහෙම කරන්න ඒපා.

**සභාපතිතුමා :-**
සියලු දෙනාට දැන ගන්න කියන්නේ.මේ අතුරු ව්‍යවස්ථාවක් හදනවා කියන්නේ මේක ලොකු රාජකාරියක්. මේක සම්මත කරාට පස්සේ මේක නීතියක් බවට පත් වෙනවා.ඒකට ආපු අයට මම ඉතාම ගරු කරනවා.මේක අපි ට සංශෝධනය කරන්න පුළුවන්.මේක කොමසාරිස්ට ගිහින්, ඒතනින් අමාත්‍යවරයාට ගිහින් පස්සෙ තමා මේක නීතියක් බවට පත් වෙන්නේ.මේක අපි සංශෝදනය කරලා යැවුවට මේකම අපිට ලැබෙයිද කියන්නත් බෑ. මෙය අපි වැළඳගත්තහම සමහර කාරණා වලදී අපිට මේක ඉතා පහසුයි.

**සභික පී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,6.14 යෝජනාවත් අපි සුජීව මන්ත්‍රීතුමා කිවුව වගේ විනාඩි 45 ක් විතර කාලේ ගත කළා. දැන් 6.14 යෝජනාවේ ගල් අල්ලන්න කියනවා.ඒක විග්‍රහ කරනවා.නමුත් වෙන එකක් කියනවා.මේවා පැහැදිලිව ලිවුව නම් මේ කාරණා ඉවරයි.

මෙම ලේඛන සම්බන්ධයෙන් මම හැමදාම කියනවා,යමක් ලියනකොට ඉතාමත් පැහැදිලිවත්. අනෙක් කරුණ මම ඉතාමත්ම ගෞරවයෙන් ඉල්ලා සිටනවා,මේවා සෑම මන්ත්‍රීවරයෙක් සඳහාම ලබාදිය යුතුයි.කලින් හදපු අතුරු ව්‍යවස්ථාවක් තමා සංශෝධනය කළේ.ඒදා නීතිවලට වඩා දැන් තියෙන නීති වෙනස්.දිලීන් මන්ත්‍රීතුමා කිනව වගේ ඒක ඒහෙම නැත්නම් මේක වැරදියි.මේව වට්සැප්වලට දැම්මට කියවන්න බෑ. මේවගේ ඒවා මන්ත්‍රීවරු අතට දෙන්න.මම හැමදාම කියනවා ඒක.
අනික තමා දීමනා ගෙවන්න කියලා යෝජනාව දානවා.ඒක හරි ඒ දීමනා ගෙවන්න ඕනේ.නමුත් මෙකෙ සංඛ්‍යා දත්ත දාල නෑ.ගියපාරත් මම ඉල්ලුවා ලේකම්වරයාගේ සිට සියලුම වැටුප් ලබන සේවකයින්ගේ නාම ලේඛනයක් අපිට අවශ්‍යයි කියලා.එවිට ගැටළුවක් නැහැ.නිතරම රීති ප්‍රශ්නයක් කියන නිසා තමයි මම නිහඬ වෙලා හිටියේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේකෙ සංශෝධන 06හි තියෙනවා “සියලුම අතුරු ව්‍යවස්ථා බලාත්මක වන දින සිට වසර දෙකක කාලසීමාවකට අනුමත සැලැස්මකින් තොරව ඉදිකිරීමක් හෝ වෙනස් කිරීමක් සම්බන්ධයෙන් සැලැස්මක් අනුමත කිරීමේ දී හෝ අනුමැතිය ලබා දීමේ දී මෙම වගන්තිය යටතේ අය කරනු ලබන නියමානුකූල ගාස්තුවක් අය කිරීම අදාළ නොවිය යුතුයි කියලා.” අපි නීතියක් සකස් කළාට පස්සේ එයාලට සහනයක් සම්බන්ධයෙන් අපි කතා කරන්න වෙනවා.ඒ සම්බන්ධයෙන් තීන්දුවක් අපි ගමු කියලා මම යෝජනා කරනවා.

**සභාපතිතුමා :-**
මේකෙ මිළ ගණන්වල නෙමේ නේද ප්‍රශ්නය තියෙන්නේ.පර්චස් ගානෙ නේද?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,දිලීන් මන්ත්‍රීතුමා මතු කරපු කාරණය නිශ්චිතයි.එහි තිබෙනවා 6 සිට 10 දක්වා රු.1500.00යි කියලා. පසුව 11 සිට 20 දක්වා තමයි ඊළඟ ගාණ තියෙන්නේ.10.5 කවුරු හරි කැඩුවොත් එහෙම අපි කීයක් අය කරනවාද ?

**සභාපතිතුමා :-**
පර්චස් 40 දක්වා ඒක හරි.පර්චස් 41 සිට 80 දක්වා.ඒකත් 41 සිට කියලා එන්න ඕනේ නේද?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, අපි මේක එම නිසා සංශෝධනයට යටත්ව අතුරු ව්‍යවස්ථාව සම්මත කරගමු.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙතන ගැටළුවක් තියෙනවා. සමහර වෙලාවට සැලසුම්ගතව හෝ නැතුව යම් දඩ මුදල් අය නොකර ඒ අදාළ වැරැද්ද නිවැරදි කරන්න.අපි දැන් අවධානය යොමු කරන්න ඕනේ.මේ අවස්ථාවේදී දැනටමත් දඩ මුදල් ගෙවලා ඒක නීත්‍යානුකූල කරගත් අයට මේ තුළින් අසාධාරණයක් වෙනවද නැද්ද කියන කාරණය පිළිබඳව අපි මේ සභාවෙන් අදහස් කරගන්න ඕනේ.මේකෙදි අපි එක අදහසක හිටියා, ඔබතුමාල එක අදහසක හිටියා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,නීතියක් දෙපැත්තටම අදාළයිනේ. මෙතෙක් කාලයක් අනුමැතියක් නොගෙන කරපු වැඩ තියෙනවා.අපි නීතියක් සම්මත කරගත්තට පස්සේ ඒක නීතියක් විදිහට යනවා නම් ,ඊට කලින් අපි දඩයක් ගත්තා නම් ඒකත් ඒ විදිහම තමයි. නීතියක් ඒ කාලයේ තිබුන්නෑ නැහැ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙම අවුරුදු දෙක මග අරින්නේ ඇයි කියන කාරණයට සාධාරණ හේතුවක් තියෙන්න ඕනි.

**සභාපතිතුමා :-**
අපේ අනිත් මන්ත්‍රීවරුන්ට තේරුණාද දන්නෙ නෑ.මේකෙ කියන්නේ, අතුරු වයවස්ථාවේ එක තැනක තියෙනවා, ඉඩම්වල සැලසුම් අනුමත කිරීමේ දී,අපිට මේක එවලා තියෙන්නේ 2023 තුන්වෙනි මාසේ සම්මත වෙච්ච අතුරු ව්‍යවස්ථාවක්.එකෙ අඩුපාඩු තිබිලා ආයෙ නැවත එවලා තියෙනවා.අපි එතකොට වැළඳගෙන නෑ.දැන් මේ වැළඳ ගන්න කියන එකෙන් එකක් තමයි. අපි එකක් කිවුවොත් උදාහරණයක් ලෙස ජේතවනාරාම පන්සලේ ගොඩනැගිලි ටික .
අපි මේක වැළඳගෙන ගැසට් වෙලා එනවා කියලා හිතමුකෝ 2026 .06.10 කියලා. එතන සිට ඉතුරු අවුරුදු 02ක් තුල අපි දඩ ගැහුවානේ. සමහර තැන්වල ප්ලෑන් හදලා තියෙනවා, අපෙන් අනුමත කරගෙන නැහැ. එවිට අපි ඔවුන්ට එම කාල සීමාවත් එක්ක ලොකු දඩයක් අය කෙරුවා. පසුව අපි මේකෙන් කියන්නේ,නාගරික සංවර්ධන අධිකාරියට අදාළ නාගරික ප්‍රදේශ තියෙනවානේ. ඒවාට මේවා අයත් වෙන්නේ නැහැ. ඒවායින් එපිට ටිකේ ,ගත්තු දඩ මුදල මින් පසුව කලින් කිවූ හයවෙනි මස දින සිට අවුරුදු දෙකකක් යන තුරු හදල තියෙනවානේ කොහොමහරි දන්නේ නැතුව.එම අයට පුළුවන් අපෙන් සම්මත කර ගන්න.අපි ඒකට සම්මත කරන මුදල ගන්නවා. දඩයක් ගන්නේ නැහැ. ඒක තමයි මේකෙන් කියන්නේ.ඒකට ඔබතුමන්ලා කැමතිද අකමැතිද කියලා මෙතන අහන්නේ.
ආණ්ඩුකාරවරිය තමයි එවුවේ.වැළඳගන්න පුළුවන් නම් අර අයට සහනයක් දෙන්න කියලා.වැළඳගන්න බැරි වුණොත්, දැනට කීපයක් සම්මත කරගත්තා දඩ මුදල් ගෙවලා.සම්මත වුණාට පස්සේ අපිට පුළුවන් ඔවුන්ගේ දඩ මුදලින් විතරයි අඩු වෙන්නේ. දඩ මුදලක් නැතුව අපෙන් අනුමත කරපු,සැලසුම් හදපු මේ ප්‍රෙද්ශයේ තිබෙන අනික් ස්ථාන වලටත් සමහර විට අපිට ආදායම් වැඩි වෙන්නත් පුළුවන්.දැන් ඔවුන් අපෙන් අනුමත නොකරනෙ ඉන්නේ.නමුත් දඩ මුදලක් දාන්නේ නැහැ. අවුරුදු දෙකක් යනකන් අපි සහනයක් දෙනවා කිවුවොත් ,සමහරවිට සම්මත නොකර ඉන්න අය පැමිනෙන්න පුළුවන්. සුජීව මන්ත්‍රීතුමා එදා ඒක පෙන්වලා දුන්නා.

**සභික ජී.එ.වි.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම ස්ථානයේ සිදුවන්නේ කෝටි ගාණක ව්‍යාපෘතියක්. මෙම මුදල එම ව්‍යාපෘතියේ හැටියට බලනකොට පොඩි මුදලක්.ගමේ මිනිස්සුන්ගෙත් ලොකු විරෝධතාවයක් තියෙනවා.එම ව්‍යාපෘතිය දෙස බලන විට,ඒක එයාලට පොඩි මුදලක්.මගේ පුද්ගලික මතය නම් මෙම මුදල සභාවට අයකර ගත යුතුයි.

**සභාපතිතුමා :-**
ඒක උදාහරණයක් ලෙස මම පන්සල් භූමිය කිවුවේ. නාගරික සංවර්ධන අධිකාරියට අදාළ නැති අනෙක් සියලුම ප්‍රදේශවල අයට මෙය බල පැවැත්වෙනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මට ගැටළු දෙකක් තියෙනවා. එකක් තමයි,පර්චස් 4කට වඩා අඩු එහෙකට අනුමැතිය ගන්න වෙන් නැනේ .ඒකට අපි මොකක්ද සිදු කල හැක්කේ.
දෙවෙනි එක තමයි ලැන්ඩ් සේල් සඳහා අපි විශේෂ ගාස්තුවක් අයකරනවාද ඒ සම්බන්ධයෙන් ඇතුළත් කිරීමක් සිදුකරගන්න වෙනවා.ලැන්ඩ් සේල් සඳහා වෙන ම ගාණක් අය කරන්න ඔනේ මං හිතන විදිහට නම්.මේ විදිහට ආවොත් අපිට රුපියල් 1000 ඒවා 10 ක් 15 ක් තමා ගන්න වෙන්නේ.ඒ සම්බන්ධවත් මේකට ඇතුළත් කිරීමක් කර ගන්න වෙයි කියලා මං යෝජනා කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,සමහර මන්ත්‍රීතුමන්ලාට අදහසක් නැති නිසා මම කියන්නේ.අපේ බල ප්‍රදේශයේ වසම් 44ක් තියෙනවා.එයින් නාගරික සිමාවට තියෙන වසම් 22 ක් තියෙනවා.නාගරික ප්‍රදේශ නොවන වසම් 22 කුත් තියෙනවා.සෑම බල ප්‍රදේශයකම ගොඩනැගිල්ලක් අනුමත කරගන්න එන්නේ නැහැ ප්‍රාදේශිය සභාවට ණයක් ගන්න තමයි එන්නේ.අපේ බල ප්‍රදේශය තුළ කවුරුන් හෝ ඉදිකිරීමක් සිදුකරනවා නම්, එම අනුමැතිය ලබාගත යුතුයි.මේ නීතියෙන් කරන්නේ ඒ සඳහා නිවැරදි නීති රෙගුලාසි ටිකක් හදන එක.ඒකට තමයි අපි අතුරු ව්‍යවස්ථා කමිටුව කැඳෙවුවේ.එහෙම කැඳවා ගත්තු එකේ සංශෝධන ටිකකුත් තියෙනවා.ඒක අදාළ වෙන්නේ අදාළ වසම් 22කටම.දැනට මේ වෙද්දී හදලා අනුමත නොකරපු ඒවා අනෙක් වසම් වලත් තියෙනවා.ඒ අයටත් දඩ මුදලක් අයකරනවා කියන කාරණය සාධාරණ නැහැ.කෙටුම් පතේ තිබ්බෙ අවුරුදු 2 ක් කියලා.අපි ඒක තව අවුරුද්දකිනුත් අඩු කළා.අපි පසුව එම සමා කාලය අවුරුද්දකින් අඩු කළා.එහි දිලීන් මන්ත්‍රීතුමා මතු කළා මෙන් වැදගත් සංශෝධන ටිකක් තියෙනවා.අපි කිසිසේත්ම පර්. 4 හෝ 6ට වඩා අඩු ඒවට අනුමැතිය දෙන්නේ නැහැ.ඒ නිසා මේ නීතිය සම්මත කරන්න අපිට බාධාවක් නැහැ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මිනිස්සුන්ට පර්චස් එකත් වටිනවා.මම කිවුවේ එයාලට අනුමැතිය දෙන්න කියලා නෙවෙයි. ලැන්ඩ් සේල් සඳහා මොකක්ද සිදුකරන්නේ කියලා මම ඇහුවේ.

**සභාපතිතුමා :-**
අපි ඒක එදා පැහැදිලිව කතා කළා.තමන්ගේ ඉඩමක් තියෙන අයට ඒක හතරට පුළුවන්.හතරට කරන්න බැරි සංවර්ධනය කරන ඉඩම් කියන්නේ.ඒ කියන්නේ ඉඩමක් අරන් ඉඩම් කැබලි විකුනන්නේ, අන්න ඒ අයට බැ හය හතර.ඒ අයට පුළුවන් අඩුම හය.ඒක සාධාරණයිනේ.ඒ අය පොඩියට කඩන්න ඕන් නැනේ.තමන්ගේ පවුලේ අයට කඩන එකට ඔබතුමාගේ මතේ මාත් ඉන්නවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ලැන්ඩ් සේල්වලට මොකක්ද කරන්නේ කියලා.ඒකට විශේෂ ගාස්තුවක් ගන්නවද කියලා අහන්නේ?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේකෙ සංශෝධනය කරපු කාරණා දිලීන් මන්ත්‍රීතුමා පෙන්වලා දුන්නා.නමුත් ඉතිරි කාරණා නිශ්චිතයි.දැනට කාට හරි ඉඩමක් තියෙනවා නම් පර්.40ක් දක්වා ඒක අනුමත කරගන්න පුළුවන්. ඒක අදාළ වෙන්නේ ඉඩම් අනුබෙදුම් සඳහා.ඒ කියන්නේ ලැන්ඩ් සේල්.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අනුබෙදුමක් කියන්නේ ලැන්ඩ් සේල් නෙමේ.උදාහරනයක් විදිහට මගෙ පර්චස් 40 ක ඉඩමක් තියෙනවා.ඒකෙන් පර්චස් 10 ක් කඩනවා.ඒව තමා අනු බෙදුමක් කියන්නේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒකට තියෙනවා යම් කිසි සීමාවක්.ඒ සීමාව තමයි මේ තියෙන්නේ.මේකෙ තියෙනවා පර්චස් 40 ක් දක්වා රුපියල් 1000 යි.ඉඩම් අනුමැතියට අදාළ පර්චස් 40 සිට.ඒ කියන්නේ මේකේ පර්චස් 40 දක්වා ම මේකේ තියෙනවා.දෙවන උපලේඛනයේ තියෙනවා ඉඩම් අනුබෙදුම් සැලැස්මක් සම්බන්ධයෙන් අනුමැතියට අදාළ බිම් කොටසක් සඳහා.පර්චස් 6 සිට 10 දක්වා.ඊට පස්සේ පර්චස් 10 සිට පර්චස් 10 සිට පර්චස් 20 දක්වා.යම්කිසි ගොඩනැගිල්ලක් හදනව නම් අවමය පර්චස් 6 ක බිම් ප්‍රමාණයක් තියෙන්න ඕනේ කියලනේ මේ කියන්නේ.අපි මෙතන ඉන්න ප්‍රතිපත්ති සම්පාදකයෝ.එවිට අපි යම්කිසි ප්‍රතිපත්තියක් හදාගන්න ඕනි අපේ බල ප්‍රදේශයේ ඉඩම්වලට අනුමත කළ හැකි සීමාව පිළිබඳව.මේක හරි නිශ්චිතයි.ඉඩම් අනුබෙදුම් කරනවා නම්,පර්.6 සිට 10 දක්වා තමයි අවමය.

**සභාපතිතුමා :-**
එදා ආවනම් මේක විසඳගන්න තිබුණා.දැන් කමිටුවේ අයම තර්ක කර කර යනවා.අනිත් අයගෙ කාලේ අපරාදෙ.මේක හදිසි නැතඅපි ඕන්නම් මේක ඊළඟ සභාවකට දාමු.නැත්නම් තව කාලේ යනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,මම හිතන්නේ අපි ප්‍රායෝගිකව එදා බොහොම සාර්ථක සාකච්ඡාවක් සිදු කළා.මේක 2023 ආපු යෝජනාවක්.අපි මේ වසම් 44හි ජනතාවට සහනයක් දෙන්න හදන්නේ.එම නිසා මේ සහනය දෙන එක තවත් ප්‍රමාද කරනවට වැඩිය, දිලීන් මන්ත්‍රිතුමා මතු කරපු කාරණය එදා අපිට සාකච්ඡා කර ගන්න බැරි වුණා.එදා තිබුණෙ නැ.ඒක දැන් සංශෝධනය කළා.ඒ නිසා මේක තවත් කල් දාන්නේ නැතුව,මං දන්න විදිහට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව, බලන්ගොඩ ප්‍රාදේශීය සභාව මේක වැළඳගෙන තියෙනවා.මං දන්නැ මගෙ අදහස මං මේ කියන්නේ.ඒ නිසා මේක තව කල් ගෙනියන්න අවශය නැ.අපි දැන් සාකච්ඡා කළානේ.ඒක නිසා අපි ගන්න තීන්දුවක් අරගෙන අවසන් කරමු.

**සභාපතිතුමා :-**
ගයාෂාන් මන්ත්‍රිතුමා සංශෝධනයක් තියෙනව නම් කියන්න.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම කිවුවේ පර්චස් 4ට අඩු ඒවට දෙන්න කියන එක නෙවෙයි.හැබැයි ඒකට ගන්න ක්‍රියාමාර්ගය මේකට දාගන්න ඕන.
දෙවනි එක තමා ලැන්ඩ් සේල් කියන්නේ සංවර්ධනය කර විකුණන ඉඩම්. ඒව මේවා අස්සට දාගන්න ඕන.නැත්නම් එයාල මේවා අස්සෙන් පනිනවා.

**සභික කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ගයාෂාන් මන්ත්‍රීතුමා කියන එක කාටවත් පැහැදිලි නොවන එක තියෙන්නේ.එතුමා කියන්නේ අපේ සාමාන්‍ය පුද්ගලයෙක් සැලසුම් අනුමත කර ගන්න කොට තියෙන මිළ ගනනුයි ලැන්ඩ් සේල් එකක් කියන්නේ ව්‍යාපාරයක් කියලයි.ඒකට අපි සාමාන්‍ය පුද්ගලයෙක්ට යන මුදලම ඒ සඳහාත් යන්නෙ කියල තමයි එතුමා අහන්නේ.ඒක වෙනම මුදලක් විදියහට අය කරනව නම් ඒක මේකට ඇත්ළත් කර ගමු කියලා එතුමා කියන්නේ.ඒ කාර්නය බොහොම පැහැදිලියි.වර්ග දෙකට මේකෙ අය කරන මුදල වෙනස් කරමු කියලා කියන්නේ.

**සභාපතිතුමා :-**
සභාවේ අනිකුත් මන්ත්‍රීතුමන්ලාත් කැමති නම් අපි ඒකට පොඩි මුදලක් වැඩිකරගමු ඒ සඳහා.ගන්නා මුදලින් 1% කුත් අපිට හම්බෙනවා.අරක ඒහෙනම් අපි සංශෝධනයක් දාමු කීයක්ද කියලා කියන්න.මේක මේ තිබුණ ගාණ නෙමේ තියෙන්නේ.අපි වැඩි කරපු ගාණ තමා තියෙන්නේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, උපලේඛනයකින් කරන්නේ කොන්දේසි ටික අනුමත කරලා, නීතියක් බවට සම්මත කරගන්න එක තමයි.මේකෙ තියෙන ගාස්තු ටික අපිට අවුරුද්දෙන් සංශෝධනය කරන්න පුළුවන්.

**සභාපතිතුමා :-**
මන්ත්‍රිතුමා මං හොයලා බැලුවා.UD එකේ ප්‍රදේශය තුළත් අය කරන්නේ මේ ගාණ.මේක අයෙ ඕන්නම් සංශෝධනය කරන්න පුළුවන්.අපි කොමසාරිස්ට යොමු කරලා නැවත සභාවට දාමු.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.16යෝජනාවයටතේ,ඇහැලියගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ නිවාස හා නගර සංවර්ධන ආඥා පනත ක්‍රියාත්මක වන ප්‍රදේශයක ඉඩම් සැලසුම්, ඉඩම් අනුබෙදීම් හා ගොඩනැගිලි සැලසුම් පරීක්ෂා කිරීම, අනුමත කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සභා අනුමැතිය සඳහා යෝජනා ඉදිරිපත් වූ යෝජනාව සංශෝධනවලට යටත්ව, පළාත් පාලන කොමසාරිස්තුමාගේ අනුමැතිය ලබා ගැනිමෙන් පසු නැවත මහා සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරිමට එකඟ වීමෙන් පසු මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය

**සභාපතිතුමා :-**
සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.17 යෝජනාව.

**06.17. ප්‍රාදේශීය සභාවට නික රාජකාරී කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය වන හදිසි මිලදී ගැනීම් හා අලුත්වැඩියා සඳහා වැය දැරීමට රුපියල් 20,000.00 ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීමටත් මේ යටතේ වැය වන මුදල් ප්‍රතිපූර්ණය කරමින් වර්ෂ අවසානයේ අත්තිකාරම් පියවීමට යෝජනා කරමි.**

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ් බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මන්ත්‍රිතුමන්ලා අපිට පොඩි ගැටළු ටිකක් මතු වුණා පසුගිය කාලයේ දී.ඒ කියන්නේ හදිසියේ සිදුවන සිදුවීම් එක්ක අතේ මුදලක් නොමැතිකම නිසා.සමහර වෙලාවට කසළ ට්‍රැක්ටරයේ දෝෂ මතු වෙනවා.ජල නළවල බට කැඩෙනවා.ඒව හදන්න කියන්න ඒ සඳහා වියදමට මුදල් නැ.මේක කා අතටවත් දෙන්නේ නැ.එම නිසා තමයි අපි ඉල්ලන්නේ රු.20000.00ක මුදලක් සභාවේ වෙනම තැන්පත් කරලා තැබීමට. එවන් සිදුවීමක් වූ විට එය ලබා ගෙන නැවත ප්‍රතිපූරණය කිරීමට.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දූණුවිල මැතිතුමාගේ 06.17යෝජනාවයටතේ,ප්‍රාදේශීය සභාවට දෛනික රාජකාරී කටයුතු පවත්වාගෙන යාමට අවශ්‍ය වන හදිසි මිලදී ගැනීම් හා අලුත්වැඩියා සඳහා වැය දැරීමට රුපියල් 20,000.00 ක අත්තිකාරම් මුදලක් ලබා ගැනීමටත් මේ යටතේ වැය වන මුදල් ප්‍රතිපූර්ණය කරමින් වර්ෂ අවසානයේ අත්තිකාරම් පියවීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**

සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.18 යෝජනාව.

**06.18. සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනත අනුව සුනඛ ලියාපදිංචි සහතිකය නිකුත් කිරීමේ දී ප්‍රාදේශීය සභා නිලධාරීන් විසින් ඉටු කරන කාර්ය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරීන්ගෙන් ඉටු කරවා ගෙන ලියාපදිංචි අංකය සඳහා අය කරන රුපියල් 100.00 ක ගාස්තුවෙන් 10% ක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ගෙවීමට යෝජනා කරමි.**
යෝජනාව පහත පරිදි සංශෝධනය විය යුතුය.

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනත අනුව සුනඛ ලියාපදිංචි සහතිකය නිකුත් කිරීමේ දී ප්‍රාදේශීය සභා නිලධාරීන් විසින් ඉටු කරන කාර්ය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරීන්ගෙන් ඉටු කරවා ගෙන **ලියාපදිංචිය** සඳහා අය කරන රුපියල් 100.00 ක ගාස්තුවෙන් 10% ක් **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය** වෙත ගෙවීමට වූ යෝජනාව පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව සිදු කිරීමට යෝජනා කරමි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මෙතන ලියාපදිංචි අංකය සඳහා නෙමේ ලියාපදිංචිය සඳහා වෙන්න ඕනේ.අපේ නිලධාරීන් දෙදෙනෙක් යනවා මෙම සුනඛ එන්නත් කිරීමට.උදේ ඉඳන් අපේ නිලධාරින් දෙදෙනෙක් එතන ඉන්න ඕනි.විෂය නිලධාරීන් නොමැතිකම නිසා කාර්යාලයේ අපහසුතාවයට පත්වෙනවා.එම නිසා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් කිවුවා අපිට සුනඛ කරපටියෙන් 10%ක් දෙනවා නම්,අපි කරන්නම් කියලා. සුනඛ කරපටිය රු.100ක් වෙනවා.ඒක නිසා අපි කිවුවා අපි 10% දෙන්නම් ඒ කාර්ය කරලා දෙන්න කියලා.ඒක තමා මං මේ යෝජනා කළේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, වීථි සුනඛයින් සම්බන්ධයෙන් ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද?දැන් රාජ්‍ය ආයතනවලට ගියාම සුනඛයින් ඉන්නවා.ඒක හරි ප්‍රශ්නයක්.මේකට සභාව තුළින් ගන්න ක්‍රියා මාර්ගය මොකක්ද?

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපිට තියෙන ලොකු අභියෝගයක් තමයි මෙම වීථි සුනඛයින්.මහජන සෞඛ්‍ය සම්බන්ධයෙන් අපට තියෙන වගකීමක්නේ.නිවෙස්වල ඇති කරන සුනඛයිනුත් පාරට එනවා. එම නිසා අපිට තිබෙන ලොකුම අභියෝගය තමයි මොවුන් වීථි සුනඛයින්ද නිවෙස්වල සුනඛයින්ද කියලා නිශ්චිත නැහැ.එම නිසා අපි පළමු අදියරේදී සිදුකරන්නේ, මෙමසුනඛයින්ගෙන් නිවෙස්වල සිටින සුනඛයින් ලියාපදිංචි කරනවා. සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයත් සමඟ ඒකාබද්ධ වී.අපේ නිලධාරී මහත්වරුන් කිහිපදෙනෙක් සම්බන්ධ වෙනවා.අපේ කාර්යමණ්ඩලය මදිකම නිසා ඒ සඳහා යා නොහැකියි.එම නිසා අපි ලියාපදිංචි කිරීමේදී ලබාදෙන රු.100.00ක කරපටියේ ගාස්තුවෙන් 10% ක් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෙත ගෙවීමට යෝජනා කරනවා.අපි ඊට පස්සේ බලමු කරපටිය නැති බල්ලන්ට මොකද කරන්නේ කියලා.(ඝෝෂාව)

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයෙන් බෙත් විදිනව මමදැක්කා මේ දවස්වල.ඒ දවසෙම මේක කරගන්න පුළුවන් නම් හොඳයි.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එන්නත්කරණය කරලා මරන්න බැහැ.නොමරා වන්ද්‍යාකරණයක් කරනව නම් හොඳයි.අපි උපරිම සහයෝගය දෙන්නම්.

**සභික එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මීට කලින් වන්ද්‍යාකරණ සැත්කම ක්‍රියාත්මක වුණා.වන්ද්‍යාකරණ සැත්කම නැවත ක්‍රියාත්මක කරන්න පුළුවන්නම් හොඳයි.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව වෙනස් විය යුතු සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය වෙත සුනඛ කරපටියෙන් 10%ක් ලබාදෙනවා කියා.අනෙක් කරුණ මේක අපි දෙන්නේ පරිත්‍යාගයක් විදිහටද? නැතිනම් ගෙවීමක් විදිහටද කියා මෙම යෝජනාවේ පැහැදිලි විය යුතුයි. මොන පදනමින්ද අපි 10%ක් ගෙවන්නේ කියන කාරණය පැහැදිලි විය යුතුයි.එයාලගෙන් සේවයක් ලබා ගන්නවට අපේ අරමුදලින් මොන පදනමකින්ද මුදල් ගෙවන්නේ කියලා මේ සභාවේ අපි පැහැදිලිව තීරණය කළ යුතුයි.නැත්නම් මේක ප්‍රශ්නයක් වෙන්න පුළුවන්.

**සභාපතිතුමා :-**
ඒක අපි කොමසාරිස්තුමාගේ අනුමැතිය අනුව කටයුතු කිරීමට තීරණය කරමු.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ 06.16 යෝජනාවයටතේ, සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥා පනත අනුව සුනඛ ලියාපදිංචි සහතිකය නිකුත් කිරීමේ දී ප්‍රාදේශීය සභා නිලධාරීන් විසින් ඉටු කරන කාර්ය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ නිලධාරීන්ගෙන් ඉටු කරවා ගෙන **ලියාපදිංචිය** සඳහා අය කරන රුපියල් 100.00 ක ගාස්තුවෙන් 10% ක් **සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය** වෙත ගෙවීමට වූ යෝජනාව පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතියට යටත්ව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**

සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමාගේ යෝජනාව.

**06.19. නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන්හිදී නගරයේ සියලුම වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි.**

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභාපතිතුමා :-**
මෙය කාලෝචිත ගැටළුවක්.ආගම අනුව නැතුව වුණත් මාසෙට දිනයක් වෙළඳසැල් වහනව නම් හොඳයි.නමුත් අපි හොයල බැලුව අපිට එහෙම තීරණයක් ගන්න පුළුවන්කමක් තියෙද කියලා.ඒ පිළිබඳව මන්ත්‍රීතුමන්ලාගේ අදහස් තියෙනවා නම් මේ වෙලාවේ ඉදිරිපත් කරන්න.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, කොළඹ සිට පැමිණෙන කොට ඇහැලියගොඩ නගර සිමාවට එනකොට, නගර සීමාව තුළ කඩවල් වහන එකම නගරය තමා ඇහැළියගොඩ නගරය.මේක ආලමික සංහිඳියාව පිළිබඳ ලොකු නිර්වචනයක්.මේක මුස්ලිම්, දෙළ සිංහල, බර්ගර් ඇතුළු සියලු දෙනා ම ඒකාබද්ධ වෙලා තමා මේ නගර සීමාව තුළ මේ දේ කරන්නේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව ඉදිරිපත් කරන්න මූලික හේතුව වුණේ, ඇහැලියගොඩ නගරයේ වෙළඳසැලවල සේවකයින් 1500ත් 2000ත් අතර ප්‍රමාණයක් සේවය කරනවා.එම සියලුදෙනාගේ ඉල්ලීම තිබුණා ඔවුන්ට නිවාඩු ගන්න එක දිනයක් ලබාදෙන්න කියලා.මොකද ඔවුන් නගරයේ කඩයක රැකියාවක් සඳහා පැමිණෙන විට උදේ පහට හයට එන්නේ.ඔවුන්ගේ රාජකාරිය ඉවර වෙන්නේ රාත්‍රී 12ට පමණ.ඔවුන් සත්‍ය වශයෙන්ම පැවසූ දෙයක් තමයි මන්ත්‍රීතුමා අපිට නාගන්න දවසක් නැහැ.හැමෝම දෛනික වැටුප් ලබන අය.ඔවුන්ට නිවාඩුවක් දාල නාන්න බැහැ.මේ ඉල්ලීම මීට වසර ගණනාවකට පෙර කරලා.2002.05.28 දින පැවති සභා රැස්වීමක අනුමත වෙලා තියෙනවා ඒක.පසුව 2002.07.27 වන දිනත් නැවතත් 2002.08.25වන දින කතා කරලා තියෙනවා.එහිදී ඔවුන් තීන්දු කරලා තියෙනවා සභාවේදී ඇහැලියගොඩ නගර සීමාවේ තිබෙන කඩවල සේවකයින්ට නිවාඩුවක් ලබාගන්න දිනයක් ලබාදෙන්න කියලා.ඒ අනුව ඔවුන් තෝරගත්ත දිනය තමයි හැමෝටම පහසු වෙන්න පොහොය දිනය.මෙය පන්සල් යාමටවත්,ආගමික කටයුත්තක් සඳහාත් නෙවෙයි.සියලුම වෙළඳසැල් හිමියන් එකතු වෙලා තීරණය කරපු මාසෙට එන නිශ්චිත දවසක් තමයි පෝය දිනය.හැම මාසෙකම පෝය දිනයක් එනවා.එම පෝය දිනයට මේ වෙළඳසැල් වසා තබමු කියා තමයි එකඟතාවය පැමිණ තිබෙන්නේ.ඒ අනුව අපි නැවතත් මේ සභාවට පැමිණි දින සිටම මාලින්ද මන්ත්‍රීතුමත් අපිත් නිතරම කතා කළා නැවතත් තැනින් තැන මෙමම කඩ විවෘත වෙනවා කියලා.ඒ සම්බන්ධව කතා කරන විට අපිට ලොකු පහසුවක් වුණා,ඇහැලියගොඩ නගරයේ තිබෙන ප්‍රධාන වෙළඳ සංගමය වන නව එක්සත් වෙළඳ සංගමයේ සභාපතිතුමා ඇතුලු නිලධාරී මණ්ඩලය අපිත් කැමතියි නැවතත් මේක සක්‍රිය කරලා දෙනවා නම් කියලා ඉල්ලීම් ලිපියක් ඉදිරිපත් කරා.එම නිසා මම නියෝජනය කරන්නේ වාමාංශික දේශපාලන පක්ෂයක්. සභාපතිතුමා ඇතුළු බහුතරයක් අය වාමාංශික දේශපාලනය නියෝජනය කරන අය.අපි අපේ කම්කරුවන් වෙනුවෙන් පෙනී සිටිනවා.ඒ සඳහා තමයි එදත් අපි 2002 වර්ෂයේදී සුනිල් කරුණාරත්න(හම්බන්තොට මන්ත්‍රීතුමා) මන්ත්‍රීතුමා, එදින සභාපතිවරයා ලෙස සිටියේ කේ.එල්.රත්නායක මැතිතුමා.උප සභාපතිවරයා ලෙස සිටියේ සදේව මැතිතුමා.ඔවුන් තීන්දු කළා,2002 සභාවේදී ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සන්ධානගත වෙලා මන්ත්‍රීවරුන් 4දෙනයි සිටියේ, සභාවේ තීරණය කරලා තිබුණා මෙම යෝජනාව ඉදිරියට ක්‍රියාත්මක කරමු කියලා.නැවතත් මෙම යෝජනාව ඉදිරිපත් කරන්න ප්‍රධානම හේතුව වුණේ, අපි නගර සංවර්ධන සැලැස්ම සකස් කරන්න ආරම්භක උත්සවයේදී ගරු සභාපතිතුමා,මම,මාලින්ද මන්ත්‍රීතුමා,වෙළඳ සංගමයේ නිලධාරී මණ්ඩලයත් සමඟ හමුවී කතා කළා,මොවුන්ට නිවාඩු ගන්න දිනයක් අපි යොදාගමු කියලා.එම නිසා මෙය ආගම සම්බන්ධ දෙයක් නෙවෙයි.මෙය හුදෙක්ම එම සේවකයින් හට නිවාඩුවක් ලබාගැනීමට.ඒ සඳහා නිශ්චිතව යොදා ගන්නා දිනය තමයි සෑම මසකම පොහොය දිනය.සභාවේ ඒකමතිකව මෙම යෝජනාව පිළිගනිමු.මේ යෝජනාවේ 99%ක්ම සියලුදෙනාම කැමතියි.ඔවුන්ටත් එම නිවාඩුව අවශ්‍යයි.එදිනට තමයි වෙළඳසැල් හිමියනුත් තමන්ගේ දරුවනුත් සමඟ නිවසේ ජීවිතය ගත කරන්නේ.මේ කතා කරන මට ඇහැලියගොඩ නගරයේ කඩයක් නැහැ.මාලින්ද මන්ත්‍රීතුමාටත් නැහැ.අපි වෙළඳාම් කරන අය නෙවෙයි. සද්භාවයෙන් එම කම්කරුවන්ට අවශ්‍ය නිවාඩුව ලබාගැනීම සඳහා මේ යෝජනාව ඉදිරිපත් කළේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,සියලුම ව්‍යාපාරික ප්‍රජාව ඒකාබද්ධව තමයි මෙම තීරණය අරන් තියෙන්නේ.සියලුම ජාතීන් නියෝජනය කරන ව්‍යාපාරිකයින් මෙම වෙළඳ සංගමය තුළ ඉන්නවා.එවන් පසුබිමක ආගමික සංහිඳියාවට හොඳ පාලමක් නිර්මාණය කරලා තියෙනවා ඇහැලියගොඩ නගරයේ.ගයාෂාන් මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාව ඉතාමත් වැදගත්.මෙය ක්‍රියාත්මක කරනවා නම්,පෙට්ටි කඩේ ඇතුළු සියලු වෙළඳසැල් වැහෙන්න ඕනේ.නීතිමය වශයෙන් වැසිය නොහැකි වෙළඳදසැල් තියෙනවා.ඒවා නැතුව සියලුම වෙළඳසැල් ඇත්ළත් කරලා තමා මේ තීරණය ගන්න ඕනේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඉතාමත් කාලෝචිත සහ වැදගත් යෝජනාවක් ගෙන ඒම සම්බන්ධයෙන් ගයාෂාන් මන්ත්‍රීතුමාට ස්තූතිවන්ත වෙනවා.මෙහි විශේෂත්වය වන්නේ,එදා අපේ සුනිල් කරුණාරත්න මන්ත්‍රීතුමා විපක්ෂයේ ඉඳන් මේ යෝජනාව ගෙනාවේ.එදා කේ.එල්.රත්නායක සභාපතිතුමා.එතුමා එක්සත් ජාතික පක්ෂයේ සභාපතිවරයා.සුනිල් කරුණාරත්න මන්ත්‍රීතුමා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරයා.ඒ කවුරු ගෙනාවත් එම යෝජනාව එදා ඇහැලියගොඩ නගරයට සුභදායී නිසා තමයි ආණ්ඩු පක්ෂයෙන් විපක්ෂයේ යෝජනාව පිළිඅරගෙන ක්‍රියාත්මක කළේ.එම යෝජනාව සේවකයින්ටත් අදාළයි.හාම්පුතුන්ටත් අදාළයි.අපි

දන්නවා අයිතිකරුවන්ටත් එම නිදහස අවශ්‍යයි.මෙය ආගමට සම්බන්ධ කාරණාවක් නෙවෙයි.මෙය සේවකයින්ටයි හාම්පුතුන්ටයි ලබාදෙන හොඳ අවස්ථාවක්.එක අවස්ථාවකදී අතුරලිය මන්ත්‍රීතුමා මතු කරන්න උත්සාහ කළේ,ෆාමසි වැනි අත්‍යවශ්‍ය සේවා ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කරන්න දෙන්න කියන එක.ඒ අස්සේ සමහර කඩ අරින්න පුළුවන්නේ.ඒවට මැදිහත් වෙලා ඒ කටයුතු කරන්න.මොකද මට මතකයි ජී.එල් කරුණාපාල සභාපතිතුමා, එක අවස්ථාවක ෆුඩ් සිටි, ප්‍රාදේශීය සභාවේ නිති රෙගුලාසි අදාළ නැ කියලා ඇරියා.හැබැයි අපි මොකක් ද කළේ සභාවේ කුණු ට්‍රැක්ටරය ගෙනිහින් හරස් කළා.එතකොට වහන්න සිද්ධ වුණා.අපි මේ තර්කයට යන්න කාරණා නෙමේ.සභාපතිතුමත් උත්සහ කළෙත් කඩයක් අරිනව නම් කාලීන අවශ්‍යතාවයක් කියලා ඔබතුමා හිතන්න පුළුවන්.2002 ගෙනා ඒ යෝජනාව අපි අඛණ්ඩව කරගෙන ආවා.මේක බෙදීමකට යන්න අවශ්‍ය කාරණා නෙමේ.ඔබතුමාටත් වෙළඳ ප්‍රජාවගේ වැඩි අවදානයක් යොමු වෙන්න ඇති.පෝය දවසේ මේ  කඩ ටික වහලා දෙන්න කියලා.මේක මේ අඛණ්ඩව ආපු කාරණාවක්නේ.අපේ ක්‍රියාවලියට විරුද්ධව කවුරු හරි ක්‍රියාත්මක වෙනව නම්, සභාපතිතුමාගේ බලතල ක්‍රියාත්මක කරනවා නම් අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා.එම නිසා සේවක මණ්ඩලයේත් අවශ්‍යතා වෙනුවෙන් ඒ යෝජනාව සඳහා සහයෝගය දක්වමු.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,පෝය කිවුවාම ආගම සම්බන්ධයකකුත් එනවා. අපිට අවශ්‍යනම් පුළුවන් නම් මාසෙට එක පෝයක් වගේම මාසෙට 10වෙනිදා එන්නෙත් එක දවසයි.මාසෙට 15 එන්නෙත් එක දවසයි.එමෙන්ම, නිවාඩු ලබාදෙනවා නම් මෙය ආගම පැත්තෙනුත් හොඳ කාරණයක්.පුද්ගලයෙක්ට සංස්කෘතික,ආගමික ජීවිතයක් අවශ්‍යයි.ඒවාට කාලය දෙන්න ඕනි.ගැටළුව නම්,අපේ ප්‍රාදේශිය සභාවේ ප්‍රතිපාදන තියෙනවාද එහෙම නීතියක් ගේන්න.ඒක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන වගන්තිත් සමඟ ගැටෙන ස්වභාවයක් තමයි තියෙන්නේ.අපිට එම නීතිය ගෙන ඒමේ හැකියාවක් තියෙද කියා සලකා බලමු කියා මම යෝජනා කරනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,සියලුදෙනාම ගෙනාපු යෝජනාව හොඳ තීරණයක්.නමුත් අපේ රණවීර මන්ත්‍රීතුමා පැවසූ පරිදි මම නොදන්න කාරණයක් අහන්නේ.සභාවක් ලෙස තීරණය කරන්න පුළුවන්කමක් තියෙනවාද .

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි,ගයාෂාන් මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා මේ යෝජනාව ගෙන ඒම සම්බන්ධයෙන්. සම්පූර්ණ බල ප්‍රදේශයේම කඩවල් වහන්නෙත් නැහැ.නගරයේ විතරයි වහන්නේ.සමහර කඩවල් වහන්නෙත් නැහැ.දිවයින පුරාම තිබෙන ආයතන ටික වහන්නෙත් නැහැ.මෙතුමා කිවුවා 2002-05-28 මේ යෝජනාව ගෙනාව කියලා.එය යෝජනාවක් විදිහට නෙවෙයි ආවේ.එහි තිබෙන්නේ,පෙත්සම් හා පැමිණිල්ලක් විදිහට තමයි තියෙන්නේ.ඒකේ තියෙන්නේ, “ඇහැලියගොඩ නගරයේ පසළොස්වක පොහොය දින වෙළඳසැල් වසා තබන ලෙස කර ඇති ඉල්ලීම් ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.” මෙය විධිමත්ව සම්මත කරගෙනත් නැහැ. පසුව හත්වෙනි මස ඇවිත් තිබෙනවා,මේකට ඇවිත් තියෙනවා.මේක සභාවට ඇවිත් තියෙනවා තිලක් මන්ත්‍රීතුමාගෙන් කල් දී ඇති යෝජනාවක් විදිහට ඇවිත් තියෙන්නේ.එය සභාවට ඉදිරිපත් වෙලා තිබෙනවා. “සුළුවෙන් ව්‍යාපාරයක් පවත්වාගෙන යන අතර අධ්‍යාපනය ලබන දරුවන් සිටින අතර, පොහොය දිනට වෙළඳසැල් වසා තැබීම නිසා විශාල පාඩුවක් සිදුවේ.එමනිසා පොහොය දිනවල වෙළඳසැල් විවෘතව තබා ගැනීමට අවසර දෙන ලෙස ලියනආරච්චි යන අයගේ ලිපිය ඉදිරිපත් කරන ලදී.” කියලා මේ විදිහට, පෝය දිනට කඩවල් වහන්න ආපු එකේ, ඒකෙන් පීඩාවට පත්වන පාර්ශවය වෙනුවෙන් එතුමා කතා කරලා තියෙනවා.ඒ වගේ අවස්ථා කිපයකම කතා කරලා තියෙනවා.මම හොයලා බැලුවා, ඇත්තට ම  ප්‍රාදේශිය සභා පනතේ කොතනකවත් කඩ සාප්පු වසා තැබීම පිළිබඳව නීතිමය ප්‍රතිපාදනයක් නැහැ. පුළුවන් නම් හොඳයි. මම කියන්නේ පෝයට කඩවල් වහන එක හොඳයි.අපිට වුණත් සභාවක් ලෙස නගරය ශුද්ද පවිත්‍ර කරගැනීම් වැනි කටයුතු සඳහා හොඳයි.අපි පසුගිය කාලයේ ශ්‍රමදානයත් සිදුජකළේ පෝය දිනයේ.ඒක අපිට ලේසියි.නමුත් ඒ සඳහා අපිට තිබෙන නීතිමය ප්‍රතිපාදනය පිළිබඳව හොඳ අවබෝධයෙන් සිදුකල යුතුයි.නැත්නම් මේක ප්‍රාෙද්ශිය සභා බලතල ඉක්මවා යනවා.මේක පනතේ කොහෙවත් සඳහනක් නැ.කවුරුවත් පෞද්ගලිකව ගත යුතු නැහැ. මේක මේ ප්‍රාදේශිය සභා පනතේ කොතනකවත් නැහැ.ඔබතුමාලගෙ පාර්ශවයෙන් ම කිවුවා, මේකට එකඟතාවක් නැති අයවබලය පාවිච්චි කරලා බලහත්කාරයෙන්, අත්තනෝමතිකව බලය පාවිච්චි කරලා ඇත්තටම කඩ වැස්සෙව්වා කියලා.නීති රීති සම්බන්ධව ජනතාව ඒ දවස්වල නොදැනුවත් වුණාට, දැන් මිනිස්සු ගොඩක් දැනුවත්.මේ සභා තීරණය ගත්තොත්, අපිට මූලික අයිතිවාසිකම් උල්ලංඝණය වීම සම්බන්ධයෙන් අපිට ලොකු ගැටළුවකට මුහුණ දෙන්න සිද්ධ වෙනවා.ඒ නිසා මම කියන්නේ,අපේ පනත තියෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට යටින්.ඒ නිසා අපිට සියල්ල කරන්න පුළුවන් කියලා එකක් නැහැ. ඔබතුමා මේ බල ප්‍රදේශයේ සිටින ප්‍රධානියා තමයි.අපිට තිබෙනවා සීමාවක්.අපිට ඕනි ඕනි පැතිවලට යන්න බැහැ. අපිට සීමාවක් තියෙනවා.මේ සීමාවේ කොහෙවත් නැහැ බල ප්‍රදේශයේ  සියලුම වෙළඳසැල්  තෝරා ගත් දිනයක හරි  වෙන දිනයක වහන්න, එහෙම නීතියක් නැ.මම හොයලා බැලුවා එහෙම නීතියක් තියෙන්නේ කොහෙද කියලා. එහෙම නීතියක් තියෙනවා 1954 අංක 19 සාප්පු හා කාර්යාල සේවක පනතේ.ඒකෙ බලය තියෙන්නේ ඔබතුමාටවත්සභාවටවත් නෙවෙයි.ඒකෙ බලය තියෙන්නේ කම්කරු කොමසාරිස්වරයාටයි,ඒ අමාත්‍යාංශයට තමයි ඒකෙ බලය තියෙන්නේ.අපි නිකන් ඉල්ලන් කන වැඩක් මේක.ඒ දවස්වල ජනතාව විරුද්ධව ඉදිරිපත් නොවුනට ,දැන් ජනතාව දැනුවත්. දැනුත් මෙතුමන්ලා කිවුවා මේකට එකඟ නොවන අයට බලහත්කාරයෙන් සභාව මැදිහත් වෙලා කරවන්න කියලා.මේ දැන් කිවුවා.ඒ දවස්වල ෆුඩ් සිටි වෙළඳසැල ඉදිරිපිට කුණු ට්‍රැක්ටර් දැම්ම වගේ නෙවෙයි,අපිට ලොකු ප්‍රශ්නකට සභාව ලෙස මුහුණ දීමට සිදු වෙනවා.මේ යෝජනාව හොඳයි.මේක ඇත්තටම අපි අදාළ කරගන්න ඕනි නැහැ.හැමෝම එකඟතාවයෙන්,වෙළඳ සංගම් එකඟතාවයෙන්, ව්‍යාපාරික එකඟතාවයෙන් කරනවා නම්,මේ යෝජනාව හොඳයි.තමන්ට තමන්ගේ කඩය වහන්න කිසිම බාධාවක් නැහැ.ඒකට පෝය දිනයක් විය හැකියි.වෙන දිනයක් විය හැකියි.නමුත් ඒකට සභාව මැදිහත් වෙන්න බැහැ. වෙළඳ සංගමය විදිහට තීරණයක් අරන් ඔවුන් කඩ වහනව නම්,ඒක ගැටළුවක් නැහැ.ඒකට අපි මැදිහත් වෙලා ,බලහත්කාරකම් කරලා,කරන්න බැහැ.ඒ දේශපාලනය දැන් පහු වෙලා තියෙන්නේ.අපිට අනුන්ගේ වැඩ කරන්න බැහැ.ඒ දවස්වල මේක විධිමත්ව සම්මත කරලා නැහැ.ඒ කියන්නේ ඒ දවස්වලත් ඒකට විරුද්ධ වෙලා

ජනතාව.ඒ කාලෙත් මේකට විරුද්ධව ව්‍යාපාරික ප්‍රජාව විරෝධතා ඉදිරිපත් කරලා තියෙනවා.මේ යෝජනාව හොඳයි.මේකට ව්‍යාපාරික ප්‍රජාව නෙමේ පාරිභෝගිකයන් පවා නඩු දාන්න පුළුවන්.අපි හඳන්නේ සංස්කෘතික මිනිසෙක්.නිවාඩුවක් ගන්න එක නෙමෙයි අපිට ගැටළුව.එම නිසා අපි ප්‍රතිපත්තිමය තීරණයක් ගනිද්දී අපි පොදුවේ මිනිස්සු දිහා බලන්න ඕනි.එක්කෙනෙක් දෙන්නෙක් දිහා බලලා වැඩක් නැහැ.එම නිසා අපි මේකට මැදිහත් නොවී ඉමු.එම ඉල්ලීම සිදුකරන නව වෙළඳ සංගමය සමඟත් කථා කළා.අපි ඔවුන් සමඟත් කථා කළා.අපි හිතුවේ ඒ සම්බන්ධව ඔබතුමන්ලටත් කියලා කියයි කියලා.ඔවුන් අන්තිමට කිවුවේ,අපි එහෙනම් අපි මැදිහත් වෙලා කරගන්නම් කියලා.අපි ඊයෙ හවස ප්‍රසාරා එකේ රැස් වුණේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,වෙළඳ සංගමය අපිට එකක් කියලා.ඔබතුමන්ලට තව එකක් කියනවා.මට මේ කඩ වැහුවත් එකයි නැතත් එකයි.මට මේකෙ කඩ නැහැ.අපි වෙළඳාම් කරන්නේ නැහැ.2025.06.28 එයාල අයවැයට දෙන්න කියලා යෝජනාවක් දීල තියෙනවා.ඒකෙත් තියෙනවා කඩ වහන්න කියලා.පසුව 2026.02.11 ඔබතුමාට ඉල්ලීමක් කරලා ලිපියක් දාලා මටත් පිටපතක් දුන්නා,කඩ වහන්න කියලා.එහෙම එක වචනෙක ඉන්න බැරිනම් මට වැඩක් කරන්න බැහැ. කියපු කෙනා කවුද කියලා කියන්න.ඒකයි මම අහන්නේ කෙලින් කිවුව කෙනා ගැන.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
මට කෙනාගේ නම නම් මතක නැහැ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේ ලිපියේ වෙළඳ සංගමයේ සභාපති,ලේකම් දෙදෙනාම අත්සන් කරලා තිබෙනවා. එයාලට වගකීමක් ගන්න බැරිනම් එක වචනෙක ඉන්න බැරිනම් මට වැඩක් කරන්න උවමනාවක් නැහැ.මේ සභාවේ ගනුදෙනු කරන්නෙත් නැහැ.ඒකයි මම අහන්නේ කෙළින් කිවුව කෙනා ගැන.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,උප සභාපතිතුමා කිවුවා පනතේ මුකුත් නැහැ කියලා.1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේතියෙනවා,පරිපාලනය සහ සංවර්ධන කටයුතු වලට අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලියේදී ජනතාවට පළාත් මට්ටමින් ඵලදායී ලෙස සහභාගී වීම සඳහා වැඩි අවස්ථා සලසා දීමේ අරමුණ ඇතිව ප්‍රාදේශිය සභා පිහිටුවීම සඳහාද එම සභාවට බලතල කාර්යයන් සහ කර්තව්‍යයන් නිශ්චය කිරිම සඳහා ද ඒ සම්බන්ධ වූ සියලු කරුණු සඳහා විධිවිධාන සැලසීම පිණිස ද වූ පනතකි.එවිට මේ පනතේ පැහැදිලිව තියෙනවා පරිපාලනය කියලා.මේකෙ තියෙනවා පරිපාලනය කියලා වචනයක්.මේ යෝජනාව ගයාෂාන් මන්ත්‍රීතුමා ගේන්නේ නව එක්සත් වෙළඳ සංගමයේ,ඉල්ලීමක් අනුව.උපසභාපතිට කියනවා මේක බැහැයි කියලා.මෙතුමාගෙන් කවුද කිවුවේ කියල ඇහුවාම නම කියන්න බැහැලු. අධිකරණයේදීත් ලිඛිත සාක්ෂි තමයි වැදගත් වෙන්නේ.(ඝෝෂාව) උපසභාපතිතුමා කියන්නේ සභාපතිතුමා නැති වෙලාවට එම තනතුර දරණ පුද්ගලයා. එමනිසා ඉතාම කරුණාවෙන් එවැනි යෝජනා ගේන කොට එවකට හිටපු කේ.එල් රත්නායක මැතිතුමා සභාපති ධූරයේ වාඩි වෙනවා.විපක්ෂයේ සුනිල් කරුණාරත්න මන්ත්‍රීවරයා මෙම යෝජනාව ගෙනාවම ඒ සාකච්ඡාවේදී තීන්දු කරනවා මේ කඩවල් වහනවා කියන එක. එවැනි යෝජනාවක් තමයි මේ ක්‍රියාත්මක වෙලා තියෙන්නේ.එතුමා කියන තර්ක විතර්කය අනුව මම දන්නේ නැහැ පළාත් පාලනය කියන පනතේ පරිපාලනය කියන කාරණයේ අර්ථ විග්‍රහයට පරිපාලනය නෙමේ ද අයිති වෙන්නේ.ඒ නිසා මේක වෙනස් කරගන්න පුළුවන් පරිපාලනයසඳහා අතුරු ව්‍යවස්ථාවක් නිර්මාණය කරගන්නවා ඒ ඒ බල ප්‍රදේශවලට ඒ ඒ පළාත් පාලන ආයතනවලට සුදුසු පරිදි.ඒ සඳහා අපි අතුරු ව්‍යවස්තාවකුත් අපි සම්පාදනය කළා ඉඩම් අයිතිය සම්බන්ධව.එම නිසා මේවා අපිට කැඟහලා තර්ක විතර්ක කිරීම සුදුසු නැහැ. කවුරු හරි හොඳ දෙයක් කරන කොට එහෙම වෙනවා.හැබැයි මේ යෝජනාව රණවීර මන්ත්‍රීතුමා කිවුවා වගේ එක පැත්තකින් පෝය කියන අර්ථය ගේන්න එපා මුස්ලිම් , දමිළ ජනතාවත් ඉන්නවා.මෙහෙ වැඩිපුර කඩ තියෙන්නේ මුස්ලිම් ප්‍රජාවගේ.ඒ නිසා අපි මේකට වාද විවාද ඇති කරන් නැතුව අපි තීරණයක් ගමු. .....වෙළඳ සංගමය ගයාෂාන් මන්ත්‍රිතුමාට කියනවා එකක්. ඔබතුමාට තව එකක් කියනවා.ලිඛිත සාක්ෂියක් ගයාෂාන් මන්ත්‍රීතුමාට දෙනවා.උපසභාපතිතුමාට වාචික සාක්ෂියක් දෙනවා.අපිට ඒක පිළිගන්න බැරි නිසා ඔබතුමාගේ නායකත්වයෙන්,අපි වෙළඳ සංගමය කැඳවලා,තීන්දුවක් ගත යුතුයි පෝයට වහනවද නැද්ද කියන එක පිළිබඳව. ඒ යෝජනාව ගෙන ඒම පිළිබඳව එදා ආණ්ඩු පක්ෂයයි විපක්ෂයයි දෙක එකතු වෙලා යෝජනාවක් ගෙනාවා. මෙදත් ඒ විදිහටම ඔබතුමා සභාපති ධූරයේ ඉන්නවා .මෙතුමා විපක්ෂ ධූරයේ ඉන්නවා. එම නිසා ඒ කාරණය ඉටුකරන්න කියලා ඉල්ලා සිටිනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මේක එච්චර ලොකුවට වටයක් යා යුතු නැහැ.මම අහන්නේ අපිට මේ පනතේ මොකක්ද තියෙන නීතිමය ප්‍රතිපාදනය කඩවල් වහන්න.මම හිතනවා හැමෝම අතේ මේ පනත තියෙනවා කියලා. මේකෙ එහෙම එකක් නැහැ.මේක තියෙන්නේ සාප්පු හා කාර්යාල සේවක පනතේ.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,පනතේ නැති ටිකනේ අතුරු ව්‍යවස්ථාවෙන් කරන්නේ.

**සභාපතිතුමා :-**
ඇත්තට ම මේක හොඳ යෝජනාවක්.ඇත්තටම කවුරුවත් අකමැති නැහැ මෙම කඩ සාප්පු වහනවට.මේක සාමාන්‍යයන් නඩුවක් දැම්මොත්, මාත් හොයලා බැලුවා.මෙහි අපිට වහන්න අයිතියක් නැහැ.අපි ඔවුන්ට ඊයේ පැහැදිලි කරලා කිවුවා.ඔබතුමන්ලා කරගෙන යන්න.මේක අයිති වෙළඳ ව්‍යාපාරික සංගමයක්

තියෙනවානේ,අපිත් එන්නම් එදාට වහන්නේ නැත්නම් කතා කරන්න.සමහර ඒවා තියෙනවානේ පදික වෙළඳාම් කරනවා නම් අපිට ඒක නවත්වන්න පුළුවන්නේ.ඒ වැඩේ අපි කරන්නම්.මේකට මං අත්සන් කළොත් ලොකු ගැටළු රාශියක් තියෙනවා.ඇත්තටම මෙහි මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම පිළිබඳව මාත් බැලුවා.එහෙම කවුරුහරි නඩුවක් දැම්මොත් එහෙම අපි ඔක්කොටම උසාවි යන්න වෙනවා.ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් තහවුරු කර ඇති ඕනෑම නීතියානුකූල වෘත්තියක හෝ වෙළඳාමක නිරත වීමේ අයිතිය,අපිට උඩින් තියෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව.එහෙම වුණොත් සභාවේ බලතල නැතිව .දැන් මිනිස්සු දැනුවත්. මම කියන්නේ කවුරුවත් බෙදීමකට නෙවෙයි.අපිත් එම වෙළඳ සංගමයටත් උදවු කරලා,වෙළඳ සංගමයේ තීරණයත් අරගෙන ,ඒ අනුව කටයුතු කරන එක තමයි මගේ පෞද්ගලික මතය.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඇහැලියගොඩ පෝය දිනයේ මෙම කඩ වහනව කියන එක පිළිබඳව අපි නගරයට එදිනට ආවත් පුදුමාකාර සතුටක් තියෙනවා.ඒක පැහැදිලියි.මම හිතන්නේ අපිට සභාවක් ලෙස බලතලයක් නැත්නම්,එක්සත් වෙළඳ සංගමය බලවත් සංගමයක්නේ.එම නිසා අපි එතුමන්ලාට කිව්වා නම්,ඔයාලම නායකත්වය අරන් ඔයාලම කර ගන්න කියලා ඔවුන්ට බලය දෙමු.අපි නැති ප්‍රශ්නයක් දාගන්න ඕනි නැහැනේ.(ඝෝෂාව)

**සභාපතිතුමා :-**
අපි ඊයේ සාකච්ඡාවෙදි කලෙත් ඒක තමයි.ඔවුන් කිව්වා එවිට පදික වෙළඳුන් පිළිබඳව.අපි කිව්වා ඒක අපි කරලා දෙන්නම් කියලා. ඒ කියන්නේ නීත්‍යානුකූලව නැතුව එදිනෙදා වෙළඳාම් කරන අය.ඒක අපිට පුළුවන් නවත්වලා දෙන්න.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම කිවුවේ පරිපාලනය කිරීම සඳහා නීතියක් හදා ගැනීමේ අයිතිය අපිට තියෙනවා.ඒක තමයි මම පැහැදිලි කළේ.නැත්නම් මානව හිමිකම් ගියොත් අපිට ගැටළුවක් තමයි.

**සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,පෝය දිනයට නිවාඩුවක් ගන්න එක වැරදි වුණාට, මම බෞද්ධයෙක් ලෙස මම කැමතියි පෝය දිනයට කඩවල් ටික වහලා තියෙනවා නම්. හැබැයි එහි දෙපැත්තක් තියෙනවා.එකක් තමයි අපේ ගාමන්ට් යන අපේ සහෝදර සහෝදරියන් ඉන්නවා.ඔවුන්ට නිවාඩුවක් හම්බවෙන්නේ, පෝය දිනයට වගේ විතරයි. මම කියන්න යන්නේ මගේ පුද්ගලික අත්දැකීම් එකක් තමයි මම මුල්ම රැකියා ඇහැලියගොඩ කාගිල් ආයතනයේ සිදුකරන විට. 2022 කිවුවට මට මතක 2005 හෝ 2006 වසරේ ඇහැලියගොඩ කාගිල්ස් එක වහන්න කිවුවට පස්සේ මාස තුනක් විවෘත කළා.කුණු ට්‍රැක්ටර් 03ක් විතර ගිහින් දැම්මා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
එය නිවැරදි කරන්න, කුණු ට්‍රැක්ටර් කාගිල් ඉදිරිපිට බ්‍රේක් ඩවුන් වුණා කියලා. (ඝෝෂාව)

**සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,පසුව කාගිල්ස් එකේ ඉහළ කළමනාකාරීත්වය ගත් තීරණය තමයි,මෙයට විරුද්ධව නීතිමය ක්‍රියාමාර්ග ගන්නවා කියලා.පසුව ඔවුන් තීරණය කළා ෆාමසි අරින්න පුළුවන් කියලා මේකෙ තිබුණ නිසා, ෆුඩ් සිටිය ඇතුළේ ෆාමසිය තියෙන නිසා, ඉස්සර දොර ඇරල ලයිට් ඕෆ් කරලා ෆාමසි ඇරියා.නමුත් මුදල් අයකැමිලා දෙන්නෙකුත් ඉන්නවා. ඔවුන් නීතිය හිලෙන් ප්‍රයෝජන අරගෙන තමයි මේ කටයුතු කරන්නේ.
අනෙක් කරුණ මම දැනට සිදු කරන්නේ මාළු වෙළඳාම කඩුවෙල ප්‍රදේශයේ.අපිට කඩුවෙල මහ නගර සභාවෙන් ලියුමක් ආවා,සියළුම මස් මාංශ වෙළඳසැල් සහ සව ඝාතකාගාර වසා තැබිය යුතුයි කියලා. එවිට මම සොයා බැලුවා.නමුත් මේ පිළිබඳව. නගර සභාවට කිසිම බලයක් නැහැ පෝය දිනයට මාළු කඩ වසා තබන්න කියන්න. පසුව මම කඩුවෙල නගර සභාවට ලිඛිතව ඉල්ලීමක් ඉදිරිපත් කළා,මට මේ සම්බන්ධයෙන් ගැටළුවක් තියෙනවා,මම නීතිය පැත්තට යන්නදඔබතුමන්ලා මට උපදෙස් ලබා දෙනවද කියලා.එදා සිට කඩුවෙල මහ නගර සභාවෙන් අපිට ලිවුම් එවන්නේ,අර කලින් ආපු විදිහට ගව ඝාතකාගාර සහ මස් මාංශ වෙළඳසැල් වසා තබන ලෙස නෙවෙයි.වසා තබන ලෙස ඉල්ලීමක් කරනවා කියලා.එම නිසා ඔවුන්ට මගෙන් ලිඛිත ඉල්ලීමක් විතරයි කරන්න පුළුවන්. නියෝගයක් දෙන්න කාටවත් බැහැ.මස් පුළුවන්.ඒක අමාත්‍යාංශයෙන් ලංකාවටම ගෙනාපු නීතියක්.එම නිසා පෝය දිනයට කඩවල් වහන්න කියලා නීතියක් ගෙනාවොත් ඇත්තටම අපිට ගැටළුවක් වෙනවා. මම හිතන්නේ මීට වඩා ලොකු සාකච්ඡාවකට යන්න වෙනවා මේ වගේ තීරණයක් ගන්නවා නම්.

**සභික පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,පනතේ මෙම වෙළඳසැල් වැසීම පිළිබඳව අපිට අයිතියක් නැත්නම්, ඒ එක කාරණයක් අනෙක් කරුණ මෙම වෙළඳසැල් වැසීම තුළින් ප්‍රාදේශයට ගලා එන ආදායමෙනුත් යම්කිසි කොටසක් නැතිවෙනවා. අවිස්සාවේල්ල නගරයේ පෝයට කඩ වහන්නේ නැහැ.කුරුවිට පැත්තෙත් නැහැ.එවිට මේ පැමිණෙන පාරිභෝගිකයනුත් අනෙක් පැතිවලට ඇදී යනවා.මම දැක තිබෙනවා කැමැත්තෙන් කඩ වහන අයත් සිටිනවා.එම නිසා මම තේරුම්ගත් කාරණය තමයි කැමති කෙනෙක් අරින්න.කැමති කෙනෙක් වහන්න කියලා මෙය වෙළඳ සංගමයටම භාරදිය යුතුයි කියලා.

**සභික ඩබ්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපේ සංචාරක වෙළඳාම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා 03ක් දාල තියෙනවා. නමුත් එම අතුරු ව්‍යවස්ථා වලත් මේ වගේ දෙයක් සඳහන් වෙලා නැහැ.ගැසට් පත්‍රයේ ඉල්ලුම් පත්‍රය තියෙනවා. එහි නීතියටම යනවා නම් හොඳයි කියලා මම යෝජනා කරනවා. .1500 ක් වගේ සේවක පිරිසකට නිවාඩු නොදී ඉන්න බෑ.කම්කරුවන් සඳහා සතියකට දින 1 ½ක් නිවාඩු ලබාදිය යුතුයි.එම නිවාඩු නොදෙන එක කම්කරු

නීතිය අනුවත් එතන ගැටළුවක් තිබෙනවා.අපිට මැදිහත් වෙන්නත් බැහැ ඒ සඳහා.එම නිසා මේ සම්බන්ධයෙන් අපට ප්‍රතිපාදනත් නොමැති නිසා යම් එකඟතාවයකින් තීරණයක් ගමු කියා මම යෝජනා කරනවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම බලාපොරොත්තු වෙන්නේ නැහැ වෙළඳ සංගමය කුමන මතයක සිටිනවාද යන්න පිළිබඳව මෙහිදී සාකච්ඡා කරන්න.නමුත් ගයේෂාන් මන්ත්‍රීතුමා නගරයේ තිබෙන අපි අවධානයට ලක් නොකරපු කාරණයක් පිළිබඳව අවධානයට ලක් කරලා තිබෙනවා.ඒ සඳහා ගරු මන්ත්‍රීතුමන්ලාගේ දැනුම් ස්වභාවය අනුව විවිධ තර්ක ටිකක් පැමිණියා.අපිට තේරුන විදිහට උපසභාපතිතුමා කිවුවා මෙය සිදුකරන්න බැහැ,අපිට බලය නැහැ කියලා.නදුන් මන්ත්‍රීතුමා කිවුවා නැහැ අපි කැමතියි.නමුත් බලය නැහැ කියලා.නමුත් අපි විශ්වාස කරන්නේ මෙම බලය කියන කාරණය අපිට අධිකාරිමය බලය තියෙනවා.නමුත් අපේ පැරණි නායකයින් එකතු වී සිදු කළේ, අධිකරී බලයෙන් නොවෙයි.ඒක අපි පැහැදිලි කර ගත යුතුයි.අපි ඒ ජනතාව විසින් ලබාදුන් අනුහස් බලයෙන් තමයි මේ  කාර්යය හොඳයි කියලා කළේ.1954 අංක 19 දරණ  සාප්පු හා සේවක පනතේ තියෙනවා පෝය දවසේ සේවකයින්ට නිවාඩු දෙන්න ඕනේ කියලා.ඒකෙන් බලා පොරොත්තු වෙන්නේ පවුලේ අය අතර සමිපතා ඇති කරන්න.සේවකයින්ගේ කාර්යක්ෂමතාවය වැඩි කර ගැනීමට.මුත් මෙහිදී අපි බලාපොරොත්තු වෙනවා,මේ ප්‍රදේශයේ ජනතාවට නායකත්වයක් ලබාදෙන ආයතනයක් ලෙස,අපිට යම්කිසි බලපෑමක් සිදුකරන්න පුළුවන්ද කියලා.අපේ පනතේ සඳහනක් නැහැ.පනතේ නැති වුණාට සමාජයට නායකත්වයක් ලබාදෙන ආයතනයක් ලෙස අපිට යම් කිසි බලපෑමක් සිදු කරන්න පුළුවන්.එම සේවකයින්ට, ආයතනවලට,නැතිනම් ජනතාවට ආගමික,සංස්කෘතික,සමාජීය ලෙස එකතු වෙලා එකඟතාවයෙන් මේ දෙය කරන්න පුළුවන් නම්,එහි තියෙන වටිනාකමත් මේ සභාව තුළ සාකච්ඡා කරන්න පුළුවන්.අපේ අදහස තමයි මේක.එම සාකච්ඡාව ආරම්භ කරන්න.මෙම යෝජනාව අපි සභාවේ සම්මත කර ගෙන,අපි වෙළඳ සංගමයත්,ජනතාව හා පාරිභෝගිකයින් සමඟ සාකච්ඡා කරලා අපිටත් දෙන්න පුළුවන් නම් නිවැරදි අදහසක්,මෙයයි අපි අපේක්ෂා කරන්නේ සභාවක් විදිහට ඔබතුමාගේ නායකත්වයෙන් අපි එම පාර්ශවයන් සමඟ සාකච්ඡා කරමු.එම නිසා මම විශ්වාස කරන්නේ මෙම යෝජනාව හොඳයි.මේ යෝජනාව සම්මත කරගෙන ඉදිරියට ගෙනියමු කියන අදහස මේ වෙලාවේදී ඉදිරිපත් කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ජඅපි සැම විටම අලියගේ තරම අලියා දන්නේ නැහැ කියනව වගේ,මෙම ප්‍රාදේශිය සභා පනත බොහොම බලගතු පාර්ලිමේන්තුවේ පනතකින් සම්මත වූ පනතක්.ඒ අනුව ඔබතුමාට පැවරිලා තියෙන්නේ බොහොම අසීමිත බලයක්.සමහර තැන්වලදී ඒ ඒ පුද්ගලයින්,තම තමන්ගේ තරාතිරම,පවුල් පසුබිම ,අධ්‍යාපන මට්ටම, විය හැකියි ඒ සියල්ලක්ම ඒකරාශී කරගෙන තමයි, යම් යම් කාරණා වලට මුහුණ දෙන්නේ.මම මුලින්ම දැනගන්න කැමතියි ඔබතුමාගෙන්,අපි මේ වෙළඳ සංගමය ගැන තමයි කතා කළේ. ඊයේ ඔබතුමා සහ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීතුමන්ලා සහභාගී වුණාද මම දන්නේ නැහැ, ඒකෙ තොරතුළුරවත් මම දන්නේ නෑ මොකද වුණේ කියලා.ඔබතුමාට වෙළඳ සංගමයේ සභාපති හරි උපසභාපති හරි භාණ්ඩාගාරික හරි එයාල කිවුවා නම් අපිට පෝය දවසේ කඩවල් වහන්න එපා,කියන යෝජනාව ගෙනාවා නම් අපිට මේ කතාව මෙතනින් ඉවර කරන්න තිබුණා.ඒක දන්නේ ඔබතුමා තමයි.නමුත් එයාලගේ අදහසක් ආවානම් ඔබතුමාට අනේ ගරු සභාපතිතුමා අපේ සේවකයින්ට, කාර්ය මණ්ඩලයට,නාගන්න,ගමනක් යන්න එක දවසක් අපට අවශ්‍යායි කියලා සද්භාවයෙන් ඉල්ලීමක් කළානම්,අපි මේක ඉදිරියට යමු.ඒ නිසා අපි තර්ක විතර්ක දාල මෙහෙම කතා කරලා වැඩක් නැහැ.මේ සභාව කියන්නේ උත්තරීතර දෙයක්.එම නිසා සැම විටම මෙම පනතේ තියෙන බලය,සභාපතිතුමාට තියෙන බලය හැල්ලු කරගන්න එපා.අපිට බලය නැහැ කියලා අපි ඊර්ශ්‍යායා කරන්නේ නැහැ.හැබැයි මේ බලය පාවිච්චි කරන්න.ඒ බලය භාවිතා කරලා ප්‍රදේශයේ ජනතාවගේ සුභ සිද්ධිය වෙනුවෙන් ක්‍රියා කරන්න.එම නිසා මේ වෙළඳ සංගමයත් සමඟ කතා කරලා ඔබතුමා තීන්දුවක් දුන්නා නම් ඔබතුමා එය අපිට ප්‍රසිද්ධියේ කියන්න.අපේ උපසභාපතිතුමා කියන්නේ මේ පනත් රීති ඔක්කොම කට පාඩම් කෙනෙක්.නමුත් මෙය කියපු කෙනා මතක නැහැලු. විවෘත ව කතා කරමු .කාලය තවත් නාස්ති නොකර.අපි විවෘතව කතා කරමු.බොහොම හදවතින් ම කියමු සභාපතිතුමනි.ඔබතුමා මේකට අනපනත් අරව මේවා තියෙනවා කියලා කාලය නාස්ති කරන්න ඒපා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම කලින් කතාවෙදිත් කිවුවා මේ යෝජනාව හොඳයි.අපිට ශ්‍රමදාන වැඩසටහනක් වුණත් සිදු කරන්න අවස්ථාවක් ලැබෙනවා එම දිනයට.අපි පෝය දවස් දෙකක ශ්‍රමදාන කළා.නමුත් මම මේ කියන්නේ අපිට බලයක් නැහැ.ඒ නිසා මේ යෝජනාව මෙම න්‍යාය පත්‍රයට දාපු එකම වැරදියි.රීති වල තියෙනවා අපේ විෂය පථයට අදාළ කරුණක් තමයි න්‍යාය පත්‍රයට දාන්න අවශ්‍යා.කලින් හිටපු සභාපතිවරු එක්ක ගත්විට ඔබතුමා බොහොම හොඳයි.මම බොහොම කරුණාවෙන් ඉල්ලා සිටිනවා, ඒක අවස්ථාවක් තියෙනවා, මේ යෝජනාව කරපු මන්ත්‍රීතුමාට මේ යෝජනාව ඉල්ලා අස්කර ගන්න පුළුවන්.ඒ ඒකක්.ඒ නිසා මම කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තියෙන්නේ අපිට වඩා ඉහළින්.අපේ පනතේ තියෙන සීමාව තමයි මේක.අපිට ඔහේ දුවන්න බෑ.මෙහි කිසිම වගන්තියක් නැහැ අපිට කඩ සාප්පු වහන්න.සාප්පු හා කාර්යාල සේවක පනතේ විතරමයි තියෙන්නේ.ඒකෙ බලය තියෙන්නේ කම්කරු කොමසාරිස්වරයටයි අමාත්‍යවරයටයි.ඒ නිසා බොහොම කරුණාවෙන් මම කියා සිටින්නේ නිශ්චිතවම මෙම  නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන්හිදී නගරයේ සියලුම වෙළඳසැල් වසා තැබීමට ගෙන ආ යෝජනා සඳහා මම එකඟ නැහැ.එතුමාට අවස්ථාව තියෙනවා  ඒම යෝජනාව ඉල්ලා අස්කර ගන්න.ඉල්ලා අස් කරගත් විට අපිට පුළුවන් මේ යන ආකාරයට කුමක් හෝ විදිහක් තියෙනනේ.ඒකට සභාව මැදිහත් වෙලා, අපිට බෑ බලෙන් කඩවල් වහන්න.කොහොමද අපි කරන්නේ?වෙළඳ සංගමය ඒකඟ වෙලා කරනව නම් ඒහෙම ප්‍රශ්නයක් නෑ.එහැබැයි ඒහෙමයි කියලා කවුරු හරි කඩ ඇරියොත් ඒහෙම, ඇත්තටම මේ යෝජනාව දාන ඒකෙන් බලාපොරොත්තුව මොකක්ද?අපි සභාව මැදිහත් වෙලා වහන් නැති කඩවල් ටික වස්සවන ඒක.ඒක අපි බලයක් නැත්නම් කොහොමද කරන්නේ.ඒහෙම වැහුවොත් වෙළෙන්දට විතරක් නෙමෙයි පාරිශෝගිකයටත් අපිට විරුද්ධව මුලික අයිතිවාසිකම් නඩුවක් දාන්න පුළුවන්.ඒ නිසා මම කියන්නේ වෙළඳ සංගමය කැමති නම්, වෙළඳ සංගම්වලට නැති ව්‍යාපාරිකයොත් ඉන්නවා මේකෙ.ඒ අයත් ඒකඟ කරගෙන ඒ ගොල්ලෝ පොදුවේ ඒ වැඩේ කරනව නම් අපිට කිසි ප්‍රශ්නයක් නෑ.මේක අපිට අයිතියක් නෑ.සභාවට කිසිම බලයක් නෑ.ඒක වගන්තියක්

පෙන්නන්න. මේකෙ නෑ.ඕනම මන්ත්‍රීවරයෙකුට පුළුවන් මේකෙ රීති අනුව යෝජනාව ඉල්ලා අස් කර ගන්න.අපි ඇත්තටම බෙදීමකට යන්න ඕන් නෑ.මම එතුමගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.අපිත් කැමති නෑ.එතකොට ඔබතුමාලටත් පුළුවන් එළියේ ගිහින් කතා කරන්න, දැන් ලේබලයක් ගහන්න හදනනේ.ඒ ලේබලේ ම නැවත ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවෙත් ගහන්න.ඒ උගුලට අහුවෙන් නෑ.මම බොහොම කරුණාවෙන් ඉල්ලන්නේ, මේ යෝජනාව ඉල්ලා අස්කර ගත්තොත් හොඳයි අපි හැමෝටම.ඒ නිසා ඉල්ලා අස් කර ගෙන මෙතනින් ඉස්සරහට යන්., මේ යන විදිහට.ඒක ප්‍රශ්නයක් නැනේ.මේ යෝජනාවට නිශ්චිත තීන්දුවක් ගන්න ඕනේ.එක්කෝ ඉල්ලා අස් කර ගන්න ඕනේ, එක්කෝ මේකට සංශෝධනයක් ගේන්න ඕනේ.නැත්නම් මේක බෙදීමක් අරන් පරාද කරන්න ඕන.ඔබතුමත් දේශපාලනයක් කරනවා, අපිත් දේශපාලනයක් කරනවා.අපි හැමෝට ම තියෙන සුදුසු ම කාරණය තමා මේ යෝජනාව ඉල්ලා අස් කර ගන්න එක.ඒ නිසා මේ යෝජනාව සම්බන්ධ තවත් කතා කරන්න ඉල්ලමින්, අවස්ථාව ගන්න ඕනෙ වුණොත් ඒ අවස්ථාව ගන්න බලාපොරොත්තුවෙන් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම මේ නොදන්න කාරණයක් දැනගන්න අහන්නේ.ස්පා වහන්න බලයක් අපිට තියෙනවද.ඒ කුමන නීතියක් පදනම් කරගෙනද?

**සභාපතිතුමා :-**
ඒක මන්ත්‍රීතුමා ඔවුන් සඳහා අපි වෙළඳ බලපත්‍රය ලබාදෙනනේ නැහැ.වෙළඳ බලපත්‍ර දිල නැත් නම් ඒක නීත්‍යානුකූලව පොලිසිය මැදිහත් වෙලා වෙළඳ බලපත්‍ර පරීක්ෂා කරලා ඒ දේ කරන්න පුළුවන්.

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එහෙම නම් අපි මේකටත් තිරණයක් ගමු.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,අපිට බලයක් නැහැ කියනවට වඩා, උපසභාපතිතුමා ම කියනවා අපිට පුළුවන් අතුරු ව්‍යවස්ථාවලින් බලයක් හදාගන්න කියලා යම්යම් තීරණ සඳහා බලයක් නෑ කියන එක කියන්නේ අපි සේරම හැල්ලු කරනවා.මම මේ කෙටියෙන් කියන්නේ.නව එක්සත් වෙළඳ සංගමය ඉල්ලීමක් කළා ඔබතුමාගෙන් සහ අපෙන්.අපේ උපසභාපතිතුමා සහ සභාපතිතුමා ඊයේ ගිහින් සාකච්ඡාවක් කරලා තියෙනවා වෙළඳ සංගමය සමඟ.කළා ද? නැද්ද?නමුත් දැන් උපසභාපතිතුමා කියනවා.සභාපතිතුමා නැත් නම් මේ සභාව හසුරවන්නේ අප සභාපතිතුමා.උපසභාපතිතුමා කියනවා කියපු කෙනා මතක නැහැ කියලා.එතකොට සභාපතිතුමා හිතන්න උපසභාපතිතුමා මෙම සභාවම නොමග අරිමින් මිත්‍යාවක් කරන්නේ.මිනිහෙක් අඳුරන් නැත් නම් පුද්ගලයෙක් අඳුරන්නේ නැත්නම් උපසභාපතිතුමා සීට් එකේ ඉන්න එක සම්පූර්ණ වැරදියි.මං දැන් මෙතුමගෙ කතාවේ සාරාංශය මං දැන් පෙන්වනවා.මේන් බලන්න.එම වෙළඳ සංගමය සමඟ ඊයේ දින සිදුකල සාකච්ඡාවේ රෙකෝඩින් එකක් මං ලග තියෙනවා. දැන් අහන්න ඒක. (දුරකතනය මාර්ගයෙන් විඩියෝ එකක් පෙන්නුවා) (ඝෝෂාව)

**සභාපතිතුමා :-**
ඔක්කොම කතා කරද්දි පැහැදිලි නැනේ.අපි ගියෙ කතා කරන්න, ඕක ගැන කතා කරන්න නෙමේ.අපිට ඉල්ලීමක් තිබුණේ අවුරුද්දට සහ අපේ නගර නිර්මාණය ගැන සාකච්ඡා කරන්න.ඒ අතර තුර සාකච්ඡා කළා නගරයේ කඩ වහන එක ගැන.අපි කිවුවෙත් මේකට අපි කැමතියි.මෙතන කවුරුවත් අකමැතියි කියන් නැනේ.නමුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට වඩා උත්තරීතර එකක් නෑ.අපිට අමාරුවේ වැටෙන්න බෑ.මේක සෙල්ලම් වැඩක් නෙමෙයිනේ.අපි හොයලා බැලුවා.ඇත්තට ම මගෙ ආයතනය පෝයට වහනවා.නමුත් එහෙම පුළුවන්.නමුත් අපිට කඩ බලෙන් වහන්න බෑ.එහෙම නීතියක් තියෙනව නම් අපි මේක කරනවා.අපිත් මේක පුළුවන් තරම් හෙවුවා.ඒක කරන්න පුළුවන් තමන්ට.ඕන කෙනෙකුට වහල දාලා යන්න පුළුවන්.අපිට බලෙන් කඩ වහන්න බෑ.ඒ ගොල්ලො අකමැති නම් ලිවුමක් දෙන් නැනේ.ඔක්කොම නෙමේ වෙන්න ඇති.හැබැයි පිරිසක් කැමතියි පෝයට වහන්න.අපිත් කැමතියි පෝයට වහන්න.නමුත් අපි ඒ අයට පැහැදිලි කරලා කිවුවේ මේකට වෙළඳ සංගමය මැදිහත් වෙලා ඒ දේ කරන්න කියලා.එහෙම කියලා අපට කඩයක් බලෙන් වස්සවන්න බෑ මේකෙ.මේකෙ සභාපති වුණා කියලා එහෙම කරන්න බෑ.අපට වඩා බලයක් අමාත්‍යවරයට තියෙනවනේ.කොමසාරිස්ට පුළුවන්නේ.ඔයාල අතුරු වයවස්ථාව කියවන්න ඇතිනේ.කොමසාරිස්ට පුළුවන් ඒක සංශෝධනය කරන්න.අපිට නැති බලයක් ආරූඪ කරගෙන අපි මේකෙන් ගියාට පස්සේ ඔඩිට්වලට යන්නයි, උසාවි යන්නයි කැමති නෑ.මේකෙ නීතියක් තියෙනව නම් කිසිම ප්‍රශ්නයක් නෑ.අපි වහමු.ඒක අපිට බලෙන් කරන්න බෑ.එහෙම කරන්න පුළුවන්නම් පෙන්නන්න කියන්නේ ඒකයි.එහෙම එකක් තියෙනව නම් අපි වහමු.කිසි ගැටලුවක් නෑ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඊයෙ හවස ඔබතුමත් මමත් අපි ගියා වෙළඳ සංගමයත් එක්ක කතා කරන්න.අපිට එතනදී ඒ ගොල්ලො ඇහුවා නිෂ්චිතව, පෝයට කඩ වහන එක සම්බන්ධව අපේ ස්ථාවත්වය මොකක්ද කියලා.අපිට එතන එකයි මෙතන එකයි දෙකක් නෑ.අපි එතන කිවුවෙත් මේ දේ.මෙතන කියන්නෙත් මේ දේ.අපි ඊයේ කිවුවේ අපිට පනතේ බලයක් නැහැ.එහෙම දේවල් අපිට කරන්න බෑ කියලා අපි ඊයේ කිවුවා.ඔබතුමන්ලට හිතවත් අය ඉන්නවානේ එතන අහල බලන්න කිවුවේ මොකක්ද කියලා.ඊට පස්සෙ තමා එතන එක්කෙනෙක් කිවුවේ, මට ඇත්තටම කිවුව කෙනා මතක නැහැ. අපිත් කිවුවා හරි එහෙනම් ඔබතුමන්ලාගේ කැමැත්තෙන් වෙළඳ සංගම් එකතු කරගෙන කඩ වහගන්න කියලා.අපි සභාව විදිහට මැදිහත් වෙන් නෑ.මැදිහත් වෙන්න බෑ.අපි ඊයෙත් කිවුවේ ඒක.අද කියන්නෙත් ඒක ම තමා.අහල බලන්නකෝ ඊයෙ කිවුවේ මොකක්ද කියලා.
දැන් අතුරු ව්‍යවස්ථා ගැන කිවුවනේ.අතුරු ව්‍යවස්ථා පනවන්න පුළුවන්.අතුරු ව්‍යවස්ථා වුණත් මේ පනතට යටයි.අපිට අතුරු ව්‍යවස්ථා පනවන්නත් ක්ෂේත්‍ර ටිකක් තියෙනවා.ඒ ක්ෂේත්‍රවලට විතරයි අතුරු ව්‍යවස්ථා පනවන්න පුළුවන්.එහෙම නැතුව හැම එකටම අතුරු ව්‍යවස්ථා පනවන්න බැහැ.

ස්පා වහන එක ගැන කිවුවනේ.ඒවට අපෙන් වෙළඳ බලපත්‍රයක් ගන්නෑ.ඒකට අපිට අනිවාර්යෙන් ම බලයක් තියෙනවා වෙළඳ බලපත්‍ර ගත් නැති ඒවට අපිට නීතියෙන් ක්‍රියාත්මක වෙන්න.ඒ විතරක් නෙමෙයි එතනට බලපාන වෙනත් නීති තියෙනවා.එතන වෙන්නේ වෙන එකක් නිසා ඒවා නවත්වන්න පොලිසියට බලයක් තියෙනවා.ඒ නිසා මම බොහොම කරුණාවෙන් ඉල්ලන්නේ,මේ යෝජනාව සභාවට දාපු එකත් වැරදියි.ඔබතුමා හැමෝටම ඇහුන්කන් දෙන හොඳ සභාපතිවරයෙක්.ඇත්තටම කලින් හිටපු වැඩබලන සභාපතිවරු එහෙම,ඒ නිසා න්‍යාය පත්‍රවලට දානකොට සභාවට අදාළ ඒවා විතරක් ම දාමු.මම මේක කියන්නේ මගේ යෝජනාවක් විදිහට.මේ කාලය කා දැමීම සම්බන්ධව මට තියෙනවා පොඩි විවේචනයක්.මම කොහොමත් ස්තූතිවන්ත වෙනවා මේ යෝජනාව දාපු එක සම්බන්ධයෙන්.මේක සම්බන්ධයෙන් අපි නිශ්චිත ස්ථාවරයක් ගන්න ඕනේ.මේක අවිධිමත්ව පනවපු එකක්.2002.05.28.හරියට යෝජනාවක් අරන් නෑ.පෙත්සමකට අනුමැතිය දුන්නා වගේ වැඩක් වෙලා තියෙන්නේ.එහෙම එහෙකට ඇයි අපි අහක යන ප්‍රශ්න දාගන්නේ.(ඝෝෂාව) මේ යෝජනාවට මොකක්ද නිශ්චිතව කරන්නේ.මේ යෝජනාවට නිශ්චිත කාරණා තුනක් තියෙනවා කරන්න.පළවෙනි කාරණය තමා, ඕනෑම මන්ත්‍රීවරයෙකුට මේ දාපු යෝජනාවක් ඉල්ලා අස් කර ගන්න පුළුවන්. (ඝෝෂාව) හේතුව තමයි නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන්හි දී නගරයේ සියලු ම වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි.(ඝෝෂාව) මේක ඉල්ලා අස් කර ගන්න ඕනේ.නැත්නම් සංශෝධනයක් කරන්න ඕනේ. (ඝෝෂාව) ඒ නිසා මම ගේනවා මේකට සංශෝධන යෝජනාවක්.

**"නව එක්සත් වෙළඳ සංගමය විසින් කරන ලද ඉල්ලීමක් අනුව පෝය දිනවලදී කඩසාප්පු වැසිය යුතුය යන යෝජනාව එම සංගමයටත් එම තීරණයට එකඟ තවත් වෙළඳ සංගම් හෝ ව්‍යාපාරිකයන්ටත් එම ඉල්ලීම පරිදි ස්වේච්ඡාවෙන් සිදු කර ගැනීමට අවස්ථාව සලසා දිය යුතු බවට මම යෝජනා කරමි."**

මේක සංශෝධිත යෝජනාව. රීති අනුව සංශෝධනයක් ගේන්න පුළුවන්.ඒ නිසා මම මේක සභාගත කරනවා.

**සභික කේ.ඒ.සෙනරත් කස්තූරිආරච්චි මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම බොහොම සංයමයෙන් මෙතුවක් කාලයක් සද්භාවයෙන් මේ වැඩ ටික කරගෙන ගියා.මෙහෙම පාට් එක දාල නම් වැඩ කරන්න එපා.(ඝෝෂාව) මම මෙච්චර දවස් බොහොම සංයමයෙන් මට උදව් කරන්න පුළුවන් හැම වෙලේ ම උදව් කළා.ඕනම යෝජනාවක් ගේන කොට මම ඒ හැම දේකටම කරන්න පුළුවන් උදව් මම කරලා තියෙනවා.මොකද මේ ගම මට හැදෙන්න ඕන නිසා.ඔයාල ස්පා වහනවා කියලා තින්දු කළා ම මම පෞද්ගලිකව කතා කළා.ස්පා ටික වස්සන්න.ඔයාලට මතක ඇති.ඔයාල කියපු වචන ඩිල්ෂාන් මන්ත්‍රීතුමා දන්නවා.ඒව කිවුවොත් ඔයාලට රෙදි නැතුව යන්න වෙන්නේ පාරේ.ඒ තත්ත්වයට වට්ට ගන්න එපා.මම කියන්නෑ සභාවේ උපසභාපතිවරයාට ගරු කරලා.රෙදි ගලවන්න හොඳ නැති නිසා.මම කා සමඟවත් ඩීල් නැහැ.මේ ප්‍රසිද්ධියේ වෙච්ච කතාවක්.හිටපු අය දන්නවා.අපි එතනත් බේරුවා.උපසභාපතිතුමා මට අණ කරන්න එපා මේවා අයින් කර ගන්න කියලා.මම මේ යෝජනාව කළේ නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි.මම පැහැදිලිව දාලා තියෙනවා.ඒ මිනිස්සු ඉල්ලනවා කඩටික වහ ගන්න.එයාල හිතනවා කඩ වහන්න ඕනේ කියලා.මම යෝජනා කළේ සභාවත් එයාලගෙ ඉල්ලීමට එකඟයි.එච්චරයි.එතනින් එහා කිසි කතාවක් නෑ.මෙච්චර දවසක් වෙච්ච දේ ආපහු පොඩ්ඩක් ක්‍රමානුකූල කරල දෙන්න.ඕනම නීතියක් තියෙනවා, අපේ ඇහැලියගොඩ නගරයේ වන්වේ පාරවල් දෙකක් තියෙනවා.අපි ඔක්කොම ගිහින් නැද්ද ඕකෙ අනිත් පැත්තට.කොමර්ෂල් බැංකුව ගාවින්, සම්පත් බැංකුව ගාවින්.හැබැයි පොලීසිය මොකක්ද කරන්නේ ටික කාලෙකට සැරයක් ඇවිල්ලා ඔතන එක්කෙනෙක් දානවා.ආන් එතකොට ටික කාලයක් මිනිස්සු අරක මතක් වෙලා අතනින් වන්වේ එකට දා එක නවත්වනවා.ඕක තමා සාමාන්‍ය දේ.අපි ගමේදි හෙල්මට් දාන් නැතුව එනවා.නැදුරන හන්දියේ පොලීසියෙන් දවස් දෙකක් හිටපු ගමන් අපි හෙල්මට් දෙකක් අරගෙන එනවා.මොකද අර ගමේ ඉඳන් එන කෙනෙක් නැග්ගට පස්සේ එයාටත් හෙල්මට් එකක් ඕනනේ.නැත්නම් අපිටනේ දඬේ ලියන්නේ.ඒ වගේ මේ යෝජනාව අවුරුදු 22 කට 24 කට කලින් සභාව අනුමත වෙච්ච යෝජනාවක්.ඒ කාළෙත් ජනතා විමුක්ති පෙරමුනේ මන්ත්‍රීවරයෙක් හිටියා සභාවේ.එතුමා විරුද්ධ වුණාද නැද්ද කියන්න මම මේක සම්පූර්ණ කියවලා නෑ.මට ඒ ටික කියවගන්න වුණේ නෑ.ඒ කාලෙත් ජේ.වී.පී. මන්ත්‍රීවරු හිටියා.දැන් අදත් ජාතික ජනබලවේගය කියලා ජනතා විමුක්ති පෙරමුන ඉන්නවා.අපි ශ්‍රීලංකා නිදහස් පක්ෂය,මහජන පක්ෂය, පොදුජන පෙරමුණ ඉන්නවා.සමගිජනබලවේගය එක්සත් ජාතික පක්ෂය ඉන්නවා. මම ගෞද්ගලිකව කිසිම මන්ත්‍රීවරයෙක්ට පෞද්ගලිකව ඇටැක් කරලා නෑ.මම එක සීමාවක ඉන්නවා.මේ ගයානි මන්ත්‍රීතුමිය එක දවසක මාත් එක්ක පැටළුණා.හැබැයි එතුමිය පස්සෙ සභාවට වෙන සාරියක් ඇද ගෙන ආවා.හැබැයි ඒකටවත් මම වචනයක් කිවුවේ නෑ.අපි දන්නවා අම්මෙක්ට උදේට ලැස්ති වෙලා එනකොට තියෙන ප්‍රශ්න ටික.අපෙ අම්මත් රස්සාවකට ගියානේ.ඒ යනකොට උයලා කරලා ගෙදර වැඩ ටික කරලා ළමයින්ට කන්න දීලා ඒ එනකොට එන ප්‍රශ්න ටික දන්නවා.ඔළුව පිස්සු වැටිලා එළියට බහින්නේ.ඒව අපිට තේරෙණවා.ඒවා අපිට නොතේරෙනවා නෙමේ.ඒව අපි ප්‍රශ්න කරන්න ගියේ නෑ.උපසභාපතිතුමා අත් දෙක නමාගෙන සභාවේ ඉඳලා තියෙනවා.මම කියලා තියෙනවා අත් දෙක දිග ඇරගන්න කියලා.අමිල් මන්ත්‍රීතුමාට මම කියලා තියෙනවා අත් දෙක දිග ඇර ගන්න කියලා.මතක නෑ ඒවා.දැන් මතක නෑ ඒවා.අපි ඔයාල අපහසුතාවයට පත් වෙනවට අපි කැමති නෑ.මොකද මේ සභාව අපි ඔක්කොම නියෝජනය කරන්නේ.ඔයාල අයිඩින්ටි කාර්ඩ් එකේ පක්ෂයේ නම ගහලා දුන්නට අපිට ගැටලුවක් නෑ.අපි අපේ පක්ෂය පිළිගන්නවා.මම අපේ පක්ෂය දෙකයි පනහට වැටුණත් මම මේකෙ හිටියා.අපි අපේ පක්ෂය දාදා ආවේ නෑ.අපි එදා ඉඳන් මේකට පෙනී ඉන්නවා.අපි බය නෑ.මේ අපේ පොහොට්ටුවට මහින්ද රාජපක්ෂ මහත්මයාට කඩේ යනවා කිවුවහම මිනිස්සු ගහන කාලයක් තිබ්බා.ඒත් අපි පාරේ බැහැලා හිටියා.අපිට ඒකට කොන්ද හයිය තියෙනවා.අපි පෙනී ඉන්නවා. මම මේ යෝජනාව කළේ මම මේ නැවතත් කියවන්නේ.නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි, මට හා සභාපතිතුමාට ඇඩ්‍රස් කරලා දීපු ලිවුම ක්.අපි සභාපතිතුමා එක්ක නීත්‍යානුකූල නෙමේ සුහදව එදා මම කතා කළා, සභාපතිතුමා මෙහෙම යෝජනාවක් තියෙනවා සභාවට දාන්නද කියලා.මොකද අපි සුහදතාවයෙන් වැඩ කරන්නේ.ඔයාල ගේන

හොඳ යෝජනාවලට මම විපක්ෂයේ ඉඳගෙන කතා කරලා තියෙනවනේ.අර පොලට එක එක දේවල් කරන්න හදනකොට කට කැඩෙන කත් කියනවනේ, එක එක දේවල් එපා හරි දෙයක් කරන්න කියලා.අදත් අර එක්කෝටි දශලක්ෂයක් ගල් අල්ලනවා කිවුවහම, මම කිවුවේ මොකක්ද, හරි නැනක් තියෙනව නම් ඉඩමක් තියෙනව නම් ඒකෙම හදා ගන්න.එතකොට ගොඩ කර ගන්න හරි පුළුවන්.ටකරන් වලින් හරි ගහ ගන්න පුළුවන්.ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව ලොකු නඳුන් මන්ත්‍රීතුමා කිවුවා වගේ කඩුවෙල නගර සභාවක් නෙමේ.හෝමාගම ප්‍රාදේශිය සභාව නෙමේ.කුරුවිට ප්‍රාදේශිය සභාව නෙමේ.අපිට ආදායම් සීමිතයි.අපිට ප්‍රධාන ආදායම් මාර්ග දෙක තුනයි තියෙන්නේ.වරිපනම් බදු.මස්කඩ දෙක ඕවා තමා අපේ ආදායම් මාර්ග තියෙන්නේ.කුරුවිට නම් බෝපත් ඇල්ලත් විකුණනවා.අපිට එහෙම විකුනන්න තැනක් නෑ.අපි බොහොම අමාරුවෙන් දුවන සභාවක්.1991 සභාව ප්ලාස්ටික් පුටු දෙකක් තියලා පටන් ගත්ත සභාවක්.හැබැයි 2010 , 2011 වෙනකොට මෙතන සභාවක් විදිහට මේ විදිහට හදලා තියෙන්නේ.මේ තත්ත්වයට ගෙනාවේ ඒ හිටපු සභාපතිවරු.අපි ඒක තේරුම් ගන්න ඕනේ.මම ඉල්ලීම කළේ මම නැවතත් කියන්නේ නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි එයාලගෙ කැමැත්තෙන් කඩ වහනව නම් අනුමැතිය දෙනවා එච්චරයි.හරි සරල ප්‍රශ්නයක් තිබුණේ.මම මුලදි පැහැදිලි කිරීම කළා.මේ පෝයට කඩ වහන්න කිවුවා නෙමේ.අර වැඩ කරන 1000 ක් 1500 ක් මිනිස්සුන්ට නාගන්න දවසක්, පෝය දවසට තමා ට්‍රිප් එක යන්නේ.කඩ ටික වහලා ඔක්කොට ම නිවාඩු දවසනේ.අපි බිස්නස් කාරයෝ විදිහට මම කැමති නෑ මගේ වෙළඳාම තව කෙනෙක් කරනවට.අපි මේකයි මේ ඉල්ලීම කළේ.එයාලගෙ ඉල්ලීම පරිදි මම සභාවට යෝජනාවක් දැම්මා එයාල කැමති නම් වහන්න.ඒකට සභාවේ අනුමැතිය තමා ඉල්ලා තියෙන්නේ ගරු සභාපතිතුමා.එතනින් එහා මේකෙ රීති හදා ගෙන අපිට අතුරු ව්‍යවස්ථාක්,සභා තීරණයකට අනුව අපට අතුරු ව්‍යවස්ථාවක් හදා ගන්න තැනකට යන්න පුළුවන්.ඒවට කොමසාරිස්තුමාගෙන් උපදෙසුත් තියෙනවා.සභාවල් විසින් අතුරු වයවස්ථා නිර්මාණය කර ගත්ත සභාත් තියෙනවා.මං හිතන්නේ කොළඹ නගර සභාව 50 ක් 60 ක් අතුරු වයවස්ථා හදාගෙන තියෙනවා.ඒඒ අවශ්‍යතාවයන් අනුව.ගොඩක් අතුරු වයවස්ථා හැදිලා තියෙන්නේ නගර සභාවල.මොකද නගර සභාවක නගරාධිපතිවරයා බොහෝ දුරට නීතිඥවරයෙක්.එයාල හදනවා.මේ සභාවල නීතිඥවරයෙක් හිටිය නම් මීට වඩා වැඩ ටිකක්, අතුරු ව්‍යවස්ථා ටිකක් හදනවා.නීත්‍යානුකුල කරන්න උත්සහ ගන්නවා.අපිට නීති ගැන දැනුමක් නැනේ.අපි කරන්නේ මේක කියවලා කාගෙන් හරි උපදෙසක් අරගෙන තමා අපි ඉන්නේ.මෙතන අපි කවුරුත් නීතිඥයොත් නැනේ.නීතිය පිළිබඳ නීතිඥවරු නෑ.මම නැවතත් පැහැදිලිව කියනවා.නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන්හිදී නගරයේ සියලුම වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි.ඒකට සභාවේ අනුමැතිය දෙනවද නැද්ද කියලා.එතකොට ඒක එයාල කරයි.මේ අර මෙච්චර දවසක් තිබුණු යෝජනාව.
ඔබතුමා සංශෝධනයක් ගෙනාව මේකට.රීති අංකය කියන්න.උපසභාපතිතුමා, මේ නීතිය නිකන් අමු අමුවේ කන්න එපා.මේක මේ මෙච්චර සුහදව යන වැඩේ ඔයා නතර කරගන්න හැදුවොත්,මොකක්ද මේ වැඩේ තේරුම? (ඝෝෂාව) උපසභාපතිතුමා මගෙත් ආත්ම ගරුත්වයක් තියෙනවා.ඒක නැතිකරන්න ලෑස්ති වෙන්න එපා.ඔයා ගරු කරලා කතා කරන්න.මගෙ යෝජනාව ඉල්ලා අස් කර ගන්නත් කියනවා.මම ඒකටත් මොකුත් නොකියා මම මගෙ සාධාරණ ඉල්ලීම කරන්නේ?මම කිවුවනේ මගෙ කඩ නෑ මේකෙ.මට මේ කඩ වැහුවත් එකයි නැතත් එකයි.මේ දුක්විදින මිනිස්සුන්ට නිවාඩුවක් ගන්න තමා මේ එක්සත් වෙළඳ සංගමය ඉල්ලීම මම ඉදිරිපත් කළේ.මෙච්චර පැහැදිලිව කරද්දි, උපසභාපතිතුමා මේක රණ්ඩු වෙවී යන්න බෑ.ඔයාලට 18 ක් ඉන්නවා.18යි 18 යි බැලන්ස් වුණොත් 19 යි.යන්න පුළුවන්.මට ඒක නොතේරෙනවා නෙමෙයි.හැබැයි සභාවක් දීර්ඝ කාලීනව යන කොට අපෙත් උදව් ඕනේ.මං ගෙනැත් තියෙන යෝජනා ටික බලන්න.මං දක්වපු අදහස් ටික බලන්න.ඔයාලට බේරෙන්න බැරි වෙනකොට සභාපතිතුමා කියයි එකතැනක මං බේර ගත්ත විදිය.මම මෙච්චර දවස් කියලා නෑ.මම කිසි කෙනෙකුට පුද්ගලිකව ඇටැක් කරලා නෑ.මම මේ පෞද්ගලිකව අඳුරන අය.මම මෙතන තුන්හතර දෙනෙක්ට අන්කල් කියලා කතා කළේ.අපි ගම්වල මිනිස්සු.මන්ත්‍රීවුණා කියලා ඒක වෙනස් කරන්න බෑ.අපි ඕන ම ගමකට ගියාම නැන්දෙ මාමේ කියලා කතා කළේ.අපිට කතා කළේ පුතේ කියලා.අයියෙ මල්ලි කියලා කතා කළේ.ඒක තමා අපේ තිබුණ සම්ප්‍රදාය.ඉතින් මම නැවතත් කියන්නේ ගරු සභාපතිතුමා මේක දීර්ඝ කාලීන ප්‍රශ්නයකට යන්න එපා.මේක ඉවර වෙන්නෑ.ඊළඟ දවසෙත් අපිත් පොයින්ට් හොයාගෙන ඇවිත් කියවනවා.අපි ඔබතුමා අයවැය ඉදිරිපත් කරන වෙලාවෙත් අයවැය අපිට ලිඛිතව දුන්නෑ.මමයි නැගිටලා කිවුවේ මේකෙ රීතිය අනුව පොඩි ගැටලුවක් තියෙනවා.ප්‍රින්ට් කරලා දෙන්න කියලා.අනිත් සභාවල මොකක්ද වුණේ අයවැය දුන් නැති වුණාහම එළියට බැහැලා වොයිස් කට් දුන්නා.හැබැයි අපි මන්ත්‍රීවරු කිසිකෙනෙක් ඒකට එකඟ වුණේනෑ.පොඩි පොඩි අඩුපාඩු කම් වෙනවා.ඔබතුමාල අලුත්.උපසභාපතිතුමත් 2018 හිටපු මන්ත්‍රීවරයෙක්නේ.එතුමත් අවුරුදු 4 ක් අයවැය ඉදිරිපත් වෙන හැටි දැක්කා.ඒක එතුමට අමතක වෙන්න ඇති.ඒවෙලෙත් අපි කළේ අපි ගැටුමකට යන් නෑ.අපි ඔයාලට ඒකට අවස්ථාව දුන්නා ඒක ප්‍රින්ට් කරලා දෙන්න.අපි අපේ ප්‍රතිපත්තිය අනුව අයවැයට විරුද්ධ වුණා.ඒක අපේ පක්ෂයේ ප්‍රතිපත්තියක්.අපි දේශපාලන වශයෙන් ගන්න තීන්දු.ඉතින් ගරු සභාපතිතුමාට මම නැවතත් මතක් කරන්නේ.නව එක්සත් වෙළඳ සංගමයේ සභාපතිවරයා හා ලේකම්වරයා මට හා මාලින්ද මන්ත්‍රීමාට ගරු සභාපතිතුමාට සුජීව මන්ත්‍රීතුමාට දිලීන් මන්ත්‍රීතුමාට රංජිත් මන්ත්‍රීතුමාට මේ අපි එක්කොට ම කරපු ඉල්ලීම, ඔයපැත්තෙත් සමහර අයට එවල ඇති මම දන්නේ නෑ.ඒ ඉල්ලීම අනුව තමා මම මේ යෝජනාව ඉදිරිපත් කළේ.ඔවුන් එකඟතාවයෙන් කඩ වහ ගන්නවා නම් අපේ අනුමැතිය ඒකට හිමියි.ඒක එච්චරයි.බොහොම ස්තුතියි.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, හෝද හෝද මඩේ දාන්න මම කැමති නෑ.මම කියන්නේ එකයි.දැන් මේ දාල තියෙන යෝජනාව.ඒකෙ අන්තිමට තියෙනවා නගරයේ සියලු වෙළඳසැල් වසා දැමීමට යෝජනා කරමි.මේ යෝජනාව නම් මෙතන සම්මත වෙන්නේ, මේකට ඡන්ද විමසීමක් යන්න කැමති නෑ.මොකද අපි ඒකට කැමති නෑ.මේක පොඩි දේශපාලන උගුලක්.අපි ඒකට අහුවෙන් නෑ.ඒ නිසා මම මේ කියන්නේ, එකඟතාවයෙන් කරගෙන යන්න කැමති නම්, මේක ඉල්ලා අස් කර ගත්තා කියලා එතුමාට මොකක්වත් හානියක් වෙන් නෑ.ඒ නිසා මේකෙ කියන්නේ සියලුම වෙළඳසැල් වසා දැම්මට යෝජනා කරමි.මේ කියන්නේ මොකක්ද, අපිට අධිකාරී බලයක් ලැබෙනවා, වහන් නැති ඒවා වහන්න.වහන් නැති ඒවා වහන්න අපිට අයිතියක් නෑ.ඒ ගොල්ලොත් එකඟ වුණා එයාලගෙ කැමැත්තෙන් ඒක කර ගන්නම් කියලා.ඒක තමා මම කිවුවේ මෙතන.ඒ කියන්නේ ඒ ගොල්ලෝ

එකඟතාවය හදාගෙන, එතන එකක් කියලා මෙතන එකක් කියන් නෑ.එතනදී කිවුවේ වෙළඳ සංගමයක් විදිහට ඔබතුමන්ලා අනික් වෙළඳ සංගමත් එකතු කරගෙන ව්‍යාපාරිකයොත් එකතු කරගෙන මේකෙ තිරණය ක්‍රියාත්මක කරන්න කියලා.ඒ කියන්නේ ඔබතුමන්ලාගේ අදහස ක්‍රියාත්මක කරන්න.ඒකට සභාව මැදිහත් වෙන්නෑ.අපිට මැදිහත් වෙන්න බෑ.මේ යෝජනාව මෙතනින් ඉස්සරහට ගියොත් අපි සභාවටම පරිප්පුවක් කන්න වෙනවා.කවුරි හරි කෙනෙක් මුලික අයිතිවාසිකම් කඩ වීම පිළිබඳ නඩුවක් දැම්මොත්,මෙතන ඉන්නේ මේ ඇහැලියගොඩ විතරක් ව්‍යාපාර කරන අය නෙමේ.වෙන ලොකු ආයතන තියෙනවා.කාර්ගීල්ස් එක කීල්ස් එක.පීපල්ස් බේකර්ස් එක.වෙන ආයතන තියෙනවා.ඒ අයට ප්‍රසිද්ධ නිවාඩු වෙළඳ නිවාඩු තියෙන එක හරි.අපිට බලයක් නැති එකක් කොහොමද අපි කරන්නේ.ඒනිසා තමා, ඒතුමා ඒකෙන් නිදහස් කර ගන්න තමයි, නිහතමානීකම නිසා තමයි මම සංශෝධන යෝජනාවක් ගෙනාවේ.සංශෝදන යෝජනාවක් ගේන්න අපිට බලයක් තියෙනවා රීතිවල 21 වන වගන්තියේ.21 වගන්තියේ තියෙනවා "යෝජනාවට අදාළ සෑම සංශෝධිත යෝජනාවක් ම එය ඉදිරිපත් කිරිමට බලාපොරොත්තු වන සභිකයා විසින් සංයෝජිත යෝජනාව ලියා අත්සන් කර ලේකම් වෙත භාර දී තිබිය යුතු ය." "සෑම සංශෝධනයක් ම එය ඉදිරිපත් කරනු ලබන අවස්ථාවක සාකච්ඡාවට භාජනය වන යෝජනාවට අදාළ විය යුතුය." මං ගෙනා සංශෝධනය යෝජනාවට අදාළයි.මං ගෙනා සංශෝධනය මොකක්ද? "නව එක්සත් වෙළඳ සංගමය විසින් කරන ලද ඉල්ලීමක් අනුව පෝය දිනවලදී කඩසාප්පු වැසිය යුතුය යන යෝජනාව එම සංගමයටත් එම තීරණයට එකඟ තවත් වෙළඳ සංගම් හෝ ව්‍යාපාරිකයන්ටත් එම ඉල්ලීම පරිදි ස්වෙච්ඡාවෙන් සිදු කර ගැනීමට අවස්ථාව සලසා දිය යුතු බවට මම යෝජනා කරමි." මේ කතා කරන එකම තමා.අරක වාර්තාවට යන් නැතුව මේකයි මට වාර්තාවට යන්න ඕනේ.මොකද? මෙතන ඉන්න 36 දෙනා ම බේර ගන්න.නැත්තන් කවුරුහරි මුලික අයිතිවාසිකම් නඩුවක් දැම්මොත් එහෙම අපිට අහක යන ප්‍රශ්නයකට මුහුණ දෙන්න වෙන්නේ.අහක යන ප්‍රශ්න ඕනද?මම මේ කියන්නේ එබතුමා දැන් මේ කියපු එකම තමා .ඒ අයම එකඟ වෙලා ඒ අයගේ ම එකඟතාවයෙන් ඒක කරගෙන යනව නම් අපි ඒකට එකඟයි.මම නැවත කියන්නම්කෝ. "නව එක්සත් වෙළඳ සංගමය විසින් කරන ලද ඉල්ලීමක් අනුව පෝය දිනවලදී කඩසාප්පු වැසිය යුතුය යන යෝජනාව එම සංගමයටත් එම තීරණයට එකඟ තවත් වෙළඳ සංගම් හෝ ව්‍යාපාරිකයන්ටත් එම ඉල්ලීම පරිදි ස්වෙච්ඡාවෙන් සිදු කර ගැනීමට අවස්ථාව සලසා දිය යුතු බවට මම යෝජනා කරමි." නැවත නැවතත් එකම දේ කියන්න ඕන් නෑ.ඒ නිසා මම මේ කියන්නේ මේ යෝජනාව වාර්තාවට යනව නම් අපි මේ 36 දෙනාටම ප්‍රශ්නයකට මුහුණදෙන්න වෙනවා.ඒ නිසා මේ යෝජනාව මම නැතුව එතුමා හරි කියනව නම් කමක් නෑ.කිසි ප්‍රශ්නයක් නෑ.මට කාවවත් දේශපාලනය කියලා කාවවත් අපහසුතාවයට පත් කරන්න ඕනෙ නෑ. (සෝෂාව) ඒ නිසා මං මේ කියන්නේ අපිට පනතෙ නැති දෙයක් කරන්න බෑ.අපි පනතේ නැති දෙයක් කරන්නේ කොහොමද?මේ යෝජනාව මේ විදිහට නම් පවත්වාගෙන මේක වැරදියි.සංගම්වලින් කැමැත්තෙන් නම් කරන්නේ ඒ නිසා, අපේ කරුණාරත්න මන්ත්‍රිතුමා ගේ කතාවෙදි පැහැදිලි වුණා වහන් නැති අයට අපි බල කරලා වහන්න ඕන කියන එක ව්‍යංගයෙන් ආවා. (සෝෂාව) ඒ නිසා මම මේ කියන්නේ වහන් නැති අයට නීතිය ක්‍රියාත්මක කරන්න අපිට බලයක් නෑ.මම මේ කියන්නේ.මේක දැම්මෙත් බෙදීමක් හදලා අපිව අපහසුතාවට පත් කරන්න.අපි ඒ උගුලට අහු වෙන් නෑ.ඒනිසා බෙදීමක් ඉල්ලන්නෑ.මං බොහොම කරුණාවෙන් ඉල්ලන්නේ පනතේ බලයක් නැති නිසා මේක මම ඉදිරිපත් කරන්නේ නෑ., සංශෝධිත යෝජනාව එතුමා හරි කමක් නෑ.එතුමා නැතුව වෙන කෙනෙක් හරි ස්වෙච්ඡා වෙන් ඉදිරිපත් කරනව නම් , මෙන්න මේ තීරණ ටික තියෙන්න ඕනේ.එකඟ කියන කැල්ල එන්න ඕනේ.ඒ නිසා අන්න ඒකට අදාළව අපි තීරණයක් ගමු.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, උපසභාපතිතුමා කියන කාරණාව පැහැදිලියි.දැන් හැමෝම ගොඩක් අපහසුතාවයෙන් ඉන්නේ.බඩගින්න වැනි කාරණාත් එක්ක.අපිට සාකච්ඡාවක් ට අවස්ථාව දෙන්න.මේ යෝජනාවේ ඉතිරි ටික කතා කරන්න,මේ යෝජනාවට අපේ කණ්ඩායම එකඟ වෙනවද නැද්ද කියන්න අපිට විනාඩි 45 ක කාලයක් දෙන්න.අපි කෑම දෙන්නෙත් නැනේ.ඒ නිසා කඩේකට ගිහින් කෑම කාලා ඒ සාකච්ඡාවත් කරලා අපේ තීරණය ඔබතුමාට දැනුම් දෙන්නම්.

**සභාපතිතුමා :-**
අපි ඉතිරි යෝජනා ටිකත් කතා කරලා අන්තිමට කතා කරමුද?නැත්නම් අද දවසම යයි.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දැන් අපිට දිවා විවේකයට අවස්ථාව දෙන්නකෝ සභාපතිතුමා.දැන් එකයි වේලාව.මේ යෝජනාවට තිරණයක් ගත්තේ නෑ සභාපතිතුමා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපේ යෝජනාව තියෙන්නේ සභාපතිතුමා වෙළඳ සංගමයේ ඉල්ලීම මතනේ.මගේ ඉල්ලීම තියෙන්නේ **"නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන්හිදී නගරයේ සියලුම වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි."**මම පැහැදිලිව කියලා තියෙන්නේ එයාලගේ ඉල්ලීම පරිදි.එයාල එකඟ වෙලා ,මම ඇහුවනේ මේ යෝජනාව දාන්නද කියලත් සභාපතිතුමා.උපසභාපතිතුමාගේ අභිමානය පිළිබඳ ප්‍රශ්නයක් තියෙනව නම් කෙළින් කියන්න.මොකක් හරි තීන්දුවක් ගමු.ඒක ගැටලුවක් නෑ.මගේ යෝජනාව එන්නෙත් "ඉල්ලීම පරිදි" ආයෙ ඕකට වචන හරඹ කරන්න ඕන් නෑ (සෝෂාව).එයාල අපෙන් ඉල්ලා තියෙනවා කඩ වහගන්න.හරි සරල කතාවක් මේක.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
සියලු වෙළඳ සැල් කියලා තියෙනවනේ.
**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

එයාලනේ ඉල්ලන්නේ. (ඝෝෂාව).ආයෙ සංශෝධනයක් අවශ්‍ය නෑ.මෙතුම මට දැන් වොෂ්රූම් එකේදි හම්බුණා.එතුමට ඒක මට කියන්න තිබුණා.කොලෙන් ගහලා මාව අපහසුතාවයට පත් කරන්න හදන්න එපා.ඒක ලොකු මෝඩ වැඩක්.මම නෙමේ ඒකෙන් අපහසුතාවයට පත් වෙන්නේ.මගෙ කඩ නෑ.වෙළඳ සංගම්වල ඉන්නේ ඔයාලට ඡන්දෙ දීපු මිනිස්සු ඉන්නේ.මේක ඉල්ලීමක්.

**සභාපතිතුමා :-**
මේ ඉල්ලීම හරි.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, **"නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන්හිදී නගරයේ වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි." ලෙස දාමුකෝ.**

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ස්වෙච්ඡාවෙන් කියන කෑල්ලත් එන්න ඕනේ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
එයාලගේ ඉල්ලීම පරිදිනේ උපසභාපතිතුමා. (ඝෝෂාව)මම සංශෝධනයක් විදිහට ඉදිරිපත් කරන්නම් සියලුම කියන එක අයින් කරලා.වැඩේ ඉවරයිනේ සභාපතිතුමා.එයාලගෙ ඉල්ලීම පරිදි ඕන කෙනෙක් කඩ වහගනී.ඕන කෙනෙක් ඇර ගනී.ගහ ගන්නව නම් ගහ ගනී.(ඝෝෂාව)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම මොකක්ද කිවුවේ ඒ ගොල්ලෝ අපෙන් ඉල්ලීම කළා.ඊට පස්සේ අපි මොකක්ද කිවුවේ.අපි අපිට බලයක් නෑ කියලා කිවුවා.අපි බලයක් නෑ කියලා කිවුවට පස්සේ මොකක්ද වුණේ, ඊට පස්සේ අපි කිවුවා කරනව නම් කරන්න ඕන විදිහ.කරන්න ඕන විදිහ කිවුවට පස්සේ ඒ ගොල්ලෝ ඒකට කැමති වුණා.ඒ ගොල්ලන්ගේ ඉල්ලීම වුණෙත් වහන්න තමා. (ඝෝෂාව) ගරු සභාපතිතුමනි,තීරණයක් ගන්නවා නම් ආයෙ ආයෙ ඇද ගෙන යන්න ඕන් නෑ. (ඝෝෂාව) ඔබතුමා අන්තිමට කියපු එක හරි.ඒ කියන්නේ සියලුම වෙළඳසැල් කියන එක නෑ.හැබැයි මේක සභාවට දාන්න ඕනෙත් නෑ. (ඝෝෂාව) මම කියන්නේ මේකෙ සියලුම වෙළඳසැල් කියන එක අයින් වෙන්න ඕනේ.ඒ විතරක් නෙමේ එයාල ස්වෙච්ඡාවෙන් වහ ගන්නව නම් අපිට අදාළ නෑ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම යම්කිසි එකඟතාවයකට ආවා.මේක ඉවර වෙන්න ඕනේ.(ඝෝෂාව) ඉන්න මං යෝජනාව නැවත කියන්නම්,

**"නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන්හිදී නගරයේ වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි."**

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එකඟයි. ස්තුතියි.දැන් මෙහි තිබෙනවා නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන්හිදී නගරයේ සියලුම වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි."කියා. මෙය ඇත්තටම වහන්නේ නැති අය ඉන්නවා නම් කවුරු හරි මෙය සභාවටවත්,වෙළඳ සංගමයටවත්,කිසි කෙනෙක්ට බලපෑම් කරන්න බැහැ. සභාව මැදිහත් වෙන්නේ නැහැ.ඒ ගොල්ලෝ කැමැත්තෙන් වහ ගන්නව නම් කිසි ප්‍රශ්නයක් නෑ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපිට බලතලයක් නෑ.එයාල වහගනී ඕන් නම්.(ඝෝෂාව)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
සභාව මැදිහත් වෙන්නේ නෑ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, උපසභාපතිතුමා යෝජනාව වෙනස් කර ගන්න සභාව මැදිහත් වෙන් නෑ.එයාල ඕන දෙයක් කර ගනී.(ඝෝෂාව)

**සභික ඩබ්.ඒ.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේක පොඩ්ඩක් සැලකිල්ලට ගන්න, සියලුම වෙළඳසැල් කියා නම් කරාට එහි අර්ථය වෙනස් වීම පිළිබඳ ගැටලුවක් තියෙනවා.**"නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන්හිදී නගරයේ වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි."**එහෙම වුණාම වචනවල ගැටලුවක් තියෙනවා.(ඝෝෂාව)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි ඇත්තට ම වචන හරඹ කරන්න ඕන් නෑ. "නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන්හිදී නගරයේ වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි. කියන එකේ අර්ථය වෙනස් වෙන් නෑ.ඒ නිසා අපි එතුමට ම කියමු මේ යෝජනාව ම ඉදිරිපත් කරන්න කියලා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම දැන් කිවුවනේ එයාලගේ ඉල්ලීම පරිදි, එයාල කඩ වහගන්න තමයි එයාල ඉල්ලන්නේ.

**සභාපතිතුමා :-**
ස්වෙච්ඡාවෙන් කියලා දැම්මෙ නම් කිසිම ප්‍රශනයක් නෑ.(ඝෝෂාව) ගරු මන්ත්‍රීතුමා මෙහෙම කරමුද? "නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන්හිදී නගරයේ වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි. ඔබතුමාගේ යෝජනාව එනවා.තීරණය එනවා සභාවේ මැදිහත් වීමකින් තොරව වෙළඳ සංගමයේ කැමැත්ත පරිදි කටයුතු කිරීමට සභාවේ ඒකමතික තීරණය විය. එහෙම මොකද කියන්නේ?

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි ඉල්ලීම පරිදිනේ එන්න ඕනේ.අපි එහෙනම් අපි මෙහෙම දාමුකෝ එයාලගේ කැමැත්ත පරිදි කියලා.(ඝෝෂාව)

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
මේක ඇත්තටම අපිට නීතිමය ප්‍රශ්නයක් නොවෙන්න ඕනේ.මේ සභා වාර්තාව කියන්නේ නඩු කටයුතු සඳහාත් ගන්න පුළුවන් කියලා එතුමගෙ පැත්තෙන් මයි කියන්නේ.එහෙම වෙද්දි අපි මේක අවිධිමත් විදියට දාන්න බෑ.මේ දාල තියෙන යෝජනාවට සංශෝධනයක්නේ එන්නේ.මම මේ කියන්නේ ඒකෙ වෙළඳසැල් කියන එක එකේ සියලුම කැල්ල අයින් වෙනවනේ.සභාවේ මැදිහත් වීමකින් තොරව ඒ අයට ස්වෙච්ඡාවෙන් කර ගෙන යන්න ඉඩදෙන්න කියන ඉල්ලීම කරලා දුන්න නම් හරි.(ඝෝෂාව)

**සභාපතිතුමා :-**
අපි අනුදැනුමකින් වහනවා කියලා නෙමේනෙ තියෙන්නේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ඒ වගේම සභාපතිතුමනි වෙළඳ බලපත්‍රයේ ගහලා තියෙනවා අනීතික වගන්තියක්.ආන් ඒකත් මේ යෝජනාවත් එක්ක ම ඉල්ලා අස් කර ගන්නවා.(ඝෝෂාව)

**සභාපතිතුමා :-**
මන්ත්‍රීතුමා ඇත්තට ම අපි කතා කළේ මේක දෙන්න.නමුත් මේක නඩුවක් ගියොත්.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපිමේක නීතියානුකූල වෙන්න නීතියක් කරන් නෑනේ.එයාල අපෙන් ඉල්ලනවා එයාලගේ එකඟතාවය අනුව කඩටික ඔක්කොම වහන්න.එයාල අපිව දැනුවත් කරනවා හැමෝම පෝයට කඩ වහලා කියලා.

**සභාපතිතුමා :-**
අපි දෙගොල්ලො ම මේක අරිනවට කැමතියි.අපිට තියෙන්නේ අපිට බලයක් නැති එක.කවුරු හරි මානව හිමිකම් ගියොත් එහෙම.ඒකයි අපිට තියෙන ගැටලුව.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සභාවෙන් තීන්දුවක් අරන් එයාලව දැනුවත් කරන් නෑනේ.අපි කියන් නෑනේ කඩ වහන්න කියලා.අපි කියන්නේ නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි එයාලගේ කැමැත්ත අනුව වෙළඳසැල් වසා තැබීමට අපි අනුමැතිය දෙනවා.එච්චරයි.

**සභාපතිතුමා :-**
අන්න එහෙම දාමු.(ඝෝෂාව)

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි හැමෝට ම මේ ප්‍රශ්නය තේරෙනවා.අපිට තියෙන ප්‍රශ්නය තමා නීතිමය රාමුවක් නැති එක.ඒක දැන් පැහැදිලි කරලා එක තැනකට ආවනේ.ඒ නිසා මම කියන්නේ අපේ පැත්තේ කිසි ප්‍රශ්නයක් නෑනේ.ඒගොල්ලෝ වහනව නම් වහගනී.වෙළඳ සංගම් දෙකක් ද තුනක්ද තියෙනවා.නව වෙළඳ සංගමයනේ මේක.බැරිවෙලාවත් සභාපතිතුමා වාචිකව දුන්නොත් මේක කරන්න කියලා, කරන්න වෙනවා.ඒකත් බලපානවා.අපිට එහෙමවත් කරන්න බෑ.දවසම උනත් මේක කතා කරන්න පුළුවන්.අපි දැන් මේක ලොකු ප්‍රශ්නයක් කරගෙන දැන් සැහෙන වෙලා කතා කළා.ඒ නිසා අපිට නීතිමය රාමුවක් නැති නිසා මගේ යෝජනාව නම් අපි කළ යුත්තේ ඔවුන්ට කැමති විදිහකට ඒක කරගන්න ඉඩ ලබාදීම සුදුසුයි කියන එක තමා මගේ මතය.

**සභාපතිතුමා :-**
මෙහෙම යෝජනා කරමු. නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පොහොය දිනයන්හිදී නගරයේ වෙළඳසැල් වසා තැබීම සම්බන්ධයෙන් සභාවේ විරෝධයක් නොමැති බවට යෝජනා කරමි.(ඝෝෂාව)

**සභික සුජීව විජේසූර්ය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙතන නීතියට වඩා අපේ බලය පිළිබඳව අවබෝධයක් නැතිකමයි තියෙන්නේ.අපේ පනත උත්තරීතරයි.අපිට බලයක් පවරලා තියෙනවා.රණසිංහ ප්‍රේමදාස මැතිතුමා එදා පළාත් පාලන ඇමති කාලේ මේ දීපු පනත මේ බලය අපේ ගමේ මිනිස්සුන්ට දුන්නේ.මේ බලය පැවරිලා තිබුණේ ගමේ යම් පිරිසකට විතරයි.නමුත් අද අපි සියලු දෙනා එකඟ වෙයි මේ බලය ගැන ඔබතුමාලා අපේ මාලිමා ආණ්ඩුවේ සභාපතිතුමා ඇතුළු ඔබතුමන්ලා පිළිගත් නැත්නම් අපිට ඒක කරන්න දෙයක් නෑ.අපේ ගයාෂාන් මන්ත්‍රීතුමා, බොහොම සද්භාවයෙන් තමයි මෙම නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි තමා ඒ යෝජනාව ඉදිරිපත් කළේ.මෙතුමා කිවුවා වගේ අපේ 16 දෙනාගෙන් කාටවත් කඩයක් නෑ මේ ගමේ.අපි මේ කතා කරන්නේ වෙළඳ සංගමයේ ව්‍යාපාරිකයන් හා ඒ සේවකයින්ගේ අත්‍යාවශ්‍ය වූ කාරණාවක්.මම දන්නැ උපසභාපතිතුමත් මේකට පිස්සුවෙන් මේකට කතා කරන්නේ කියලා.මේ නිසා ගරු සභාපතිතුමනි අපි මේ බොහොම සද්භාවයෙන්

ගෙනෙන යෝජනා ඔබතුමන්ලා පිළිගන් නැත්නම් අපට කරන්න දෙයක් නෑ.ඒක මේ විශ්වය කවදා හරි තේරුම් ගනී අපි ගෙනා යෝජනාව සම්බන්ධව.ඔබතුමාගෙන් කරුණාවෙන් මේ වෙලාවේ මෙම යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා :-**
සභාව විනාඩි 10කට කල් තබනවා.
සභාව කල් තැබීමෙන් පසු නැවත සභාව ආරම්භ කරන ලදී.

**සභාපතිතුමා :-**
අපි නතර කළේ ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමාගේ යෝජනාව වන "නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෙහොය දිනයේදී නගරයේ සියලුම වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි" යන යෝජනාවෙන්. ඒ සඳහා තර්ක විතර්ක පැමිණියා. එසේනම් ඉල්ලීමක් කරනවා මෙහෙම.බෙදීමකට යන්න දෙගොල්ල ම සූදානම් ද? නව එක්සත් වෙළඳ සංගමයේ කැමැත්ත පරිදි පෙහොය දිනයේදී වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි. ඔබතුමන්ලා එකඟනම් හොඳයි. නැතිනම් අපි බෙදීමකට යාමට සූදානම් වෙමු.නඩුවක් දැම්මොත් අපි කට්ටිය ම බෙදා ගමු.තනියෙන් යන්න එපා.අනිවාර්යෙන් ම කීල්ස් වගේ ආයතනයක් නඩුවක් දාපු ගමන්, රංජිත් මන්ත්‍රීතුමා අපි කට්ටියත් එක්ක ම යන නිසා මාත් කැමතියි.අපි කියමු කෝ කීල්ස් එකෙන් දානවා දවසේ වෙළඳාම ලක්ෂ 10 යි.ඒක නැති වුණා.ඒ නිසා ඒක සභාවෙන් අය කර ගනිමු.ඒක බෙදිලනේ මට එන්නේ.මටත් ඒක ගෙවන්න පුළුවන් ඉතින්.ඔයාලගේ තීරණය මොකක්ද?බෙදීමකට යන්ද?

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමා, අපි සංශෝධනය සඳහා එකඟ නැහැ.

**සභාපතිතුමා :-**
බෙදීම ඉල්ලන යෝජනාව හරියට ම කියන්න.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෙහොය දිනයේදී නගරයේ සියලු වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි.එම යෝජනාව සඳහා බෙදීමක් ඉල්ලා සිටිනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, බොහොම සද්භාවයෙන් තමා කියන්නේ.අපිත් මේ යෝජනාවට ඉතාම කැමතියි.සභාපතිතුමනි අපිත් කැමතියි මේ යෝජනාවට.කිසි ප්‍රශ්නයක් නෑ.මේ යෝජනාව ඉතාම හොඳ යෝජනාවක්.සේවකයින්ගේ පැත්තෙන් ගත්තත්, ව්‍යාපාරිකයන්ගේ පැත්තෙන් ගත්තත්, නගරවාසීන්ගේ පැත්තෙන් ගත්තත්, සභාව හැටියට ගත්තත් මේක ප්‍රශ්නයක් නෑ.හැබැයි මේක ගෙනාපු විදිහයි, මේක කරන විදිහයි, මේක ක්‍රියාත්මක කරන විදිය ගැන තමා අපිට ප්‍රශ්නය තියෙන්නේ.එහෙම වුණාට පස්සේ මේ යෝජනාව මේ විදිහට නම් එන්නේ,මේකට අපි හැමෝ'ට ම ප්‍රශ්නයක් වෙන්න පුළුවන්, මේ යෝජනාව සම්මත වුණොත්.ඔබතුමන්ලා සංශෝධනයට එකඟත් නෑ.වෙන සංශෝධනයක් විධිමත් වෙන්න ඕනේ.ඒක අපි ක්‍රියාත්මක කරනවද නැද්ද කියන එක වෙනම කාරණයක්.දැන් මේ සභා වාර්තාව පදනම් කරගෙන කවුරු හරි නීතියකට අරගෙන ගියෝත් එහෙම ,අපි ඔක්කොටම ඒක ප්‍රශ්නයක් වෙනවා.මේ යෝජනාව ම නම් එන්නේ.මේක විධිමත් සංශෝධනය කරන්න එයාල එකඟ නැත්නම් අපේ පැත්තෙ ඉන්න 18 දෙනා ම, අතිත් පැත්තෙ ඉන්නනේ මන්ත්‍රිවරු 16 දෙනයි අපි 20 දෙනාම වුණත්, අපි 36 දෙනාම වුණත් කැමති මේ යෝජනාව ක්‍රියාත්මක වෙනවට.ඒ කියන්නේ හැමෝම ස්වෙච්ඡාවෙන් කඩවල් වහනවා.මේකෙ තියෙන එක අනුව, හරි නිශ්චිත නෑ වහන් නැති අයට මොකක්ද කරන්නේ කියලා නිශ්චිත නෑ මේකේ.ඒ නිශ්චිත නොවන නිසා මේ යෝජනාවට අපි මේ යෝජනාවට විරුද්දයි.එතුමන්ලා බෙදීමක් ඉල්ලපු නිසා අපි ඩෙදීමක් දෙමු.ප්‍රශ්නයක් නෑ.හැබැයි එතුමන්ලා බොහොම ස්තුතිවන්ත වෙන්න ඕනේ, අපිට බොහොම විශ්වාසයක් තියෙනවා මේ යෝජනාව පරද්දනවා කියලා.එතුමන්ලා මේ යෝජනාව පරද්දලා, එතුමන්ලා බලාරොත්තු වන දේශපාලන ජයග්‍රහනයක් තියෙන්නේ මේකෙ.මේක සභා වාර්තාවෙත් ලියනවනේ.අපි මේක මාධ්‍ය මඟිනුත් ප්‍රසිද්ධ කරනවා.කිසි ප්‍රශ්නයක් නෑ.ඒ මන්ත්‍රිවරු අපිට ස්තුතිවන්ත වෙන්න ඕනෙ මොකටද?එතුමන්ලව බේරා ගැනීම සම්බන්ධව.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ඔබතුමන්ලාගෙන් දැනගන්න කැමතියි සභාවේ ඉන්න සභිකයින් සභාවට යෝජනාවක් ගෙනාවට පසුව එම යෝජනාව සම්මත වෙනවා හෝ අසම්මත වෙනවා හෝ ඒකට ආණ්ඩුපක්ෂයේ අය විරුද්ධයි හෝ පක්ෂයි හෝ තීන්දුවක් ගන්න.එතකොට අපිට අපේ යෝජනාවට බෙදීමක් ඉල්ලන්න පුළුවන්ද බැරිද නීතිමය තත්ත්වය අනුව.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
පුළුවන්.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
පුළුවන් නම් ඔයා මොකද සංශෝධන ගේන්න කියන්නේ?

**සභාපතිතුමා :-**
සංශෝධනයක් කරොත් ඊට පස්සේ ඒකමතිකව සම්මත කරන්න පුළුවන්නේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**

නෑ ඕන් නෑ.ඕන් නෑ. ගයාෂාන් මන්ත්‍රීතුමා යෝජනාවක් ගෙනාවා. ඒ යෝජනාව හරිද වැරදිද ගුණාත්මකද ඒක හොඳ ද නරකද කියන එක සභාවේ තීන්දුවක්.සභාවේ සභිකයින්ට යෝජනා ගේන්න පුළුවන්.සභාපතිතුමාට පුළුවන් තීන්දුවක් ගන්න ඒකට මොකක්ද කරන්නේ කියලා. එච්චරයි.අපි බෙදීමක් ඉල්ලුවා.

**සභාපතිතුමා :-**
ඒ අනුව ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කළ යෝජනාව වන

**"නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන්හිදී නගරයේ සියලුම වෙළඳසැල් වසා තැබීමට යෝජනා කරමි"**

යන යෝජනාව සඳහා විරුද්ධ අය අත් උස්සන්න.ඒ අනුව විරුද්ධව ඡන්ද 20යි.පක්ෂ අය අත් උස්සන්න. ඒ අනුව පක්ෂව ඡන්ද 15 යි.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ඇහැලියගොඩ නගරයේ කඩවල් වහනවට අපි සහයෝගය දුන්නා.ආණ්ඩුපක්ෂය විරුද්ධයි.

**සභාපතිතුමා :-**
ගයාෂාන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට පක්ෂව ලැබුණේ ඡන්ද 15 ක් පමණයි.විපක්ෂව ඡන්ද 20 යි.
(ඝෝෂාව)

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමාගේ 06.19 යෝජනාව, නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන්හි දී නගරයේ සියලු ම වෙළඳසැල් වසා තැබීම සඳහා වූ යෝජනාවට බෙදීමක් ලබා ගත් අතර, එහිදී යෝජනාවට පහත පරිදි සභිකයින් ඡන්දය භාවිත කර අතර, පක්ෂව ඡන්දෙ 15 ක් හා විපක්ෂව ඡන්ද 20 ක් ලැබුණි.ඒ අනුව වැඩි ඡන්ද 5 කින් නව එක්සත් වෙළඳ සංගමයේ ඉල්ලීම පරිදි පෝය දිනයන් හිදී නගරයේ සියලුම වෙළඳසැල් වසා තැබීමට වූ යෝජනාව මහා සභාවේ සභා සම්මත නොවීය.

**යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කළ සභිකයින්.**

**01.** ගරු සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමා
**02.** උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා
**03.** ගරු මන්ත්‍රී ටී.ඩී.වජිර සුසන්ත ජයසෝම මැතිතුමා
**04.** ගරු මන්ත්‍රී ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා
**05.** ගරු මන්ත්‍රී අයි.එච්.රණවීර මැතිතුමා
**06.** ගරු මන්ත්‍රීනී ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය
**07.** ගරු මන්ත්‍රීනී ඩී.ගයානි බුද්ධිකා මැතිණිය
**08.** ගරු මන්ත්‍රී පී.ඩිල්ෂාන් කාවින්ද මැතිතුමා
**09.** ගරු මන්ත්‍රී කේ.ඒ.සෙනරත් කස්තුරිආරච්චි මැතිතුමා
**10.** ගරු මන්ත්‍රී ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා
**11.** ගරු මන්ත්‍රී එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා
**12.** ගරු මන්ත්‍රී එච්.ආරියදාස මැතිතුමා
**13.** ගරු මන්ත්‍රී එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය
**14.** ගරු මන්ත්‍රී කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා
**15.** ගරු මන්ත්‍රීනී එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය
**16.** ගරු මන්ත්‍රී එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා
**17.** ගරු මන්ත්‍රී කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා
**18.** ගරු මන්ත්‍රී එච්.එල්.ජයසේකර මැතිතුමා
**19.** ගරු මන්ත්‍රී ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා
**20.** ගරු මන්ත්‍රී ජී.එච්.එන්.අජන්ත විජයසිංහ මැතිතුමා

**යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළ සභිකයින්.**

**01.** ගරු මන්ත්‍රී ජී.එච්.එස්.එන්.කේ.විජේසූරිය මැතිතුමා
**02.** ගරු මන්ත්‍රී දිලීන් කරුණාපාල මැතිතුමා
**03.** ගරු මන්ත්‍රී ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා
**04.** ගරු මන්ත්‍රී ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා
**05.** ගරු මන්ත්‍රී එච්.එම්.රංජිත් බණ්ඩාර මැතිතුමා
**06.** ගරු මන්ත්‍රීනී ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය
**07.** ගරු මන්ත්‍රී එච්.එස්.එල්.දීපාල් මැතිතුමා
**08.** ගරු පී.මාලින්ද මුදන්නායක මැතිතුමා
**09.** ගරු මන්ත්‍රී ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා
**10.** ගරු මන්ත්‍රීනී පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය
**11.** ගරු මන්ත්‍රී ජී රංජිත් වික්‍රමසිංහ මැතිතුමා
**12.** ගරු මන්ත්‍රී ඒච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා
**13.** ගරු මන්ත්‍රී එච්.එම්.ප්‍රියන්ත කරුණාරත්න මැතිතුමා
**14.** ගරු මන්ත්‍රීනී සරෝජනී ජිනේන්ද්‍රනි මැතිණිය
**15.**ගරු මන්ත්‍රී පී.එම්.චන්ද්‍රදාස මැතිතුමා

**සභාපතිතුමා :-**
සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමාගේ යෝජනාව.

**06.20.2026 වර්ෂයේ පරිසර කමිටුව සඳහා යෝජනා වූ ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න වන මාගේ කමිටු සාමාජිකත්වය අහෝසිකර ඒ වෙනුවට සභික ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා ඇතුළත් කරන ලෙස යෝජනා කරමි.**

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම ගියවර 2026 වර්ෂය සඳහා මුදල් කමිටුවට සහ පරිසර කමිටුවට යන කමිටු දෙකටම සම්බන්ධ වෙලා හිටියා.අපේ නෙල්සන් ජයසේකර මැතිතුමා ඒ කමිටුවලට සහභාගී වෙන් නෑ කියලා එතුමා කියා සිටියා.නමුත් අපිට නිළ වශයෙන් ම කමිටුවකට සම්බන්ධ වෙලා ගරු සභාපතිතුමා විසින් පවරනු ලබන රාජකාරි සඳහා මේ කමිටුවල සාමාජිකයින් අනිවාර්යෙන් ම සම්බන්ධ විය යුතු තත්ත්වයක් අපිට ගියවර සභාවේ දී සභාවේ ලේකම්තුමා, එතුමා අලුත් ම චක්‍රලේඛයක් අනුව දැනුවත් කිරීමක් සිදු කළා.ඒ අනුව මම ගියවර සභාවේදී මම ඉල්ලා අස්වීමේ යෝජනාව කළහම මට ගරු සභාපතිතුමා ප්‍රකාශ කළා එහෙම ඉල්ලා අස්වෙන්න බෑ.ඒක ලබන වර සභාවේ දී යෝජනාවක් විදිහට දාලා ඉල්ලා අස්වෙන්න ඕන කියලා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමාගේ 06.20 යෝජනාව,2026 වර්ෂයේ පරිසර කමිටුව සඳහා යෝජනා වූ ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න වන මාගේ කමිටු සාමාජිකත්වය අහෝසිකර ඒ වෙනුවට සභික ජී.එම්.නෙල්සන් ජයසේකර මැතිතුමා ඇතුළත් කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
සභාව මෙතැන් සිට විවේක කාලය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

විවේක කාලයෙන් පසු නැවත සභාව ආරම්භ කරන ලදී.

**සභාපතිතුමා :-**
6.21.සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ යෝජනාව.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
**06.21.කනත්තවත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිනිය:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ 06.21 යෝජනාව, කනත්තවත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.22.සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ යෝජනාව.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
**06.22.උඩ බේරුවාන කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැලුම්සිරි මැතිනිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ 06.22 යෝජනාව, උඩ බේරුවාන කොටස සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.23. සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ යෝජනාව.

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
**06.23. අජිත් රණසිංහ මහතාගේ කඩය අසල (සේවා පියස අසල) සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා.:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණියගේ 06.23 යෝජනාව, අජිත් රණසිංහ මහතාගේ කඩය අසල (සේවා පියස අසල) සිට ඉදිරියට මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.24. සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණියගේ යෝජනාව.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
**06.24.මාහිංගොඩ වසමට අයත් ජනිත ගාඩ්න්ස් ඉතිරි කොටස සහ මාහර වසමට අයත් සුදු වලව්ව පාර සඳහා වරිපනම් බදු අයකිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීමට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, ජනිත ගාඩ්න්ස් හි ගෙවල් 26 ක පමණ ප්‍රමාණයෙන්, දැනට මේ වන විට වරිපනම් ගෙවන්නේ නිවාස 07 ක් පමණි.ජලය, විදුලිය, දුරකතන ආදී සියලු පහසුකම් ලබා දී ඇති ඉතිරි නිවෙස් සඳහා වරිපනම් බදු අය කිරිමට යෝජනා කරමි.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම දැන ගන්න කැමතියි, ජනිත ගාඩ්න්ස් ජනතාවගේ කැමැත්ත අනුවද මේ යෝජනාව කරන්නේ කියලා.ලිඛිතව ඉල්ලීම් කරලා තියෙනවද කියලා.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, ඔව්.ඒ අයගේ කැමැත්ත අනුව තමා මේ යෝජනාව ඉදිරිපත් කළේ.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, යෝජනාව දාද්දි ඒ ජනතාවගේ ඒ ඉල්ලීම සභාගත කරන්න ඕනේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මම මීට කලින් සභා වාරයක දී බුළුගහපිටිය වසමත් වරිපනම් සීමාවට ඇතුළත් කරන්න කියලා යෝජනාවක් කළා.ඒකට මොකක්ද දන්නෑ වුණේ නේද?ඒ දවස් ටිකේ වරිපනම් සම්බන්ධව යම් වැඩ ටිකක් කෙරෙනවා.ඒක ඉවර වුණාහම කරමු කිව්වා.

**සභාපතිතුමා:-**
ඒ වෙන කොට තක්සේරු කටයුතු සිදු කළා.දැන් ඒ වැඩ ඉවරයි.අනික තමයි UD එකෙන් වසම් 22 දෙකක් හඳුනගෙන තියෙනවා දියුණු ගම් පළාත් කියලා.22 ක් නාගරික සංවර්ධන අධිකාරියටත් 22 ක් ග්‍රාමීය ප්‍රදේශ ලෙසත් හඳුනගෙන තියෙනවා.ඒ 22 න් එකක් තමයි මේ මන්ත්‍රීතුමියගේ කොට්ඨාශය.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණියගේ 06.24 යෝජනාව, මාහිංගොඩ වසමට අයත් ජනිත ගාඩ්න්ස් ඉතිරි කොටස සහ මාහර වසමට අයත් සුදු වලව්ව පාර සඳහා වරිපනම් බදු අය කිරීම සඳහා අවශ්‍ය කටයුතු සැලසීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.25. සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණියගේ යෝජනාව.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
**06.25.සත්ව සංවර්ධනය වෙනුවෙන් පශු වෛද්‍යමධ්‍යස්ථාන වලින් වන සේවය ක්‍රමවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, ඇහැලියගොඩ ගොවිජන සේවා මධ්‍යස්ථානය හා නාමල්දෙනිය තියෙන මධ්‍යස්ථානය තමා මේ පැත්තෙ ඉන්න ජනතාවට සේවයක් ලබා ගන්න තියෙන මධ්‍යස්ථාන දෙක.නමුත් ජනතාවට ලොකු ගැටලුවක් තියෙනවා. ඒකට සත්තුන්ට ප්‍රතිකාර කිරීමට අරන් ගිහාම උදේ 10 ඉස්සෙල්ලා යන්න ඕනේ.ඊට පස්සෙ ගිහාම බෙහෙත් ගන්න ඩොක්ටර් එතන නෑ.ෆීල්ඩ් එකේ ගියා කියනවා හරක් එළුවො වගේ සත්තුන්ට බෙහෙත් කරන්න කියලා. ඒ නිසා මිනිස්සු ගොඩක් අපහසුතාවයට පත් වෙනවා.

**සභාපතිතුමා :-**
ගරු මන්ත්‍රීතුමිය ඔබතුමිය කතා කරන්නේ සුරතල් සතුන්ද, කෘෂි කාර්මික සතුන්ද?

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, කෘෂි කාර්මික සතුන්ට නම් ඇත්තට ම එතනින් සේවයක් වෙනවා.පෞද්ගලික මධ්‍යස්ථානවලට ගිහාම ලොකු මුදලක් ගන්නවා.ඒ නිසා සතුන් ගොඩ වුණාහම ලොකු අපහසුතාවයකට මිනිසුන් පත් වෙනවා.

**සභාපතිතුමා :-**
ගරු මන්ත්‍රිතුමිය, ඒ ආයතනයේ ප්‍රධාන කාර්ය තමයි කෘෂි කාර්මික සතුන්ට සේවය සැපයීම.ඊට අමතරව සේවාවක් විදිහට තමා උදේ 10 වෙනකන් සුරතල් සතුන් වෙනුවෙන් වෙන් කරලා තියෙන්නේ.ඒ ආයතනයේ ප්‍රධාන කාර්ය භාර්ය වෙන්නේ කෘෂිකාර්මික සතුන් වෙනුවෙන් සේවය සැපයීම

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාවට මොකද කරන්නේ.

**සභාපතිතුමා :-**
ඒ යෝජනාව අපිට කරන්න බෑ.ඒ යෝජනාව ඉවත් කරන්න වෙනවා.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව මම ඉල්ලා අස් කර ගන්නවා

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණියගේ 06.25 යෝජනාව, සත්ව සංවර්ධනය වෙනුවෙන් පශු වෛද්‍ය මධ්‍යස්ථාන වලින් වන සේවය ක්‍රමවත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා වූ යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලදී.

**සභාපතිතුමා :-**
6.26. සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණියගේ යෝජනාව.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
**06.26.තලගහමුල ඉසුරු පෙදෙස ප්‍රාදේශිය සභාවට අයත් අඩි 16ක මාර්ගය අවහිර කොට ඉදිකර ඇති ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා නීතිමය කටයුතු ආරම්භ කිරීමට යෝජනා කරමි.**
**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, තලගහමුල ඉසුරු පෙදෙස මාර්ග සංවර්ධනය සඳහා ලක්ෂ 10 ක ප්‍රතිපාදන ලැබී ඇත.අනවසර පැතිබැමි ඉදිකර ඇති නිසාවෙන් දැනට අඩි 9 ක පාරක් සංවර්ධනය කිරිමට ගමේ ජනතාව කැමති විය.නමුත් ඉදිරියේ දී මේ අඩි 16 පාර කරන්න අපහසු නම් අඩි 12 ක පාරක්වත් ලබා ගැනීමට කටයුතු කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ පාර 16 කියලා ගැසට් එකේ තියෙනවද?

**සභාපතිතුමා :-**
ඒ පාර අඩි 16 කරන්න නම් දීර්ඝ කාලයක් යන වැඩක්.දැන් තියෙන්නේ අඩි 08 යි.දෙපැත්තෙම තාප්ප තියෙනවා.එහෙම යනව නම් ඉඩම් අත්පත් කර ගැනිමේ ක්‍රියාවලියට යන්න ඕනේ.එතකොට මේ වැඩේට අවුරුදු දෙක තුනක්වත් යනවා.ඒක නිසා තමා ඔබතුමියට ලැබුණු දාලා සංවර්ධනය කළේ.ඉඩම් අත්පත් කරන්න නඩුවක් දාන්න වෙනවා.ඒකට ලොකු කාලයක් යනවා.නමුත් ඒ ගොල්ලෝ දෙන්න කැමති වෙන්නේ නෑ.මම ත් එතනට ගියා.කැබ් එකවත් යන්න බෑ.ඒක අඩි 16 කරන එක අමාරු වැඩක්.හැබැයි ඒක ගැසට් එකේ තියෙනව නම් අපට ඒක කරන්න වෙයි.මන්ත්‍රී වරියට දුන්න වගේම මටත් ලිවුමක් එවලා තියෙනවා පාර ලොකු කරන්න එපා කියලා.

**සභික දිලින් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපිටත් පිටපත් එවලා තියෙනවා.මේකෙ දෙපැත්තක් තියෙනවා.”එම් කේ ඉක්බාස්.මාර්ගය පළල් කිරීම සඳහා අකමැත්ත ප්‍රකාශ කරමි.”ලෙස ලිපියක් ඉවලා තියෙනවා. 13 න් දෙනෙක් අත්සන් කරලා තියෙනවා.(එම ලිපිය සභාවට ඉදිරිපත් කරන ලදී.)

**සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම ලක්ෂ 10 ප්‍රතිපාදනය ආවට පස්සේ අපි ගමේ මිනිස්සුත් එක්ක කතා කළා.සභාපතිතුමත් එදා එතනට ආවනේ.අපි එතන දී ඇත්තටම එදා ඒක පැහැදිලි කරා ලක්ෂ 10 න් එයාල කියන විදිහට කරන්න බෑ කියලා.ඒක තේරුම් කරාට පස්සේ ඒ අය කැමති වුණා අඩි 9 පාරක් හදා ගන්න.

**සභික සුජිව විජේසූරිය මැතිතුමා මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අඩි 16 ක් ගැසට් එකේ තියෙනව නම්, මං හිතන්නේ ඔබතුමාට පුළුවන් විදිහට මේ කටයුත්ත කරලා දෙන්න.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.එම්.සුමිත්‍රා සේනානායක මැතිණියගේ 06.26 යෝජනාව, තලගහමුල ඉසුරු පෙදෙස ප්‍රාදේශිය සභාවට අයත් අඩි 16 ක මාර්ගය අවහිර කොට ඉදිකර ඇති ඉදිකිරීම් ඉවත් කිරීම සඳහා නීතිමය කටයුතු ආරම්භ කිරීමට වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.27. සභික අයි.එච්.රණවීර මැතිතුමාගේ යෝජනාව.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**

**06.27.දිවුරුම්පිටිය සමන් විද්‍යාල මාවතේ අන්නාසිවත්ත පාරේ තද බෑවුම් සහිත අනතුරුදායක මීටර් 25 පමණ වන කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරිම.**

**ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික අයි.එච්.රණවීර මැතිතුමාගේ 06.27 යෝජනාව, දිවුරුම්පිටිය සමන් විද්‍යාල මාවතේ අන්නාසිවත්ත පාරේ තද බෑවුම් සහිත අනතුරුදායක මීටර් 25 පමණ වන කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරිමට වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.28. සභික අයි.එච්.රණවීර මැතිතුමාගේ යෝජනාව.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
**06.28.රන්පුරගම රන්දිය උයනට යාබද පාරේ කනගලිංගම් මහතාගේ නිවස අසල සිට රංජිත් මහතාගේ නිවස දෙසට මීටර් 25ක් පමණ ගමන් කිරීමට අපහසු කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික අයි.එච්.රණවීර මැතිතුමාගේ 06.28 යෝජනාව, රන්පුරගම රන්දිය උයනට යාබද පාරේ කනගලිංගම් මහතාගේ නිවස අසල සිට රංජිත් මහතාගේ නිවස දෙසට මීටර් 25 ක් පමණ ගමන් කිරීමට අපහසු කොටස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කිරීමට වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.29. සභික අයි.එච්.රණවීර මැතිතුමාගේ යෝජනාව.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
**06.29.රාජ්‍ය සේවක ගම්මානයේ A කොටසේ පැරණි රේල් පාර දක්වා ගමන් කරන පාරේ ඩී.ජී.ජයවීර මහතාගේ නිවස ඉදිරිපිට බෝක්කුව සේදීයාම නිසා එය කැඩීයාමට ලක්වී ඇති බැවින් එම ස්ථානය පිළිසකර කිරීමට යෝජනා කරමි.**

**සභික ඩී දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ බොක්කුව හදන්නේ රේල් පාරේ ද?රේල් පාර එනවනේ මේ ආණ්ඩුව කාලේ.

**සභික අයි.එච්.රණවීර මැතිතුමා:-**
රේල් පාර නෙමේ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික අයි.එච්.රණවීර මැතිතුමාගේ 06.29 යෝජනාව, රාජ්‍ය සේවක ගම්මානයේ A කොටසේ පැරණි රේල් පාර දක්වා ගමන් කරන පාරේ ඩී.ජී.ජයවීර මහතාගේ නිවස ඉදිරිපිට බෝක්කුව සේදීයාම නිසා එය කැඩීයාමට ලක්වී ඇති බැවින් එම ස්ථානය පිළිසකර කිරීමට වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.30. සභික කේ.ජී.වසන්ත සේනාරත්නමැතිතුමාගේ යෝජනාව.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
**06.30.අදවන විට අක්‍රියව පවතින දඹුල්ල සතිපොළ කඩිනමින් ආරම්භ කිරීම සඳහා පැනවිය යුතු කොන්දේසි හා ගතයුතු ක්‍රියාමාර්ග සභාව විසින් සාකච්ඡා කර පොදු තීරණයකට එළඹීම සුදුසු යැයි මම යෝජනා කරමි.**

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,2026.03.06දින දඹුල්ල සති පොළ ආරම්භ කිරීම පිළිබඳ සාකච්ජාවක් පැවතුණා.ඒ සඳහා මමත් ප්‍රාදේශීය සභාවේ ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආරියදාස මැතිතුමා, ප්‍රධන කළමණාකරණ සහකාරතුමිය හා ආදායම් පරීක්ෂකතුමියන් දෙදෙනා සහභාගී වුණා. එහිදී,

i. සති පොළ බ්‍රහස්පතින්දා දිනය පවත්වන බවටත්,
ii. එහි වෙළෙදාම් කිරීමට කැමැති අය සඳහා 2026.03.12 දිනට පෙර සභාවට තමන්ගේ නම, ලිපිනය, දූරකතන අංකය හා සිදු කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපාරය ලිඛිතව හෝ වාචිකව

දන්වන ලෙසත් සති පොළෙ හි ව්‍යාපාරය සිදු කිරීමට බලා පොරොත්තු වන සියලු වෙළෙන්දෙන් සමඟ 2026.03.16 දින ප.ව.1.00 ට දඹුල්ල ශ්‍රවනාගාරයේ රැස්වීමක් පැවැත්වීමට කටයුතු කරන ලෙසත්,

iii. සතිපොළෙහි එළවළු, පලා, ප්ලාස්ටික් බඩු, මාළු හා රසකැවිලි ආදි අලෙවි ද්‍රව්‍ය විකිණීම සඳහා පොළෙහි ස්ථාන වෙන් කළ යුතු බවටත්,

iv. පාර දෙපස කවර වෙළෙදාම් සිදු කරන්නේද යන්නත්,

v. 2026 වර්ෂයේ සති පොළෙහි ආදායම ප්‍රාදේශීය සභාව (කේ.ජී.බී.වසන්ත මයා ) මඟින් එකතු කිරීමටත්, 2027 වර්ෂයේ සිට සති පොළ බදු දීම සඳහා ලංසු කැඳවන බවටත්,

vi. 2026.03.19 දින ආදර්ශ පොළක් ලෙස දඹුල්ල පොළ ආරම්භ කර 2026.03.26 දින සිට බිම් කොටසකට රු.100.00 බැගින් ගාස්තු අය කරන බවටත්,

vii. 2026.03.16 වන දිනට පෙර බිම් කොටස් තීන්ත මඟින් සලකුණු කිරීමටත්,

viii. සති පොළ අවසන් වූ පසු තමන් රැගෙන එන දෑ ආපසු රැගෙන යාමට කටයුතු කරන ලෙස දැන්වීමටත්

තීරණය කරන ලදී.

**සභාපතිතුමා :-**
මන්ත්‍රීතුමා කොළයක්බලාගෙන සභාවේ නතා කරන්න බෑ.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,මෙතුමා ඉල්ලනනේ "පවතින දඹුල්ල සතිපොළ කඩිනමින් ආරම්භ කිරීම සඳහා පැනවිය යුතු කොන්දේසි හා ගතයුතු ක්‍රියාමාර්ග සභාව විසින් සාකච්ඡා කර පොදු තීරණයකට එළඹීම සුදුසු යැයි මම යෝජනාකරමි" නමුත් කොන්දේසි ටික අපිට එවලා නෑ.ඒකයි අපි කොළේ බලන් කියන එකට බාධා කළේ නැත්තේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, වසන්ත මන්ත්‍රීතුමා ඉතා කැපවීමෙන් හදවතින් ම හා උනන්දුවෙන් මේ වැඩේ කරන්නේ.මේ තීරණ ටික න්‍යාය පත්‍රයට ඇතුළත් කරන්න ඕනේ හරි නම්.කොහොම නමුත් මේ වැඩ කටයුත්ත ඉක්මනින් කර ගැනීමට ඔබතුමාගේ සහයෝගය දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මන්ත්‍රීතුමා දැඩි උත්සහයක යෙදෙනවා දඹුල්ල අවට ප්‍රදේශය සංවර්ධනය කරන්න.ප්‍රදේශයේ වැඩිපුර තියෙන්නේ සුළු අපනයන බෝග.ගමේ මිනිස්සුන්ට අමතරව නගරේ මිනිසුන්ටත් අවස්ථාව දෙනව නම් හොඳයි.ඒ වෙළඳපොළ නිර්මාණය වීම වැදගත් වෙනවා ගමේ මිනිස්සුන්ගේ ආර්ථිකයට.ගමේ මිනිසුසුන්ගේ ආර්ථිකය ගොඩනගා ගන්න ක්‍රම වේදයක් හදල දෙන්න පුළුවන් නම් එතුමාගේ ඉලක්කයට යන්න ලොකු පහසුවක් මේක.එතන කසල එකතු කරන්න ඉන්නේ එක සේවකයි.බැරි වෙලාවත් මේ සේවකයා අසනීප වුණොත් ඒ වැඩ කටයුතු කර ගැනිමට ප්‍රශ්නයක් වෙනවා.(ඝෝෂාව)එතුමාගේ යෝජනාව කාලෝචිතයි. ඉක්මනින් ම සංවර්ධනය කරලා, මෙය ආරම්භ කරන්න අවස්ථාවක් සදලා දෙන්න.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ යෝජනාව දක්කට පස්සේ අපේ විපක්ෂයේ කාර්ය භාර්යක් තමා ඒ ගැන බලන එක.අපි ගිහිල්ලා බැලුවා දඹුල්ල කරදන.අපි මොකක් හරි ව්‍යාපෘතියක් පවත්වන කොට සක්‍යතාවයක් කරන්න ඕනේ.මේ ව්‍යාපෘතියට සභාවේ අරමුදල් යොදවන්න වෙයි.සභාවේ නිලධාරී යොදවන්න වෙයි.එතකොට ඒ ව්‍යාපෘතිය කිරීම තුළ ඒ ප්‍රදේශවාසීන්ගේ දියුණුව සැලසෙනවද කියලා අපි පොඩි අධික්ෂණයක් කරන්න ඕනේ. අපි ඇත්තට ම ඒක කළා.සමහර අයගේ බලාපොරොත්තුව තියෙන්නේ මේ පොල කියන සංකල්පය පොඩ්ඩක් ඈත් වෙලා දැන් දඹුල්ල නගරය වටා සුපර් මාකර්ට් ඉදිවෙමින්, නවීන වෙළඳපොළවල් ඉදි වෙමින් පවතිනවා.ඒ නිසා පොල අවශ්‍යා නැ කියන එක.හැබැයි බහුතරයගේ අවශ්‍යතාවය තිබ්බේ මේක අපිට, දඹුල්ලට තියෙන සම්පතක්, මේ සම්පතින් තමා දඹුල්ල නගරය දියුණු කරන්න අවශ්‍ය, ඒ නිසා අපිට නැවතත් පොල ලබා දෙන්න කියන එක බහුතරයේ කැමැත්ත වුණා.ඒ අනුව අපි කීප දෙනෙක් කතා වුණා මෙතන්ට අනිවාර්යෙන් ම පොල අවශ්‍යයි කියන එක.ටෙන්ඩර් දැම්මට කවුරුත් ගත්තේ නෑ.මේ මන්ත්‍රීතුමා දැඩි උත්සහයක් ගන්නවා මේ දඹුල්ල පොළ නැවතත් යථා තත්ත්වයට ප්‍රචලිත කරන්න.මෙතන කියවුණේ නැහැ.සමහරවිට අපිට හරක් මස්කඩේ යවන්න වෙයි.මාළු වෙළඳාම ආරම්භ කරන්න වෙයි.කුකුළු මස් කඩ, එළු මස් කඩ ඉස්සර තිබිලා තියෙනවා.ඒවා නැවත ආරම්භ කරන්න වෙයි.අපිට ආරංචි විදිහට තල්දූව ප්‍රදේශයේ මුදලාලිලත් එක්ක කතා කළාහම, එයාල කැමතියි මේ ව්‍යාපාර කටයුතුවලට සම්බන්ධ වෙන්න.හැබැයි ඒක ලොකු අවධානමක්.හැබැයි ඒ ලොකු අවධානම භාර ගන්න කැමති නම් අපි එතුමන්ලාට ඒ අවස්ථාව ලබා දීම ඉතාමත් යෝග්‍යයි.මේ යෝජනාව අපි ඉතාමත් ම අගය කරනවා.ඒ සඳහා අපේ පූර්ණ සහයෝගය ලබා දෙන්න කියලා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.මේක ආරම්භ කරලා මේ අප්‍රේල්වලට කලින් මේ කටයුත්ත සිදු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභාපතිතුමා :-**
ඇත්තට ම අපි මේ ගැන අධීක්ෂණයක් කළා.ඇත්තට ම තල්දූව ප්‍රදේශයේ පොළට වසන්ත මන්ත්‍රීතුමාට කලින් මම තමා ඒ ප්‍රදේශයට ගිහින් ඒ තල්දූව ව්‍යාපාරික සංගමය එක්ක කතා කරලා, ඊළඟ වතාවේදී වසන්ත මන්ත්‍රීතුමා යවලා.මේ ඔකොම ටික කරලා සක්‍යතාවයක් අරගෙන අපි කාර්මික නිලධාරීත් සම්බන්ධ කරගෙන ඒ වැඩ කටයුතු ටික අපි කළා.නමුත් අපිට මේ තීරණ ටික ඔබතුමාලට දීගන්න බැරි වුණා.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ජී.වසන්ත සේනාරත්නමැතිතුමාගේ 06.30 යෝජනාව, අද වන විට අක්‍රියව පවතින දඹුල්ල සතිපොළ කඩිනමින් ආරම්භ

කිරීම සඳහා පහත සඳහන් කොන්දේසි හා ගත යුතු ක්‍රියා මාර්ග සභාව විසින් සාකච්ඡා කර පොදු තීරණයකට එළඹුණු අතර, ඒ අනුව දඹුල්ල සතිපොළ කඩිනමින් ආරම්භ කිරීමට සුදුසු බවට මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

i. සති පොළ බ්‍රහස්පතින්දා දිනය පවත්වන බවටත්,
ii. එහි වෙළෙදාම් කිරීමට කැමැති අය සඳහා 2026.03.12 දිනට පෙර සභාවට තමන්ගේ නම, ලිපිනය, දූරකතන අංකය හා සිදු කිරීමට බලාපොරොත්තු වන ව්‍යාපාරය ලිඛිතව හෝ වාචිකව දන්වන ලෙසත් සති පොළෙ හි ව්‍යාපාරය සිදු කිරීමට බලා පොරොත්තු වන සියලු වෙළෙන්දෙන් සමඟ 2026.03.16 දින ප.ව.1.00 ට දඹුල්ල ශ්‍රවනාගාරයේ රැස්වීමක් පැවැත්වීමට කටයුතු කරන ලෙසත්,
iii. සතිපොළෙහි එළවළු, පලා, ප්ලාස්ටික් බඩු, මාළු හා රසකැවිලි ආදි අලෙවි ද්‍රව්‍ය විකිණීම සඳහා පොළෙහි ස්ථාන වෙන් කළ යුතු බවටත්,
iv. පාර දෙපස කවර වෙළෙදාම් සිදු කරන්නේද යන්නත්,
v. 2026 වර්ෂයේ සති පොළෙහි ආදායම ප්‍රාදේශීය සභාව (කේ.ඒ.ඩී.වසන්ත මයා ) මඟින් එකතු කිරීමටත්, 2027 වර්ෂයේ සිට සති පොළ බදු දීම සඳහා ලංසු කැඳවන බවටත්,
vi. 2026.03.19 දින ආදර්ශ පොළක් ලෙස දඹුල්ල පොළ ආරම්භ කර 2026.03.26 දින සිට බිම් කොටසකට රු.100.00 බැගින් ගාස්තු අය කරන බවටත්,
vii. 2026.03.16 වන දිනට පෙර බිම් කොටස් තීන්ත මඟින් සලකුණු කිරීමටත්,
viii. සති පොළ අවසන් වූ පසු තමන් රැගෙන එන දෑ ආපසු රැගෙන යාමට කටයුතු කරන ලෙස දැන්වීමටත්

**සභාපතිතුමා :-**
6.31.සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණියගේ යෝජනාව.

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය:-**
**06.31.**ෆෝවුන් ගම්මානයේ සිට පොල්වත්ත කඩේ දක්වා දිවෙන අඩිපාර සකස්කර ගැනීමට යෝජනා කරමි.

**සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මේක ගම්වාසීන්ගේ ඉල්ලීමක්.ෆෝවුන් එකේ පාරට එනව නම් නාගොඩ හරහා , මීන්නාන හන්දියට එන්න ඕනේ.ඉස්කෝලෙට යන අයට ජොබ්වලට යන අයට පයින් ආවත් විනාඩි 20 ක් විතර යනවා.ත්‍රිවිල් එකක ආවත් රුපියල් දෙතුන් සීයක් යනවා. අඩි පාරෙන් යනව නම් මීටර් 100 ක් 150 ක් විතර තියෙන්නේ.දැනටත් ඒ අය මේ අඩි පාර පාවිච්චිකරනවා.වැස්ස කාලෙට යන්න බෑ මඩ වගුරු වගේ නිසා.ගොඩක් ඒ පැත්තෙ පාසල් ළමයි යන්නේ ගැටහැත්ත ඉස්කෝලෙට.දිලෙන තරු සුහසාධක සමිතිය ඉල්ලීමක් කරලා අත්සන් ලේඛනත් එක්ක පොටෝත් එක්ක ඉදිරිපත් කළ ඒ යෝජනාව ම තමා මම දැම්මේ .එයාල ඉල්ලලා තියෙන්නෙත් අඩිපාර හදලා දෙන්න එයාලට යන්න පුළුවන් විදිහට කියලා.

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒක හොඳ යෝජනාවක්.ඒක අඩි 8 වගේ පාරක් හදන්න පුළුවන් නම් හොඳයි කියලා මම යෝජනා කරනවා.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා.**
ගරු සභාපතිතුමනි, ඒක වරිපනම් සීමාවට අදාළ එකක්. සභාවට අයිති පාරක් විදියට ගැසට් කරපු පාරක් තමා ඒතන තියෙන්නේ.මේක ඇළක් හරහා ගිහින් තමා පාරට සම්බන්ධ වෙන්නේ.අඩිපාර විදිහට තියෙන මේ පාර කුඹුර මැදින් තමා යන්නේ.කුඹුර නිසා වගුර තියෙනවා.ඒ නිසා ඒයාලට යන්න අපහසුයි.අඩුම තරමේ මේ පාර අඩි 8 ක් නැති වුණත්, බයික් එකක්වත් යන්න පුළුවන් විදිහටවත් හදන්න පුළුවන් නම් හොඳයි කියලා මං යෝජනා කරනවා.ඒයාලට ඒන්න වෙන පාරක් තියෙනවා.ඒයාලගේ පහසුව සඳහා තමා ඒයාල ඒ පාරේ ඒන්නේ.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මං හිතන්නේ මේක කෘෂිකාර්මික පාරක්.මේක හොඳ යෝජනාවක්.මේ ක අඩි 8අට දහය කරන්න කරන්න ගියොත් ඕක හදා ගන්න බැරි වෙනවා.ඒ යෝජනාව හොඳා අඩි පාරක් විදිහට.ගමේ කෘෂිකර්ම උපදේශකත් එක්ක කතා කරලා ගොවිජනසේවා එකෙනුත් අවසර අරගෙන සම්බන්ධිකරණ කමිටුවෙනුත් කතා කරලා අපි මේකට හොඳ දෙයක් කරමු.

ඒ අනුව මූලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව .සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණියගේ 06.31 යෝජනාව, ෆෝවුන් ගම්මානයේ සිට පොල්වත්ත කඩේ දක්වා දිවෙන අඩිපාර සකස් කර ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.32.සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණියගේ යෝජනාව.

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය:-**
**06.32.ගල්වත්ත ග්‍රාමයේ අබලන්වූ මාර්ග කොටස් පිළිසකර කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව .සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණියගේ 06.32 යෝජනාව, ගල්වත්ත ග්‍රාමයේ අබලන්වූ මාර්ග කොටස් පිළිසකර කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.33.සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණියගේ යෝජනාව.

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය:-**
**06.33.බෝපැත්ත පාරේ අංක 516 දරණ නිවස අසල ඇති පොදු ළිඳ සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඩී.ගයනී බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව .සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණියගේ 06.33 යෝජනාව,බෝපැත්ත පාරේ අංක 516 දරණ නිවස අසල ඇති පොදු ළිඳ සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.34. සභික එච්.ආරියදාස මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
**06.34.බුළුගහපිටිය චමින්ද බටුගෙදර මහතාගේ නිවසේ සිට සිරිමාන්න මහත්මියගේ නිවස දක්වා පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.ආරියදාස මැතිතුමාගේ 06.34 යෝජනාව, බුළුගහපිටිය චමින්ද බටුගෙදර මහතාගේ නිවසේ සිට සිරිමාන්න මහත්මියගේ නිවස දක්වා පාර සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.35. සභික එච්.ආරියදාස මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
**06.35.දන්දෙනිය පාර ABC මොන්ටිසෝරිය අසලින් දකුණට ඇති සෝමසිරි මහතාගේ නිවස ළඟින් ඩොක්ටර්ගේ නිවස දක්වා ඇති පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.ආරියදාස මැතිතුමාගේ 06.35 යෝජනාව, දන්දෙනිය පාර ABC මොන්ටිසෝරිය අසලින් දකුණට ඇති සෝමසිරි මහතාගේ නිවස ළඟින් ඩොක්ටර්ගේ නිවස දක්වා ඇති පාර සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.36. සභික එච්.ආරියදාස මැතිතුමාගේ යෝජනාව.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
**06.36.දන්දෙනිය පාරෙන් වමට ඇති ආශා මහත්මියගේ ගේ ළඟින් ඇති කජුගහවත්ත පාර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.** (ආශා මහත්මිය කියන එක ශාමා මහත්මිය ලෙස නිවරදි විය යුතුය.)

**සභික ඩී.ගයානි බුද්ධිකා මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික පී.මාලින්ද මුදන්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ආරියදාස මන්ත්‍රීතුමනි ඇත්තටම සත්භාවයෙන් සතුටුයි අපේ ගමට සේවයක් කරන්න පුළුවන්නම්.යකුදාගොඩ වසමට මන්ත්‍රීවරු 4 ක් ඉන්නවා.ඇත්තටම වැඩක් වෙලා නැත්තේ මේ වසමට විතරයි.ඇත්තට ම ඊළඟ සභා වාරේ වෙනකොට කිසිම දෙයක් වුණේ නැත්නම් අපි 3 දෙනා ඊළඟ සභවාරේ කළු පටි පැළඳගෙන ඇවිත් විරෝධතාවය ප්‍රකාශ කරනවා ආරියදාස මන්ත්‍රීතුමාට.ඒ නිසා සභාපතිතුමා මොනව හරි දෙයක් කරලා දෙන්න මේ වසමට.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එච්.ආරියදාස මැතිතුමාගේ 06.36 යෝජනාව, දන්දෙනිය පාරෙන් වමට ඇති ශාමා මහත්මියගේ ගේ ළඟින් ඇති කජුගහවත්ත පාර සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.37. සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ මැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ මැතිතුමා:-**
**06.37.පසුගිය දිට්වා අපදා තත්වය හේතුවෙන් වලව්ට දහම් මාවතේ කිරිඅතුල දක්වා මාර්ගයේ කැඩී ගිය කොටස සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඩී.නිරෝෂිකා කැළුම්සිරි මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගරු සභාපතිතුමනි දිට්වා ආපදාව නිසා හානියට පත් වුණු ඒවා තියෙනවද?

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දිට්වා ආපදා වෙන් මේ මාර්ගය අසල තිබුණු ගසක් කඩා වැටීමෙන් අඩි 50 ක වගේ කොටසක් ගැව්ලා ගිහිල්ලා තියෙනවා.ඒ නිසා අඩි 10 ක වගේ මාර්ගයක් අඩි 6 කට වගේ පටු වෙලා තියෙනවා.ඒ නිසා ඒ කැඩී ගිය කොටස සංවර්ධනය කරලා දෙන්න කියලා මං යෝජනා කරන්නේ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, දිට්වාවලට වෙනම ප්‍රතිපාදන වෙන් වුණානේ මං හිතන්නේ.ආපදා කටයුතු සඳහා මධ්‍යම ආණ්ඩුවෙන් වෙන ම මුදල් වෙන් කළා.පාරවල් වලට වෙනම වෙන් කළා.

**සභාපතිතුමා :-**
ඇත්තටම අපිට ඇහැලියගොඩ ගෙවල් දෙකයි ආපදා නිසා හානියට පත් වුණේ.ඒ ගෙවල් දෙකටත් ලක්ෂ 50 ගාණේ මුදල් වෙන් කර ගන්න අපිට පුළුවන් වුණා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ මැතිතුමාගේ 06.37 යෝජනාව,පසුගිය දිට්වා අපදා තත්වය හේතුවෙන් වලව්ට දහම් මාවතේ කිරිඅතුල දක්වා මාර්ගයේ කැඩී ගිය කොටස සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.38. සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමාගේ යෝජනාව.

**සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
**06.38බොරළුව ජල ව්‍යාපෘතියේ අවසන් කළ යුතු කොටස් ඇස්තමේන්තු සකස් කොට නිම කිරීමට යෝජනා කරමි.**

**සභික ජී.රංජිත් වික්‍රමසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, බොරුව ජල ව්‍යාපෘතිය 2016 ආරම්භ කරපු එකක්.භාගෙට හදලා නවත්තපු ව්‍යාපෘතියක්.පළාත් සභා ප්‍රතිපාදන යටතේ ලක්ෂ පනස් අට දාහකින් ප්‍රාදේශිය සභා අධීක්ෂණය හා ප්‍රජා ජල නිලධාරීන්ගේ අධික්ෂණය යටතේ කළ ව්‍යාපෘතියක්.මේකෙ පැනල් බෝර්ඩ් එක සවුත්තු වෙලා.මේකෙ ටැංකියක් ගහලා තිබ්බට ටැංකියට යන්න පඩිපෙළක් ගහලා තිබ්බේ නෑ.ළිද හදලා තිබ්බා.ඒකෙ වහලකුත් ගහලා තිබ්බාඒක දැන් දිරා ගිහින්.ඒ නිසා මෙම ව්‍යාපෘතියේ පවතින අඩුපාඩු ටික සකසා ගැනීමට ප්‍රාදේශිය සභා ප්‍රතිපාදනවලින් අවශ්‍ය කටයුතු කර දෙන මෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ ව්‍යාපෘතිය මම පටන් ගත්තු එකක්.මේක භාගෙට කරන්න හේතුව ඒ ගමට අපි ඡන්දෙ ඉල්ලන්න යන කොට,(ඝෝෂාව) ඒ ගම දුෂ්කර ගම්මානයක් සභාපතිතුමනි.ඒ ගමේ අය පොඩි මුට්ටිවලට තමා වතුර ගෙනිහින් තිබ්බේ.මං කිවුවා අපේ නමින්ද මන්ත්‍රිතුමා දිනුවොත් ගමට වතුර දෙනවා කියලා.නමින්ද මන්ත්‍රිතුමයි මමයි කන්ට්‍රැක් එක කළේ.ඕක තමා මම කරපු පළමු හා එකම කන්ට්‍රැක් එක.මමයි නමින්ද මන්ත්‍රිතුමයි පළාත් සබා ගිහිල්ලා සල්ලි ඉල්ලුවහම කීයක් ඕනද කියලා ඇහුවා.අපි කිවුවා ලක්ෂ 7 ක් ඇති කියලා.ලක්ෂ 7 ක් දුන්නා.එකෙන් පුළුවන් උපරිම හොද බට ගිහින් දැම්මා.ගේජ් එක 10 ද කොහෙද ගිහින් දාලා තියෙන්නේ.හෝස් පවර් 15 ඇති කිවුවා.හෝස් 15 වැඩ කරද්දි කාලයක් යද්දි විනාශ වෙන්න පුළුවන් කිවුවා.මං කිවුවා එහෙම බෑ කියලා.ඊට පස්සේ හෝස් පවර් 20 හොදම එකක් ගිහින් දැම්මා.16 කම්බි දාලා හොදටම ටැංකිය හදලා තියෙනවා.නමුත් සභාපතිතුමා ඒ ගමේ ගොඩක් අය TO ලා වෙන්න ගියා.මම යමක් කරා වැඩක් කරාට පස්සේ අපට මුදල් දෙන්න පරක්කු වුණා.TO මහත්තයා ඇස්තමේන්තු කරලා සල්ලි පාස්වුණා.එයාල වැලි දුන්නා ශ්‍රමය දුන්නා.නමුත් දෙසැම්බර්වලට කලින් දාන්න ඕන හින්දා වැලිත් දැම්ම TO මහත්තයා ඇස්තමේන්තුවට.මට 17% කොමිෂන් කොහොමත් තියෙනවනේ.ලක්ෂ 7 න් 3.5 ක් මට අතට සල්ලි දුන්නා.මට සල්ලි දෙන්න පරක්කු වුණා.මගෙ තාත්තා නැති වුණා.මම කිවුවා මගෙ තාත්තට පිං සිද්ද වෙන්න මට සල්ලි එපා කිවුවා.ඊට පස්සේ සිරිපාල කිරිඇල්ල ඇමතිතුමා ගාවට ගියා.මම කිවුවා මම කරපු වැඩක්.මට තේරුණා අසාධාරණයක් කියලා.කවුරුවත් සල්ලි පාස් කළේ නෑ.මේ ඇහැලියගොඩ අපි යමක් කරලා එක රුපියලක් වංචා කරලා නෑ දේශපාලනය කරලා.දැන් නදුන් මන්ත්‍රිතුමා මැදිහත් වුණාට පස්සේ දැන් ඒක කරගෙන යනවා.කිසිම මොහොතක මට කියන්නෑ සුමිත් මන්ත්‍රිතුමා එන්න කියලා.මට එන්න එපා කියලා එහෙන් කිවුවලු.ඇත්තට ම සභාපතිතුමා එතුමා කරන මේ කර්තව්‍ය ඉතාමත් වටිනවා.ඒ නිසා අපේ සභාවෙන්

එතුමා යම් ප්‍රතිපාදනයක් ඉල්ලනව නම් ඒක ලබා දීලා මේ ගමට වතුර ලබා දෙන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සුමිත් මන්ත්‍රීතුමා ඉතා කැපවීමෙන් වැඩ කරපු මන්ත්‍රීවරයෙක්.ඇත්තටම සුමිත් මන්ත්‍රීතුමා ලොකු මහන්සියක් ගත්තා සභාපතිතුමනි.ඒ ව්‍යාපෘතිය සම්බන්ධව සුමිත් මන්ත්‍රීතුමාගේ උනන්දුව තිබ්බට ඒ කොන්ත්‍රාත් ක්‍රමවේදය පිළිබඳව එතුමට අවබෝධයක් තිබුන්ණෑ එතුමට.ඒක තමා හේතුව මං හිතන්නේ.ඇත්තටම එතුමා ඒක හදවතින් ම කළා.ඒක වුණේ ගමේ මිනිස්සු හිතුවා ඒ ඔක්කොම සල්ලි මෙතුමා ගත්ත කියලා.ඔය වගේ ප්‍රශ්නයක් තමා මතු වුණේ.ඒ නිසා අපේ නදුන් මන්ත්‍රීතුමාට මුදල් වෙන් කරන්න කියලා මම ඔබතුමාගෙන් කරුණාවෙන් ඉල්ලා සිටිනවා.

**සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සුමිත් මන්ත්‍රීතුමාට කතා කරන් නැත්තේ ඇත්තටම එතන පොඩි ගැටලුවක් තියෙන නිසා.6.80 ක් මුදල් පාස් වෙලා තිබ්බා.සමිතියට තමා මුදල් ලැබිලා තියෙන්නේ.සමිතියෙන් ඕනේ ඒ කන්ට්‍රැක් කරන කෙනාට මුදල් ටික දෙන්න.නමුත් සුමිත් මන්ත්‍රීතුමාට ඒකෙන් දීලා තියෙන්නේ ලක්ෂ තුනහමාරක් වගේ.ඒ සමිතියේ ගිණුමේ තවමත් තියෙනවා ලක්ෂ 2.80 ක්.ඒ ව්‍යාපෘතියට වෙන් වුණු සල්ලි වලින්.ඒක දැන් අපිට ගන්නත් බෑ.ව්‍යාපෘතියට දෙන්නෙත් නෑ.සුමිත් මන්ත්‍රීතුමාව සම්බන්ධ කර ගන්නේ නැති හේතුව මං මේ පැහැදිලි කරන්නේ.ඇත්තටම වෙලා තියෙන්නේ ඇස්තමේන්තුව හදලා අදාළ කාල සීමාවේදි යවා ගන්න ඕන නිසා To හරි කනට්‍රක්ෂන් කෙනා හරි ගමේ අය ශ්‍රමයෙන් කරපු දේවලුත් බිලට දාල තමා යවලා තියෙන්නේ.ගමේ අය හිතන් ඉන්නේ අපෙන් වැඩ අරන් ඒ ශ්‍රමයට සරිලන සල්ලිත් ගත්තා කියලා.ඒ වගේ දෙපැත්ත සට්ටනයක් තියෙන්නේ.ඒකයි මං සුමිත් මන්ත්‍රීතුමාට කතා කරන් නැත්තේ.මම මුලින්ම එහෙ ගියපු වෙලේ මට මුලින්ම යෝජනාවක් ආවේ පලීගල පහලගම නැදුරන යන වසම් 3 ම අයත් ජල ව්‍යාපෘතියක් ප්ලෑන් කරලා තියෙනවා ගෙවල් 52 යන්න.අදියර දෙකකින් යන්න.ඉතින් ඒකෙනුත් වැඩි හරියක් ඉන්නේ නැදුරන වසමට.පලීගල වසමේ ව්‍යාපෘතිය කරාට.මං කතා කළේ නැත්තේ ගමට ගිහාම ගමේ ඇති වෙච්ච විරෝධය නිසා.එයාලගෙ අදහස වෙනස්.ඇත්තට ම වෙලා තියෙන්නේ වෙන එකක්.

**සභික ඒ.ඩී.සුමිත් ප්‍රියංකර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එතන්ට ගිහින් බැලුව නම් මෝටරය දෙලක්ෂ ගානක්.බටවලට එක්ලක්ෂ ගාණක්.ටැංකියටත් දෙලක්ෂ ගාණක්.එතනම ලක්ෂ ගාණ ගිහින් ඉවරයි.මට 17% කොමිෂන් එනව නම් මට ඒකත් නැති තරම්.To මහත්තයා දෙසැම්බර් මාසෙට කලින් දාන්න ඔන කිවුවට පස්සේ, මට ඇත්තටම සුජීව මන්ත්‍රීතුමා කිවුව වගේ මට කන්ට්‍රැක් සම්බන්ධව තේරුමක් නෑ.ඇත්තටම ඒගොල්ලෝ හිතුවේ මං ගසා කන්න හැදුවා කියලා.මට සල්ලි හම්බුන්නෑ ඊට පස්සේ.මගෙ තාත්තා නැති වුණා.මගෙ තාත්තට පිං සිද්ද වෙන්න මට ඒ සල්ලි එපා කියලා මම ඒ වෙලාවෙ ම ප්‍රකාශ කළා.මං ඊට පස්සෙ ඡන්දෙ ඉල්ලන්නවත් ගියෙ නෑ.මගෙ තරහකුත් නෑ.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික කේ.ඩබ්.ඒ.නදුන් සමීර මැතිතුමාගේ 06.38 යෝජනාව,බොරළුව ජල ව්‍යාපෘතියේ අවසන් කළ යුතු කොටස් ඇස්තමේන්තු සකස් කොට නිම කිරීම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.39. සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ යෝජනාව.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
**06.39.ඇහැලියගොඩ වත්ත ටෙලිස්පෝඩ්වත්ත පන්නිල මාර්ගය කාණු දමා වතු නිවාස දක්වා ඉතිරි මාර්ග සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ 06.39 යෝජනාව,ඇහැලියගොඩ වත්ත ටෙලිස්පෝඩ්වත්ත පන්නිල මාර්ගය කාණු දමා වතු නිවාස දක්වා ඉතිරි මාර්ග සංවර්ධනය කිරීම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.40. සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ යෝජනාව.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
**06.40.හතරකෝරල වත්ත හරහා තනිපොල්ගහවත්ත ගම්මාන වලින් බැස යන කාණු පද්ධතිය ශුද්ධ කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ 06.40 යෝජනාව,හතරකෝරල වත්ත හරහා තනිපොල්ගහවත්ත ගම්මාන වලින් බැස යන කාණු පද්ධතිය ශුද්ධ කර සංවර්ධනය කිරීම සඳහා වු යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.41. සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ යෝජනාව.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
**06.41.මෝරගල පැල්පිටිය මාර්ගයේ ඉමිතියාස් මහතාගේ නිවස දක්වා මාර්ග ක්‍රමානුකූලව සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේක පැල්පිටිය කොට්ඨාශයට අයිති මාර්ගයක්.ගෙවල් 6 ක් විතර තියෙන්නේ ඒ ගෙවල් වලට යන්න පාරක් නෑ.වෙන ඉඩමකින් යන්නේ.ඒ මිනිස්සු ඒ පාර දෙනවා.කාණුවක් තියෙනවා, ඒ කාණුවෙන් එහායින් තමා යන්න තියෙන්නේ.දැනටත් එයාල ගමන් ගන්නේ වෙන ඉඩමකින්.ඒ මිනිස්සු බොහොම අපහසුවෙන් තමා යන්නෙ එන්නේ.ඒ නිසා ඒ මාර්ගය ඉතා ඉක්මනින් සංවර්ධනය කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික ඒ.එස්.එම්.මිස්බාහ් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඇත්තටම මුන්සීර් මන්ත්‍රීතුමා කිවුව වගේ අසල්වැසි මිනිසුන්ගෙන් පාරක් ඉල්ලා තමා ඒ අය යන්නෙ එන්නේ.ඒ අයට පාරක් තියෙනවා.ඒ පාරෙන් නෙමේ ඒ අය යන්නේ.ඒ නිසා ඒ මිනිසුන්ට යන්න එන්න පාලමක් හරි දාල පොඩි පාරක් හදලා දෙන්න කියලා ඒ මිනිස්සු මටත් කිවුවා.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, යකුදාගොඩ කොට්ඨාශයට මන්ත්‍රීවරු 5 ක් හිටියට, මෝරගලටත් ඉන්නවා ලොකු මන්ත්‍රීවරු කොටසක්.මං හිතුවේ උපසභාපතිතුමාගෙන් ඒ යෝජනාව එයි කියලා.මොකද අපි ප්‍රජා ශක්ති එකේදී අපි පාරවල් ටික හදන කොට ඔය පාර එහෙම දාල තිබ්බේ.ඔබතුමා දැනුවත්ද? අපි වෙනද යෝජනාවක් දැම්මහම කියන්නේ ඕක දාල තියෙන්නේ කියලා.උපසභාපතිතුමා තමා ඒක හැඩල් කරන්නේ.මම දන්නෑ ඔබතුමාටත් ඒක කියලද කියලා.කෙසේ වෙතත් හොදයි ඒක.උපසභාපතිතුමයි මුන්සීර් මන්ත්‍රීතුමයි එකතු වෙලා කොහොම හරි මෝරගල ගොඩ ගන්න බලන්න.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමාගේ 06.41 යෝජනාව,මෝරගල පැල්පිටිය මාර්ගයේ ඉමිතියාස් මහතාගේ නිවස දක්වා මාර්ග ක්‍රමානුකූලව සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.42. සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහමැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
**06.42.විලේගොඩ බෝපැත්ත මාර්ගයේ කාණු පද්ධතිය බැකෝ යන්ත්‍රයක් යොදා සුද්ද කිරීමට යෝජනා කරමි.**

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහමැතිතුමාගේ 06.42 යෝජනාව,විලේගොඩ බෝපැත්ත මාර්ගයේ කාණු පද්ධතිය බැකෝ යන්ත්‍රයක් යොදා සුද්ද කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.43. සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ යෝජනාව.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
**06.43.නැ/විලේගොඩ ප්‍රජා ශාලාව අසල රජයේ ඉඩම් කොටසක දේශීය ඔසු උයනක් සෑදීමට යෝජනා කරමි.**

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මං අහන්න කැමතියි ඔසු උයන කොතනද නිර්මාණය කරන්නේ කියලා.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, නැගෙනහිර විලේගොඩ අපේ ප්‍රජා ශාලාව තියෙනවා.ඒ ප්‍රජා ශාලාව පල්ලෙහා තියෙන භූමිය ප්‍රයෝජනයක් ගන්නෑ.කැළෑ වැවිලා තියෙන්නේ.ඒක මං හිතන්නේ බිසෝදොළ එක්සත් සුභසාධක සමිතිය නිලධාරීන්ගෙන් තමා මට මේ ඉල්ලීම ලැබුණේ.එයාල කිවුවා එතන ඔසු උයනක් නිර්මාණය කරන්නම් කියලා.එතන තමා රජයේ නිලධාරීන්ගේ කාර්යලත් තියෙන්නේ.ඒක එයාලට බලා ගන්න පුළුවන්.අපිට දේශීය වශයෙන් ඔසු අපට සොයා ගන්න අපහසුයි.ඒ නිසා තමා ඒ යෝජනාව ගෙනැල්ලා තියෙන්නේ.මං හිතන්නේ මේකට අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලෙයෙනුත් අවසර ගත යුතුයි.මම සභාවට

යෝජනාවක් වශයෙන් තමා ගෙනාවේ.මේක සභාවෙන් කරන්න ඕන් නෑ.ගමේ අයගේ ශ්‍රමයෙන් එයාල කරනවා.යෝජනාවක් විදිහට අනුමත කර ගන්න තමා දැම්මේ.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, යෝජනාව හොඳයි .ප්‍රජා ශාලාව හදන කාළේ මම තමයි වසමේ හිටියේ.යට තට්ටුව හදලා ඉවර වෙලා උඩ තට්ටුව හදන්න විදේශාධාර ගෙන්න ගෙන ඒ කටයුත්ත කලෙත් මම.ඒතනදී මං හිතන්නේ දැනට නැගෙනහිර විලේගොඩට රජයේ ඉඩම් නෑ.ඔය ටික තමා තියෙන්නේ.එතන මං හිතන්නේ එතන බලන්න ඕනේ, ප්‍රජා ශාලාවට කියලා තමා අපි එතන බිම වෙන් කර ගෙන තිබුණේ.එතන නිරවුල්භාවය බලන්න කියලත් ඉල්ලීමක් කරනවා.රජයේ තියෙන ඔය පුංචි කොටසෙත්, ඊට එහා පැත්තෙ තියෙන කොටසෙත් ගිය රජයේ කාලේ හෝටලයක් හදලා, ප්‍රාදේශිය ලේකම්තුමාගේ අනුමැතිය ඇතිව වැඩ කොටසක් කෙරෙන්න ගියා.එතන ඉන්න ජනතාවගේ විරෝධතාවය මැද ඒක මං හිතන්නේ නැවතුනා.ඔය කොටස විතරමයි තියෙන්නේ රජයේ ඉඩමක් විදිහට ඒ වසමට.ඒ නිසා ඒගැන බලලා කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ඒ යෝජනාව හොඳයි.නමුත් ඒ භූමිය ක්‍රිඩා පිට්ටනියකට වෙන් කරන්න අපේක්ෂා කරලා තියෙනවා.ඒකට අවකාශය සලසා ගන්න පුළුවන් විදිහට ඔසු උයන නිර්මාණය කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ ගොඩනැගිල්ල ගැන කතා කරනකොට අපේ ගරු ධනරත්න මන්ත්‍රීතුමා මැදිහත්වෙලා, සමන්සිරි මන්ත්‍රීතුමා ඒකට සාක්ෂි දරයි.ඒය සිහිපත් කරමින් ජනාධිපතිතුමාටත් ඔබතුමාටත් ලිපියක් එවලා තියෙනවා.මටත් එවලා තියෙනවා.මං ඒක සභාගත කරන්නම්.ඔබතුමා අවශ්‍ය රාජකාරී කරන්න.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමාගේ 06.43 යෝජනාව,නැ/විලේගොඩ ප්‍රජා ශාලාව අසල රජයේ ඉඩම් කොටසේ දේශිය ඔසු උයනක් සෑදීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.44. සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ යෝජනාව.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ:-**
**06.44.කණුකැටිගොඩැල්ල මාර්ගය ලලිත් කඩේ අසල සිට වෙල පාර පැති බැම්ම සහිතව ජයතිලක මහතාගේ නිවස දක්වා කොන්ක්‍රීට්කිරීමට යෝජනා කරමි.**

**සභික එන්.එල්.රුවන්සිරි විමලරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ 06.44 යෝජනාව,කණුකැටිගොඩැල්ල මාර්ගය ලලිත් කඩේ අසල සිට වෙල පාර පැති බැම්ම සහිතව ජයතිලක මහතාගේ නිවස දක්වා කොන්ක්‍රීට් කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.45. සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ යෝජනාව.

**සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණිය:-**
**06.45.මීටිපොළ පාසල් වත්ත මාර්ගය ආරම්භයේ සිට පැති බැම් සහිතව සංවර්ධනය කිරීමට යෝජනා කරමි. (මීටර් 80**

**සභික කේ.ජී.වසන්ත සේනාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික එස්.ඒ.ටී.එස්.චමිලා සූරියආරච්චි මැතිණියගේ 06.45 යෝජනාව,මීටිපොළ පාසල් වත්ත මාර්ගය ආරම්භයේ සිට පැති බැම් සහිතව (මීටර් 80 ක්) සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.46. සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමාගේ යෝජනාව.

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
**06.46.යකුදාගොඩ ගම්මානයේයාය වෙල්යාය සඳහා හාලි ඇළ කුඹුර අසලින් ට්‍රැක්ටර් පැන්නුමක් ඉදි කර සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මේකට මං දන්න කාලෙ ඉදන් සල්ලි පාස් වෙලා කියලා කියනවා.අපේ අනුර කුමාර ජනාධිපති වුණ දවස්වල ඉදලම මුදල් පාස් වෙලා තියෙන්නේ.පාස් වුණා කිව්වට වැඩක් නෑ, වැඩේ වෙලා නෑ.(ඝෝෂාව)

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමාගේ 06.46 යෝජනාව,යකුදාගොඩ ගම්මානයේයාය වෙල්යාය සඳහා හාලි ඇළ කුඹුර අසලින් ට්‍රැක්ටර් පැන්නුමක් ඉදි කර සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
6.47. සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමාගේ යෝජනාව.

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
**06.47.ඇරැපොල ගොඩැල්ලවත්ත (බ්ලොක් ගල් වැඩපල) අසල මොන්ටිසෝරිය පාර ඇලගාව වත්ත දක්වා සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික එච්.එස්.එල්.දීපාල් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමාගේ 06.47 යෝජනාව,ඇරැපොල ගොඩැල්ලවත්ත (බ්ලොක් ගල් වැඩපල) අසල මොන්ටිසෝරිය පාර ඇලගාව වත්ත දක්වා සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.
**සභාපතිතුමා :-**
6.48. සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමාගේ යෝජනාව.

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
**06.48.මිටිපොල රුක්හේන වත්ත මාර්ගය සංවර්ධනය කිරීමට යෝජනා කරමි.**

**සභික පී.ඒ.කේ.දිල්රුක්ෂි රණසිංහ මැතිණිය:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ මාර්ගය මිටිපොල බොධිය අසල සිට යන මාර්ගයක්.මේක නදුන් මන්ත්‍රීතුමාටත් වැදගත් වන මාර්ගයක්.මොකද මේක සම්බන්ධ වෙන්නේ පලීගලට.මේ මාර්ගය ඉතා අබලන් තත්ත්වයේ පසු වෙන්නේ.ඒ නිසා එම මාර්ගය ඉතා කඩිනමින් සංවර්ධනය කර දෙන මෙන් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ මාර්ගය හැදිය යුතුම මාර්ගයක්.මං ක්‍රිෂ්ණා මන්ත්‍රීතුමියගේ සහෝදරියගේ අවමංගල්‍යට ගියා.මේ ඇත්තම කතාවක් කියන්නේ.එතන හිටපු කට්ටියක් කිව්වා මියනකොලතැන්නෙන් ගිහින් මිටිපොලට යන්න පුළුවන් කියලා.මං ගියා.(ඝෝෂාව)මං දැන් කෑ ගහනවා කවුරුවත් නෑ.මං ප්‍රියන්ත මන්ත්‍රීතුමාට කෝල් එකක් ගත්තා.එතුමා කිව්වා මං වැඩ. කට්ටියක් එවන්නම් කියලා.පස්සෙ මං දිලීන් මන්ත්‍රීතුමාට ගත්තා.ඊට පස්සෙ දිලීන් මන්ත්‍රීතුමා ආවා.අනේ සභාපතිතුමා මේ පාර හදලා දෙන්න.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ප්‍රජා ශක්තිවලින් මිටිපොලට ලක්ෂ 10 ක් වෙන් වුණා. ඒකෙන් ඒ මාර්ග කොටසත් තියෙනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභික පී.මාලින්ද මුදන්නායකමැතිතුමාගේ 06.48 යෝජනාව,මිටිපොල රුක්හේන වත්ත මාර්ගය සංවර්ධනය කිරීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සහා සම්මත විය.

**සභාපතිතුමා :-**
**හදිසි යෝජනා 01**
**බේරුවාන කසල කළමණාකරණ මධ්‍යස්ථානයට දිනපතා එකතුවන කසල තොගය තල්ලු කිරීම සඳහා ජපානයේ භාවිතා කර මෙරටට ආනයනය කරනු ලබන pc 30 ප්‍රමාණයේ ස්කවේටර් යන්ත්‍රයක් මිලදී ගැනිමට මම යෝජනා කරමි.**

**සභික පී.මාලින්ද මුදන්නායක් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

**සභික සුජීව විජේසූරිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ සභාවේ වමයි දකුණයි කියලා තියෙනවනේ.මේ වගේ යෝජනා ගෙනාවම අපි ඔක්කොම සතුටු වෙනවනේ.මම තමයි ඔය යෝජනාව ගෙනාවේ මුදල් කමිටුවේදී.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, අපි පළවෙනි සභාවාරෙදිම කිව්වා අපි පොඩි ස්කැවේටරයක් ගමු කියලා.කොහොම හරි වාසනාවන්ත යුගයක් උදා වෙමින් පවතිනවා කියලා අපිට ඉඟි පහළ වෙනවා.(ඝෝෂාව)

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ හදිසි යෝජනා 01 යටතේ ,බේරුවාන කසල කළමණාකරණ මධ්‍යස්ථානයට දිනපතා එකතුවන කසල තොගය තල්ලු කිරීම සඳහා ජපානයේ භාවිතා කර මෙරටට ආනයනය කරනු ලබන pc 30 ප්‍රමාණයේ ස්කවේටර් යන්ත්‍රයක් මිලදී ගැනීම සඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**හදිසි යෝජනා 02**
**2025.12.31 දිනට අදාළව ඉදිරිපත් කළ අවසන් ගිණුම් වාර්තාව මහා සභාවට ඉදිරිපත් කරමි.**
මේ යෝජනාව එනකොට අපි න්‍යාය පත්‍රය යවලා තිබ්බේ.ඒ නිසා තමා මේක හදිසි යෝජනාවක් විදිහට ඉදිරිපත් කළේ.

**උපසභාපති යූ.එල්.එන්.මහේෂ් රත්නායක මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසන විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව සභාපති බන්දුලසේන දුණුවිල මැතිතුමාගේ හදිසි යෝජනා 02 යටතේ ,2025.12.31 දිනට අදාළව ඉදිරිපත් කළ අවසන් ගිණුම් වාර්තාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

**සභාපතිතුමා :-**
**07.01.2026.02.09වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.01 යටතේ ඉදිරිපත් කළ 2026.02.09වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාවමහා සභා අනුමැතියසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.02. 2026.02.09වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.02 යටතේ ඉදිරිපත් කළ 2026.02.09වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාවමහා සභා අනුමැතියසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.03.**2026.02.20 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාවමහා සභා අනුමැතියට යෝජනා කරමි.

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.03 යටතේ ඉදිරිපත් කළ 2026.02.20 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා කමිටු වාර්තාවමහා සභා අනුමැතියසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.04. 2026.02.20 වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.04 යටතේ ඉදිරිපත් කළ 2026.02.20 වන දින පැවති ප්‍රසම්පාදන (මිලදී ගැනීම් සම්බන්ධ) කමිටු වාර්තාවමහා සභා අනුමැතියසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**07.05. 2026.02.02වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි**

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 07.05 යටතේ ඉදිරිපත් කළ 2026.02.02වන දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව මහා සභා අනුමැතියසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය

**සභාපතිතුමා :-**
**07.06.පරිසර හා පහසුකම් කමිටුව - නොපැවැත්විණි.**

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, ගිය වර පරිසර හා පහසුකම් කමිටුවේ හිටියේ අපේ මාලින්ද මුදන්නායක මන්ත්‍රීතුමා.වැඩක් නෑ කියලා තමා අයින් කළේ.දැන් මේක පත්වෙලත් මාස තුනක් වෙනවා වැඩ කරන් නෑ.එක මාසයයි හම්බෙලා තියේන්නේ. මේව ගැන ඔබතුමා පොඩ්ඩක් බලන්න.

**සභාපතිතුමා :-**
**08. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ, එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම.**

**08.01.2026පෙබරවාරිමස ආදායම් වියදම් වාර්තාවමහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එම්.එම්.එම්.මුන්සීර් මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 08.01 යටතේ ඉදිරිපත් 2026පෙබරවාරිමස ආදායම් වියදම් වාර්තාවමහා සභා අනුමැතියසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**08.02.2026පෙබරවාරි මස හිඟ ආදායම් වාර්තාව මහා සභා අනුමැතියට යෝජනා කරමි.**

**සභික එච්.ආරියදාස මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව මුලාසනය විසින් සභාවේ එකඟතාවය විමසීමෙන් අනතුරුව, 08.02 යටතේ ඉදිරිපත් කළ.2026පෙබරවාරිමස හිඟ ආදායම් වාර්තාවමහා සභා අනුමැතියසඳහා වූ යෝජනාව මහා සභාවේ ඒකමතිකව සභා සම්මත විය.

**සභාපතිතුමා :-**
**09.සභිකවරුන්ගේ පෞද්ගලික පැහැදිලි කිරීම්.**

**සභාපතිතුමා :-**
මේ අවස්ථාවේදී මං ඉල්ලා සිටිනවා එක සභිකයෙක් එක් අවස්ථාවක් ලබා ගන්නා ලෙසට.

**සභික දිලීන් කරුණාපාල මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මේ පුනරුද ආණ්ඩුව ආවට පස්සේ හිතුවා විශේෂයෙන් ම අහැලියගොඩ ජනතාවගේ ජීවන තත්ත්වය උසස් වීමක් වෙයි කියලා.නමුත් ඊයෙ රෑ ආව කණගාටුදායක පුවතත් එක්ක දැන් අපිට තේරෙනවා මේ ආණඩුවට මේ ජනතාව ගොඩ ගැනීමේ ක්‍රියාමාර්ගයක් නෑ කියලා.මිල සූත්‍රයයි, තෙල් මිල අඩු කරන්න කියලා පාරට බැහැලා උද්ඝෝෂණ කරලා ආණ්ඩු විනාශ කරන්න හදපුවයි.ආර්ථික අර්බුද නිර්මාණය කරන්න හදපුවයි.හැබැයි අද වෙන කොට ඩීසල් රුපියල් 22 කිනුත්, පෙට්‍රල් රුපියල් 24 කිනුත් වැඩි වෙලා තියෙනවා.මේක සමහර තැන්වල මම දැක්කා මේ ආණ්ඩු හිතවාදී මිනිස්සු විසින් අනික් රටවල් එක්ක සංසංදනය කරලා ඒරටෙත් මෙහෙමයි මේ රටෙත් මෙහෙමයි කියලා සිල්ලර ක්‍රමයට මේක නිවරදි කරන්න හදනවා.හැබැයි අපි විපක්ෂයක් විදිහට එකතුවෙලා ඒ නායකයෝ කිව්වා මෙන්න මේ වගේ අර්බුදයක් තියෙනවා කියලා.අපි හිතුවෙවත් නැති වෙලාවක ඛණිජතෙල් නීතිගත සංසංථාව නිවේදනයක් නිකුත් කරමින් දවස් 37 කට ප්‍රමාණවත් තෙල් තියෙනවා කියලා.ඒ වෙලේ ජනතාව කලබල වෙලා තෙල් පුරව ගන්න උත්සහ කළා.මම ඔබතුමාවත් දැනුවත් කළා ඇහැලියගොඩ මෙහෙම යන්න දෙන්න එපා මොකක් හරි කරන්න කියලා.හැබැයි දැන් අපිට අවස්ථාව තියෙනවා අපේ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් මම මේ ඔවුන් කියන දේ කියන්නෙ.ඔවුන් කියන්නේ මේ තියෙන ටික හරි කළමණාකරණය කරන්නතාම මේ ආණ්ඩුව සතුව ක්‍රමවේදයක් නෑ.ඊයේ මේ තෙල් මිල ඉතා විශාල ප්‍රමාණයකින් තෙල් මිල වැඩිවීම තුළ අහිංසක මිනිසුන් තමයි මේකෙන් පීඩාවට පත් වෙන්නේ.ලබන මාසේ සිංහල දෙමළ අලුත් අවුරුද්ද එනවා.එතනදිත් ලොකු පීඩාවට පත්වෙන තැනක තමා අපි ඉන්නේ.හැබැයි දැන්වත් අපි අදහසක් විදිහට කියන්නේ QR ක්‍රමය හරි සලාක ක්‍රමය හරි, ඔබතුමාත් වාමාංශික ව්‍යාපාරය, අපිත් වාමාංශික ව්‍යාපාරය.ඒ සලාක ක්‍රමය කියන එකඅපේ දේශපාලනය තුළ තියෙනවා.මේ සලාක ක්‍රමය මගින් තියෙන තෙල් සම්පත් පරිස්සම් කර ගෙන කාර්යක්ෂමව කළමණාකරණය කරන්න අවශ්‍යතාවය තියෙනවා.ඒ කාරණාව මං මේ වෙලාවේ මතු කරනවා.පුළුවන් නම් ඔබතුමාලා ඔබතුමන්ලාගේ නායකයන්ට ගිහින් කියන්න.මාර්තු 8 වෙනිදා ගිහින් බොරු කියලා කාන්තාවෝ ටික රවට්ටගෙන ගිහිල්ලා රැස්වීම් තිබ්බට වැඩක් නෑ.විශේෂයෙන් ම සිද්ධියක් වෙලා තියෙනවා අපිට වාර්තා

වෙනවා ඇහැලියගොඩ වත්තේ ගිහිල්ලා දැනටම පාස් වෙලා තියෙන ගෙවල් ටික, වෙ විදිහට මොකක් ද කරනවා කියලා කාන්තාවො ටික එකතු කරලා වෙනම රුස්වීම් තියලා තමා මේ කාන්තා දිනේ සඳහා කාන්තාවන් අරගෙන ගියේ.ඒක එච්චර හොඳ දේශපාලන සංස්කෘතියක් නොවේ.අපි එහෙම වැරදි දේශපාලනයක් කළා නම්, ඔබ තමුන්නාන්සේලාට ඡන්දෙ දුන්නේ ඒ වැඩපිළිවෙළ නවත්වන්න.හැබැයි ඒක නැවතිලා තියෙනවා කියලා අපිට ඒක පේන්න නෑ.

අනිත් කාරණාව තමා තව සතියකින් මේ ප්‍රදේශයේ, මං දැක්කා ආරියදාස මන්ත්‍රීතුමා කියනවා මේ ප්‍රදේශයේ ජනතාවට ඉතාම දරුණු ජල හිඟයක් තියෙනවා කියලා.මං සභාපතිතුමා දැන ගන්න කැමතියි, ඒ සඳහා කුමක් හෝ වැඩපිළිවෙළක් දැන් සභාපතිතුමා හදල ද තියෙන්නේ?නැත්නම් වැඩපිළිවෙලක් සාකච්ඡා කරනවද? එහෙම නැත්නම් ජල සම්පාදන මණ්ඩලයත් එක්ක ප්‍රාදේශීය සභාව එකතු වෙලා අඩු ගාණේ සාකච්ඡාවක් තිබ්බද කියලා දැන ගන්න කැමතියි.මොකද මම නියෝජනය කරන ප්‍රදේශවලට මේ ජල හිඟය උග්‍රව බලපාන අවස්ථා තියෙනවා.

අනික තමා  වර්තමාන තත්ත්වය තුළ ලෝකයේ බලපෑම ලංකාවට එනවා.ලංකාවට ඒ තත්ත්වය බලපානවා කියන්නේ මේ ඇහැලියගොඩ ජීවත් වන ජනතාවටත් ඒ තත්ත්වය බලපානවා.දැනටමත් ඒ තත්ත්වය බලපාල තියෙනවා තෙල් මිල හරහා.තව ඉස්සරහට මෙන ආකාරයෙන් බලපාල තියෙනවද දන්නෑ.අපේ ගම්වල ඒ අරාබිකරයේ රැකියා කරන මිනිස්සු ඉන්නවා.තාම ඒයාල ආරක්ෂිතද කියන කාරණාව අපෙන් විමසනවා.හැබැයි අපිට ඒයාලගේ ආරක්ෂාව තහවුරු කරන්නවත් ඒයාල ගැන කතා කරන්නවත් අපිට අවස්ථාවක් හම්බෙලා නෑ.මම දැන ගන්න කැමතියි මේ ප්‍රදේශයේ පළවෙනි පුරවැසියා විදිහට මේ ප්‍රදේශයේ ජනතාව මැදපෙරදිග රැකියාවලට ගිහින් ඉන්නව නම් ඔවුන්ගේ ජීවිත සුරක්ෂිතභාවය ඇති කරන්න මොකක් හරි වැඩපිළිවෙළක් තියෙනව ද?ඒ ගැන පුළුවන් නම් අපිව දැනුවත් කරන්න.මොකද අපේ ගම්වල ඉන්නවා ඩුබායි ඊශ්‍රායල් කුවේට් ඒ රටවල රැකියා කරන අය.ඒ අයගෙ ගෙවල්වල අය අපෙන් විමසීමක් කරනවා, ඒ අයගේ ආරක්ෂාව ගැන.සමහර වෙලාවට ඒ අය සම්බන්ධ කර ගන්න බැරි අවස්ථා තියෙනවා කියලත් කියනවා.ඊට අමතරව ඒ අයගේ ජීවනෝපාය කරගෙන යන කොට මාස ගණන් පඩි හම්බෙලා නැති අයත් ඉන්නවා ඒ රටවල.මං දන්න විදිහට මාසයක් පඩි හම්බෙලා නැති අයගේ පවුල්වල අයත් ජීවත් වෙනවා අපේ ප්‍රදේශයේ.ඉතින් ඒ අය ගැන සකච්ඡාවක් කරලා තියෙනවද කියන කාරණාව ගැන මම මේ සභාවට මතු කරන්න කැමතියි.

**සභාපතිතුමා :-**
පළවෙනි කාරණාව QR කේතය.ඔයගොල්ලෝ දන්නවා 2022 – 2023 වගේ මේ රට බංකොලොත් වෙලා කිසිම යුද්ධයක් නැතිව, තෙල් නැතුව තමා QR කෝඩ් ගන්නේ.දැන් කිසිම QR කෝඩ් ඒකක් අවශ්‍ය නෑ.තෙල් මිල වැඩි වීම ලෝක වෙළඳපොළ තුළ මෙතෙක් ඉතිහාසයේ වැඩි ම, මෙතෙක් ඉතිහාසයේ භයානකම යුද්ධයක් තියෙනවා.ලෝක යුද්ධයක් තියෙන කොට තෙල් වැඩි වෙන ඒක සාමාන්‍ය දෙයක්.නමුත් තෙල් වැඩි වෙනවා කියලා QR කෝඩ් ගන්න අවශ්‍ය නෑ.තෙල් ඕන තරම් අපි දෙනවා.ඒ ගැන සහතික කරනවා.ඒ ගැන කිසිකෙනෙක් සැක හිතන්න ඒපා.

අනික තමයි මැදපෙරදිග තත්ත්වය.මැදපෙරදිග විතරක් නෙමේ ලෝකයේ සියලුම තැන්වල සිටින අපේ ශ්‍රීලාංකිකයෝ වාර්තාගත අන්දමින් තමාන්ගේ චේතන ඒවලා තියෙනවා.ඒ නිසා අපි ඒ ගොල්ලෝ රැක ගන්න ඕනේ.රැක බලා ගන්න ඕනේ.අන්න ඒ නිසාම අපි පැය 24 පුරා ම අංක ඉදිරිපත් කරලා තියෙනවා ඒ අයත් එක්ක අපි සම්බන්ධ වෙනවා.කතා කරනවා.පොඩි දෙයක් හරි වුණාහම අපි ඒ ගෙවල්වලට දන්වනවා.ඒ නිසා ඒ ජනතාව රැක බලා ගැනීම ජාතික ජනබලවේග ආණ්ඩුවේ ප්‍රමුඛතා කාර්යක් ලෙස සලකලා ඒ දේ කරනවා.ඒ ගැන කිසි ම කෙනෙක් පසු තැවෙන්න අවශ්‍ය නෑ.

වතුර ගැන කියන්න ඕනේ.වතුර නැති වෙන්නේ ඇහැලියගොඩ.අපේ පළාත ගත්තොත් වැඩිම කුඹුරු ප්‍රමාණයක් පුරන් වෙලා තියෙන්නේ ඇහැලියගොඩ.ඒක හොයා ගෙන යනකොට තේරුම් ගත්ත එකක් තමා අවිධිමත් බැකෝ පතල් ක්‍රමය.ඒක සඳහා මේ මාසේ 8 වෙනිදා අපේ උපසභාපතිතුමත් එක්ක කර්මාන්ත ඇමති සුනිල් හඳුන්නෙත්ති හා රත්නපුර දිස්ත්‍රික්කයේ ඉහළ නිලධාරින් සමඟ සාකච්ඡාවක් පැවැත්වුවා. ඒක නියාමනයකට යන්න ඕනේ කියලා.වතුර ප්‍රශ්නයත් ඒකට බලපෑවා.නමුත් මේ සභා අපි යෝජනා 8 ක් ඉදිරිපත් කළා.එකක් තමයි තලාවිටියේ ජල යෝජනා ක්‍රමය.ඒකෙ පොඩි පොඩි වැඩ ටිකක් තිබිලා දැන් ඒක කරගෙන යනවා.මං හිතන්නේ ඒක තව මාසයකින් දෙකකින් සිද්ධ වෙයි.ඊළඟට අපිට හදිසියෙන් කරන්න තියෙන්නේ සීතාවක ජල ව්‍යාපෘතිය.ඒකට විශාල මුදලක් යනවා.අනික තමයි බෙරුවාන වත්තේ අලුතින් වතුර නලයක් ඉදි කරලා, අපිට නිවෙස් කීපයකට අලුතින් වතුර දෙන්න පුලුවන් වුණා.අනිත් එක තමා අද උදේ අපි යෝජනා ස්ථිර කර ගත්තේ.දිවුරුම්පිටිය තියෙන ටැංකියෙන්, තව කොටසක් අපිට මීන්නාන ප්‍රදේශයට දෙන්න පුළුවන් වුණා.ජල ප්‍රශ්නයට සභාව නෙමේ ප්‍රමුඛතාවය කරන්නේ.ඒක කරන්නේ ජලාප්‍රවාහන අමාත්‍යාංශය.නමුත් ඒකෙන් අපිට ගැළවෙන්න විදිහක් නෑ.අපිත් ඒක සොයා බලන්න ඕනේ.අපිට ජල ටැංකි එකයි තියෙන්නේ.අපි ඇහැලියගොඩ ප්‍රදේශිය ලේකම් කාර්යාලයේ ලේකම් වන නිශාන්ත මැතිතුමත් එක්ක සාකච්ඡා කරලා ඒක අපිට අරන් දෙන්න කිව්වා.ඒතුමා ලිඛිතව ඒ ටැංකිය හා බවුසරය ලබා දීලා තියෙනවා.අපිට පුළුවන් ප්‍රමාණය ටැංකිවලින් හරි ඇදලා, අද සිට 21 දක්වා දිනපතා අපිට වතුර දෙන්න කියලා අපි ජල සම්පාදනයට දැනුම් දුන්නා.ඒ නිසා මේක කලමණාකරණය කරන්න පුළුවන් තරම් මහන්සි වෙනවා.

**සභික ආර්.වත්සලා නිෂාන්ති ධනරත්න මැතිණිය:-**
ගරු සභාපතිතුමනි,මුදල් කමිටුවේ තීරණයක් අරන් තිබුණා අලුතින් වීථි පහන් සඳහා කොකු ගන්න.ඒ නිසා මම ඉල්ලීමක් කරනවා පුළුවන් නම් දිගල්ල ගමට බල්බ් ටික දාලා දේන කියලා.ඒත් එක්කම සභාපතිතුමනි මම මීට පෙර යෝජනාවක් කළා මාන පඳුරුවලට ඉලුක් තෙල් ගහන්න.ටිකක් ගෙනැත් පරීක්ෂා කරලා බලමු කියලා.නමුත් ඒ යෝජනාව ඉවතට ගියා පරිසරික හේතූන් මත කියලා නොයෙක් ප්‍රශ්න ආවා.මං හිතන්නේ හොඳම උදාහරණය තමා බෝපැත්ත කනත්තට බෙහෙත් ගහලා තිබුණා.කනත්ත සුද්ද වෙලා හොඳටම තිබුණා.නමුත් දැන් පඳුරු දාලා ඊටත් වඩා හොඳට වැවිලා.මාස තුනක්වත් නෑ බෙහෙත් දාලා.මං නැවතත් ඒ

ඉල්ලීම කරනවා ඒ ඉලුක් තෙල් පොඩ්ඩක් ගෙනැල්ලා අපි පරික්ෂා කරලා බලමු කියලා.මං හිතන්නේ ඒකට ලොකු පරිසර හානියක් වෙයි කියලා හිතන්නැ.මොකද ඒක තෙලක්.ඊට අමතරව ඒක උක් වල කැලේ හැදෙන කොටලු ගහන්නේ.ඒ නිසා ඒක විෂ තෙලක් වෙන්න බෑ.ඒ නිසා ඒ ගැන නැවත සභාව දැනුවත් කරනවා.

ඒ වගේම අපි කීපවරක් ම කිව්වා සාම විනිසුරු දිවුරුම අපිට නිත්‍යානුකූල කරලා දෙන්න කියලා.අපිට සීල් ඒක තියෙනවා.නමුත් මේක නිත්‍යානුකූල නෑ කියලා තමා මම දැනුවත් වුණේ.සභාපතිතුමා ඒක දැනුවත් කරලා දිනයක් අරන් දීලා තමා ඒ ප්‍රතිඥාව කරන්න ඕනේ කියලා තමා මම දැනුවත් වුණේ.ඒ ගැනත් යලි දැනුම් දීම කරනවා.

ඒත් එක්කම සම්භාහන මධ්‍යස්ථාන සම්බන්ධ යෙය්ජනාව ගෙනාවා.එදාට පහුවදා ඉඳන් ම ක්‍රියාත්මක කරනවා කිව්වට, මං හිතන්නේ ඒ මධ්‍යස්ථානවලට ඊට වැඩිය දැන් දිලිසෙන බල්බ් ටිකක් දාලා ඊට වඩා හොඳට කරගෙන යන එකක් තමා දැන් දකින්න පුළුවන්.ඒකට පොලිසියෙන් සහයෝගය නෑ කියලා තමා කතාව යන්නේතමං දන්නැ ඒක මොකක්ද කියලා.ඒ ගැනත් මම මේ වෙලාවේ මතක් කරනවා.

තව දෙයක් තමා සභාපතිතුමා අපි සභාවට එනව යනවා පේන්න නෑ කියන එක හැමෝටම ප්‍රශ්නයක් වෙලා තියෙනවා.ඇත්තට ම අපිට ඇවිල්ලා ඉන්න තැනක් නෑ.මං ගොඩ වෙලාවට ආවහම ඔබතුමාගේ කාමරේ තමා ඉඳ ගන්නේ.නමුත් පෞද්ගලිකව කවුරු හරි කෙනෙක් එතනට ඇවිල්ලා ඉන්න කොට අපි එතන ඉඳගෙන ඉන්න හොඳ නෑ.ඒ නිසා අපි ඉස්සරහ එළියේ මේසේ තමා ඉඳගෙන ඉන්නේ.ඒ නිසා පක්ෂ විපක්ෂ වලින් තොරව අපිට ඉන්න තැනක් හදලා දෙන්න කියන ඉල්ලීමත් කරනවා.

**සභාපතිතුමා :-**
ඇත්තටම සැහෙන ගැටලුවක් තියෙනවා තමා ඉන්න තැනක් නැති එක.අපිටත් ඕනෙ තැනක් දෙන්න.තැනක් මේකෙ නැති එක තමා ප්‍රශ්නය.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,උදේ ජල ප්‍රශ්නය යෝජනා කරන වෙලේ කතා කළා බිසෝදොළ ඇල්ල පිළිබඳව.දැන් වීඩියෝ එකක් ඇවිත් තියෙනවා.ඒකෙත් කිරි වතුර .මා ගලා යන්නේ.මේක විශාල ප්‍රශ්නයක් මජ හිතන්නේ.

**සභාපතිතුමා :-**
අපි හෙට උදේ යන් බලන්න.

**සභික ඩබ්ලිව්.සමන්සිරි විජේසිංහ මැතිතුමා:-**
හෙට උදේ හරි ගිහිල්ලා බලනව නම් හොදයි.දෙනේ කාරණය තමා ගයාෂාන් මන්ත්‍රීතුමා ගෙනා යෝජනාවට අපිත් කැමතියි.අපි ඒකට විරුද්ධත් නෑ.නීතිමය රාමුවක් තියෙනවනේ.ඒ නිසා තමා අපි අත ඉස්සුවේ නැත්තේ.මේකෙදි අපි සද්භාවයෙන් කඩේ වහනව නම් අපි බෞද්ධ ද මුස්ලිම්ද හින්දුද කියන එක අදාළ නෑ.අපිට සද්භාවයෙන් කඩේ වහලා ඕන දවසක යන්න පුළුවන්.නමුත් අපි මේකට විරුද්ධ වුණ හේතුව තමයි අපි මේ රීති ප්‍රශ්නයක් තියෙන දේකට ගිහිල්ලා අපි අධිභාරයකට යන්න ඕන් නැති හින්දා.නමුත් මේකෙදි මම කියන්න ඕනේ ඇත්ත ම කතාව තමා සමහර කෙනෙක්ගේ කඩයක් ඇරලා අනිත් කෙනාගේ කඩේ වහනවට තියෙන විරුද්ධත්වය තමා මේකෙ තියෙන ප්‍රශ්නය.(සෝෂාව) කෙනෙකුට ලාභයක් ලැබිලා කෙනෙකුට ලාභයක් නොලැබෙන එක තමා මේකෙ ප්‍රශ්නය.සද්භාවයෙන් ඕනැම ආගමක කෙනෙකුට ඕනම අවස්ථාවක ඕන ම කඩයක් වහන්න පුළුවන්.ඇයි අපි නීති දාගන්නේ.මේ ප්‍රශ්නය කතා කරන්න නෙමෙයි හිටියේ.මේ ගැන දැඩිව කතා කරපු නිසා මේ කතා කරන්නේ.පෝය දවසක මම සභාපතිතුමත් එක්ක මළ ගෙදරක ගියා.ඒ පොය දවසේ මළ ගෙදර අයට දවල්ට කෑමට බඩු ටික ගන්න මේ ටවුමේ කඩයක් නැති නිසා ඒ අය අවිස්සාවේල්ලට ගිහිල්ලා ලක්ෂ එක හමාරක බඩු ටිකක් ගේනාව කිව්වා මැණික් ව්‍යාපාරිකයෙක්.අන්න ඒ වගේ අවස්ථා නැති වෙනවා.මේකෙ දෙපැත්තක් ම තියෙනවා.මං කියන්නේ මේක ඇත්තට ම හොඳයි.සේවකයන්ට නිවාඩු දෙන්න ඕනේ.පෝය දවසට අපි බෞද්ධයෝ වශයෙන් අපි පන්සල් යන්නත් ඕනේ.නමුත් අපි මේක කරද්දී නිත්‍යානුකූලව බැඳෙන්න අවශ්‍ය නැනේ.මේක ඒ අයට සද්භාවයෙන් වෙළඳ සංගම් තියෙනවා.එයාලට කතා කරලා මේක කර ගන්න පුළුවන්.අපේ කිසි ගැටලුවක් නෑ.අපි කඩ අරින්න කියන්නෙත් නෑ වහන්න කියන්නෙත් නෑ.අපි කිසිම බලපෑමක් කරන්න අවශ්‍ය වෙන්නේ නෑ.එයාල ස්වෙච්ඡාවෙන් ඒ තීරණය අරගෙන කරගෙන යයි.පෝය දවසට තමයි මිනිස්සු බඩු ගන්න ටවුමට එන්නේ.ගාමට යන ළමයින්ට නිවාඩු තියෙන්නේ ඒ දවසට.වැහුවොත් ව්‍යාපාර වශයෙන් පාඩු වෙනවා.ඇරියොත් සේවකයින්ට නිවාඩු නැතුව යනවා.ඒ නිසා මේ දෙකම බැලන්ස් කර ගෙන එයාල ක්‍රමවේදයක් හදා ගන්නව නම් කිසි ගැටලුවක් නෑ.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි,ඔබතුමාගේ නගර සීමාව තුළ අස්ගගුල ඇළ හරහා යන මාර්ගය දැඩි සෝදා පාළුවකට ලක්වෙලා තියෙනවා.එක තැනක් හදමින් පවතිනවා කැඩිලා තියෙන තැනක්.ඒක එතන විතරක් හදාලා ප්‍රමාණවත් නෑ දිගටම හැදුවේ නැත්තම්.

**සභාපතිතුමා :-**
ඔවු දැන් එකේ වැඩ පටන් අරන් තියෙන්නේ දැන්.

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
ඒක දිගටම හදනවද? ඒ පැතිබැම්ම දිගටම හදන එක ඉතා වැදගත් කියලා මම කියනවා.ඒත් එක්කම ඊයේ මුදල් කමිටුවේ දී වීථි ලාම්පු සඳහා අවශ්‍ය කොටස් මිලදී ගැනීම සඳහා යෝජනාවක් ආවා.මම ඒ යෝජනාවට විරෝධය දැක්වුවා.මම ඒ යෝජනාවට අත්සන් කළෙත් නෑ.හේතුව තමා අපි දිගින් දිගටම ඉල්ලීම් කළා සභාව පටන් ගත්ත දවසේ ඉඳන් අපිට වීථි ලාම්පු ලබා දෙන්න කියලා.නමුත් අපිට දුන්නැනේ.ඒ නිසා කොකු ගන්න අපේ අනුමැතිය දුන්නෙ නෑ.

**සභාපතිතුමා :-**
අපි මේ වෙනකොට 1000 ක් ගෙනාවා.1000 ම දාල ඉවරයි.ඉතිහාසයේ පළවෙනි වතාවට මාස 8 ක් තුළ වීදි ලාම්පු 1000 ක් දාළ ඉවරයි.(ඝෝෂාව)

**සභික ඒ.ටී.සී.අතුරලිය මැතිතුමා:-**
විශේෂයෙන් ම බෝපැත්ත පාර වීදි ලාම්පු ඔක්කොම මේ වෙන කොට අක්‍රිය වෙලා තියෙන්නේ.වීදි ලාම්පු දාන්න ඕන තැන් පෙන්නන්න කිව්වා.අපි ලිඛිතව ලබා දුන්නා.සභාපතිතුමා මෙතෙක් ඔය ස්ථාවරයේ හිටියේ නෑ.උපසභාපතිතුමා විතරයි ඒ ස්ථාවරයේ හිටියේ.සභාපතිතුමත් එතනට ගිය එක ගැන සතුටුයි.ඒ කියන්නේ සභාවෙන් මොකුත් අපිට ලැබෙන් නෑ කියලා.ඒ ගැනත් දැන ගැනීමට ලැබුණු එක අගේ කරනවා.
මී ළඟට පොළ ආසන්නයේ ඇති කඩ කාමර හා ඒ අවට හා පොළේ ඇති වැසිකිලි පද්ධතිය ටෙන්ඩර් දාල මේ වන විට ලබා දීලා තියෙනවා.ඒ වුණත් ඒ අවට ප්‍රදේශය හරිම අපිරිසිදු බවට පත් වෙලා තියෙනවා.සමහර අය වැසිකිලියට නොගිහින් අවට ඒ සඳහා භාවිතා කරනවා.ඒ නිසා ඒ සම්බන්ධව සොයා බලා සුදුසු ක්‍රමවෙදයක් සකසන්න.
ඒත් එක්ක ම දැන් බලු ගහනය වැඩි වෙමින් පවතිනවා.ඒ නිසා විදී සුනඛයින් වැඩි වෙමින් පවතිනවා.ඒකටත් ක්‍රමවේදයක් සකසන්න කියලා ඉල්ලා සිටිනවා.රෝහල් භූමිය හා රාජ්‍ය ආයතනවල සුනඛයින් බහුලව ඉන්නවා.ඒක ලොකු ප්‍රශ්නයක් බවට පරිවර්තනය වෙමින් පවතිනවා.ලංකාවේ විදී සුනඛයින් ලක්ෂ තුනකට අධික ප්‍රමාණයක් දැනට හඳුනගෙන තියෙනවා.මේ ප්‍රදේශයෙත් ඒක ප්‍රශ්නයක් වීගෙන යනවා.ඒ ගැන විශේෂ අවධානය යොමු කරන්න.
ඒ වගේම තලාවිටිය යෝජනා ක්‍රමය ඔබතුමා දැන් කිව්වා තව මාසෙන් වගේ අවසන් කරන්න පුළුවන් වෙයි කියලා.ඒකට උපරිම මැදිහත් වීමක් කරලා ඉක්මන් කරන්න.මොකද ජල ප්‍රශ්නය ඉතාම දැඩිව බලපානවා.ඒත් එක්ක ම බිසෝදොළ ඇළ මාර්ගයේ ප්‍රශ්නයටත් ඔබගුමා විශේෂ අවධානය යොමු කරන්න.ඒකට ප්‍රධාන හේතුව වෙලා තියෙන්නේ වත්තේ රබර් කිරි නිසියාකාරව පෙරනයට ලක් නොකර නොකර බැහැර කිරීම.ඒ ගැනත් විශේෂ අවධානය යොමු කරන්න.
අපේ ප්‍රදේශයට මේ යුද්ධයේ බලපෑම එමින් පවතිනවා.දිලීන් මන්ත්‍රිතුමා කිව්වා වගේ තෙල් මිලට විතරක් නෙවෙයි, මේ ප්‍රදේශයේ තේ වගා කරුවන් බහුලව ඉන්නවා.ඒ අය තේ අපනයනය සම්බන්ධව ලොකු ගැටලුවකට මුහුණ දෙමින් පවතිනවා.ශ්‍රමිකයන් දස ලක්ෂයක් විතරක් ඉන්නවා.එකෙන් යැපෙන හතලිස් ලක්ෂයක් පමණ ඉන්නවා.ඒ අයට සෘජුව බලපානවා මේ සිද්ධිය.ඒ ගැනත් විශේෂ අවධානය යොමු කරන්න.

ඒත් එක්ක ම මේ වෙනකොට ඉරානයේ බාලිකා පාසලකට බෝම්බ හෙලීම නිසා ළමයි 162 න් මිය යාමට භාජනය වුණා.ඒ සම්බන්ධව විරෝධයක් ප්‍රකාශ කරන්න අවස්ථාවක් කර ගන්නවා.එවන් කෲරිරු සිද්ධිවලට භාජනය නොකරනවා නම්, කුමන රටක් හෝ බලපෑමක් කරනවා නම් ඒක සුදුසු නෑ කියලා මම මේ වෙලාවේ සුදුසු නෑ කියලා ප්‍රකාශයක් කරන්න මේ වෙලාවේ අවස්ථාවක් කර ගන්නවා.

ඒත් එක්කම මේ ප්‍රදේශයේ ජනතාවට වතුර නැතිවෙමින් යනවා.තේ වතුවලටත් ජලය නැති වෙමින් යනවාතජ් සහා තාක්ෂණික ක්‍රමවේදයක් යොදා ගෙන මේ තේ වතුවලට ජලය ලබා දීමේ ක්‍රමයක් සකසන්න පුළුවන් නම් අපේ පානීය ජලයත් එක්ක.ඒ ගැනත් විශේෂ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**සභික කේ.ඩබ්.ඒ.නඳුන් සමීර මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, මම පැහැදිලි කිරීමක් කර ගන්න කැමතියි.අපි පක්ෂ විපක්ෂ කියලා දෙපිලක් බෙදිලා දේශපාලනය කරනවා.අද අපි බෙදීමකට ගිහිල්ලා අපි ජයග්‍රහණය කරා නම් ඒ බෙදීමෙන්, ලොකු සතුටක් ඇති වෙනවා.නමුත් අද අපි බෙදීමකට ගිහිල්ලා අද අපි දිනුවා.නමුත් ඒක සතුටක් ලබන්න කාරණාවක් නෙමේ.පෝයදවසට කඩවල් වහලා තියෙනව නම් අපිට හැඟීමක් එනවා.පෝයට පන්සලට සෙනග එනව නම් අපිට හැඟීමක් එනවා.අපි බෞද්ධයෝ කියන එක එනවා.ඇත්තටම අද කණගාටුයි.මේ යෝජනාව සභාවට නොගෙන ආවනම් හොඳයි කියලා මම හිතනවා.මෙච්චර කල් කඩවල් 4 ක් 5 ක් ටවුන් එකේ ඇරියා.මේ යෝජනාව සභාවට ගෙනාපු නිසා මිනිස්සු දැන ගන්නවා කඩවල් අරින්න පුළුවන් කියලා.අර තිබුණු ප්‍රවණතාවයත් නැති වෙනවා මේ නිසා.ඒ නිසා මම කණගාටුව ප්‍රකාශ කරනවා ඒ පිළිබඳව.

ඒ වගේම මම කාර්මික සේවා කමිටුවේ සභාපති විදිහට, මුදල් කමිටුවට අදාළ මන්ත්‍රිවරු හැම දෙනාම ඇවිත් ඉන්නවා දැක්කා.නමුත් කාර්මික සේවා කමිටුවට සහභාගීවෙන පිරිස අඩුයි.අපිට ස්ථානීය පරීක්ෂණ තියෙනවා සැහෙන්න කරන්න.ඒකටත් පිරිස සහභාගී වෙන්නෙ නෑ.මං ඉල්ලීමක් කරනවා ස්ථානීය පරීක්ෂණයට හා කාර්මික සේවා කමිටුව පැවැත්වෙන දවසට පැමිණෙන්න කියලා.අඩුම තරමේ කාර්මික සේවා කමිටුව තියෙන දවසටවත් පැමිණෙන් කියලා.

**සභික එච්.පී.ජේ.පී.හිරිපිටිය මැතිතුමා:-**
ගරු සභාපතිතුමනි, සභාවට ම ලැජ්ජ හිතෙන සිදු වීමක් වුණා.ඊයේ පෙරේදා නගර සභා ක්‍රීඩාංගනයේ සංගිත ප්‍රසංගයක් පැවැත් වුණා.ඒ සංගීත ප්‍රසංගය පවත්වපු අය ආදරණිය ඇහැලියගොඩ කියන ජේජ් සංගීත පිස්සෝ කියන ඒකේ දාල තියෙනවා,"ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාවේ ටිකට් පත් මගින් 15% බද්දක් අය කර, ඒය පරික්ෂා කිරිමට පැමිණි නිලධාරීන් බීමත්ව අශෝභන ලෙසින් හැසිරෙමින් සංවිධායකවරුන්ට ඔවුන්ගේ කටයුතු සිදු කිරීමට නොදී අප්‍රසන්න ලෙස හැසිරුනේය.ඔවුන්ගේ සියලු මිතුරන් ප්‍රසංග භූමියට ප්‍රවේශ පත්‍ර නොමැතිව නොමනා අයුරින් ප්‍රසංග භූමියට ඇතුළත් කෙරුවේය.ආපු මොහොතේ ඉඳන් ඔවුන්ගේ ටිකට් පරික්ෂක වරුන්ට බීමට අරක්කු හා මුදල් ඉල්ලමින් රාජ්‍ය නිලධාරීන්ගේ ක්‍රියා පටිපාටියට නොගැළපෙන ලෙසින් නොමනා අන්දමින් හැසිරුනේය.ලැජ්ජයි ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව"මේ නිලධාරීන් කවුද කියලා ඔබතුමා තමා හඳුනන්නේ.ඒ ගැන සභාවේ අවධානය යොමු කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**සභික එච්.එම්.රංජිත් බණ්ඩාරමැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා, මම අතින් වියදම් කරලා ගත්ත බල්බ් ටික දාගන්න ඉලෙක්ට්‍රිසියන් මහත්මයා දෙන්න කියලා.මම ළඟදිත් කතා කරාම ඒතුමා කිවුවා අවසරයක් නැතුව මට ඒන්න බෑ කියලා.පුළුවන් නම් මට ඒ බල්බ් ටික දාගන්න ඒ මහතා ලබා දෙන්න.

**සභික ඩී.ජී.ගයාෂාන් චින්තක කරුණාරත්න මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, පෝයට කඩ වහන යෝජනාව සම්බන්ධයෙන් දෙපාර්ශවයේ විධ මත තිබුණා.නමුත් අවසානයේ දී අපිට ඒකට ඒකඟතාවයකට එන්න බැරි වුණා.අපි ඒ සම්බන්ධයෙන් බෙදීමක් ලබා ගෙන ඒ යෝජනාව නව ඒක්සත් වෙළඳ සංගමය විසින් පෝය දිනයන්හිදී නගරයේ වෙළඳසැල් වැසීමට කරන ලද ඉල්ලීම් පිළිබඳ යෝජනාව අපි පරාජයට පත් වුණා.ඒ යෝජනාවට විරුද්ධව ඡන්ද 20 ක් හා විපක්ෂව ඡන්ද 15 ක් ලැබුණා.ඒකෙදි මේ යෝජනාව ගේන්න ප්‍රධාන හේතුවක් වුණා වැඩ කරන ජනතාව අපට කරන ලද ඉල්ලීම.වුන්ට අපිට තමා කියන්න පුළුවන් මේ නිවාඩු දවස ලබා දෙන්න කියලා.මේකෙ කවුරු හරි කෙනෙක් මේ කඩ වහනවට විරුද්ධව, ඒ කියන්නේ මේ කඩ වහන ඒකට විරුද්ද නම්, ඔබගුමා කියන්නේ විරුද්ද නෑ කියලනේ.නීතිය සම්බන්ධ ගැටලුවක්නේ.කවුරු හරි කෙනෙක් විරුද්ද නම් ඒ විරුද්ද කෙනාඅර කම්කරුවන්ගෙන් අනවශ්‍ය විදිහට වැඩ ගන්න ඔවුන්ව මරවලා වැඩ ගන්න ඒ ආයතන රකින අය.පෝ දවසේ මේ කඩ තියෙනවා.කිසිම කඩයක් ගෙවන් නෑ පඩි දෙකක්.ඊපහට නිවාඩුව දෙන්නැ.ඒ මිනිස්සු අසීමිත දුකක් විදිනවා.ඉතින් අද දින ඒ යෝජනාව පරාජයට පත් වුණා.ගරු සභාපතිතුමා කියනවා අපිව බේර ගත්තා කියලා.ඒක මගේ යෝජනාවක් නෙමේ.ඒක මට සහ මාලින්ද මුදන්නායක මන්ත්‍රිතුමාට වෙළඳ සංගම් අත්සන් කරලා නිල වශයෙන් භාර දීපු ඉල්ලීමක්.ඊට අමතරව ඔවුන් 2026 වර්ෂය සඳහා අයවැය යෝජනා ගන්නකොට 2025 වර්ෂයේ දී ඒකත් ඉදිරිපත් කරපු ... යෝජනාවක්.

දැන් ඔබතුමා කිවුවා රත්නපුර දිස්ත්‍රික්කයේ වැඩිම පුරන් කුඹුරු තියෙන්නේ ඇහැලියගොඩ කියලා.ඒක වතුර අඩු වීමටත් හේතුවක් කිවුවා.ඊට වඩා හේතුවකුත් තියෙනවා ගරු සභාපතිතුමා.අපි මේ ටවුන් ඒකේ කොළඹ පැත්තට ගියත් රත්නපුර පැත්තට ගියත් දෙපැත්තෙම තියෙන කුඹුරු ටික දැන් ඉවරයි.පොඩි පෙට්ටි කඩ පෙට්ටි කඩ දීගට හදාගෙන යනවා.ගියසතියේ නිවාඩු දවසක් තිබුණා.පොලිසියට පොඩ්ඩක් ඒහා පැත්තේ පස් දාල ගොඩ කරනවා.ඒ වෙලාවේ මම අදාළ පාර්ශවයන් දැනුවත් කළා.මේ මහ දවල්.මම කොළඹ යන්න යනකොට ඉඩමක් ගොඩ කරනවා.ඔවුන් ඉතාම බලවත්ව කිසිම දේකට බයක් නැතුව, නීතියකට යටත් නැතුව ඉතාමත් අවිධිමත් විදිහට ගොඩ කිරීම් කරගෙන යනවා.මේක සභාපතිතුමා දැන් ම නවත්ත ගන්න ඕනේ.නැත්තම් ගරු සභාපතිතුමා උපසභාපතිතුමා මේවා නවත්වන්න වෙන් නෑ. මේක දැම්මට පස්සේ, මේවා ප්‍රමාණය වැඩි වුණාට පස්සේ වදයක් වෙනවා.සම්බන්ධතා වැඩියි.අපි ඔයාල වෙනුවෙන් වැඩ කළා.අපි අහවලාගේ.ඒ වගේ කතා එනවා. ඉතින් ඒවා සම්බන්ධයෙන් නිසි ක්‍රියාමාර්ගයක් ගන්න සභාපතිතුමා.මේ අප් සුමිත් මන්ත්‍රිතුමත් එදා ඉඳන් ම කියනවා.මේ ටවුම් එක සුද්ද කරමු කියලා.නමුත් ඒ සම්බන්ධයෙන් කිසිම ක්‍රියාමාර්ගයක් ගන්න නම් පේන් නෑ.

තව සභාලතිතුමා කිවුවා පායන කාලේ වතුර නැති වෙන් නෑ වතුර තියෙනවා කියලා.ඒ වගේ තමා ගරු ජනාධිපතිතුමත් කිවුවේ ඩීසල් තියෙනවා කියලා.දවස් 22 කට තියෙනවා කිවුවාතටැංකියෙ තියෙන එකට තමා මිල වැඩි වුණේ.ඒ ලංකාවට ගෙනැත් තිබුණ ටංකියේ ඩිසල් මිල වැඩි වුණේ කොහොමද කියලා ගරු ඇමතිතුමාගෙන් අහලා ලබන සැරේ සභාවෙදි අපට කියන්න කියලා කිනවා ඔබතුමාට.කැබිනට් ප්‍රකාශකවරයත් ප්‍රකාශ කළා මේ මාසෙ තෙල් මිල වැඩි වෙන් නෑ කියලා.යම්කිසි වැඩි වීමක් ඇති හැබැයි, ඒවා අපි ක්‍රමානුකූලව සකස් කර ගත යුතුයි.ර 11 ට විතර ඔය මිල වැඩි වීම වැඩි වුණේ.අපේ ප්‍රදේශයේ ඔබතුමාලගෙ පක්ෂයට සම්බන්ධ කෙනෙක් දාල තියෙනවා,ෆේස්බුක් එකට පකිස්ථානය වැඩි වුණා 50 කින් තව රටවල් දෙ තුනක දාලා තිබුණා.අපේ තමා අඩුවෙන් ම වැඩි වුණේ කියලා.ඇත්ත.හැබැයි චුට් බොරුවක් තියෙනවා.පකිස්ථානයේ වැඩි වුණේ 55 කින්.එතකොට පක්ස්ථානයේ අගමැතිවරයා තව ප්‍රකාශයක් නිකුත් කරනවා.රුපියල් 55 කින් ඩීසල් වැඩි වෙන කොට ඔහු ප්‍රකාශයක් නිකුත් කරනවා.ඒ තමා 50% කින් රජයේ වාහනවල ඉන්ධන දීමනාව අඩු කරනවා... මාස දෙකක පඩිය අඩු කරනවා.දවස් 4 ක් තමා සතියට වැඩ කරන්නේ.ඒ වැඩ කරන අයගෙන් 50% ක් WORK FROM HAME.ඊට පස්සේ ඊළඟ සතිය ඉස්කෝල නිවාඩු. කැම්පස් හා උසස් අධ්‍යාපන ආයතන ඉක්මනින්ම ඔන්ලයින් ක්‍රමයට මාරු කරලා තියෙනවා.ඉතින් ගරු සභාපතිතුමා මේ ආර්ථික තත්ත්වයට මුහුණ දෙන්න සභාවක් විදිහට යම් යම් තීන්දු ටිකක් ගන්න වෙනවා.ඩිසල් ලීටරය රුපියල් 24 න් වැඩි වුණහම ගමේ කඩේ ප්ලේන්ටියත් රුපියල් 24 කින් වැඩි වෙනවා.බනිස් ගෙඩියත් රුපියල් 24 කින් වැඩි වෙනවා.බස් ගාස්තුවත් වැඩි වෙනවා.ඉතින් මේවා ආණ්ඩුවක් හැටියට ඔබතුමාලා ඔබතුමාලගේ නායකයොත් එක්ක කතා කරලා යම්කිසි වැඩපිළිවෙළක් හදා ගන්න වෙනවා.මේ සිංහල අලුත් අවුරුද්දක් එන්නේ.මේ අවුරුදු කාලේ මොනවගේ ප්‍රශ්නවලට මිනිස්සුන්ට මුහුණදෙන්න වෙයිද කියලා අපි දන්නේ නෑ.

ඒ වගේම නොරොච්චොලෙ ගැනත් කතා වුණා.නොරොච්චෝගෙ සභාවෙනුත් කතා කරලා කියලා තියෙනවා දුම වැඩියි කියලා තියෙනවා සභාපතිතුමා.(ඝෝෂාව)

අද දීර්ඝ කතාවක්.දේශපාලන වශයෙන් දේශපාලනයේ වාසි පැත්තට කොයිවෙලාවත් දේශපාලනය කරන් නෑ.කලින් ආපු යෝජනාව සුහදව කතා කරලා ගෙනාපු යෝජනාවක්.නමුත් අවසානයේ බෙදීමකට යන්න වුණා.ඒක ඔබතුමාලගේ තීන්දුව ගත්තා.අපි අපේ තීන්දුව ගත්තා.ඒක ගැටලුවක් නෑ.මට ඒ හින්දා එකම එක ගැටලුවයි තියෙන්නේ.ඔවුන් අපිට ලිඛිතව දුන්නා.උපසභාපතිතුමාට කිවුවා කිවුවා ඕන්නෑ කියලා.ඒක විතරයි මට ගැටලුවකට තියෙන්නේ.ඒක ඇත්ත නම් මං ආයෙ එහෙම අයත් එක්ක සම්බන්ධ වෙන්නේ නෑ.එහෙම අයත් එක්ක වැඩ කරන්න බෑ.

**සභික ඩබ්ලිව්.එම්.අමිල් නිමේෂ බණ්ඩාර මැතිතුමා:-**

ගරු සභාපතිතුමනි, වෙළඳ සංගමයෙන් ආපු යෝජනාවේ වෙළඳ සේවකයාගෙන් ආපු යෝජනාවක් කියලනේ සඳහන් වුණේ.සේවකයින් 1500 ක් විතර ඉන්නවා.එයාලට පෝය දවසේ වැඩ කරන්න බෑ කියන එකනේ කියන්නේ.කම්කරු නීතිය යටතේත් ඒ ගැටලුව තියෙනවා.ඒක එන්න ඕනේ එක්කෝ වෙළඳ සංගමය විදිහට නෙමේ, වෙළඳ සේවක සංගමයක් විදිහට.(ඝෝෂාව) මෙක වෙන පැත්තකට හරවන්න එපා.නීතිය අනුවත් තියෙනවා වැඩ කරන්න පුළුවන් සතියට දින 5 යි.දවස් එක හමාරක් සතියට නිවාඩු තියෙනවා.ඒකත් වැඩ

කරනව නම් 1.5 ඕටී දෙන්න ඔනේ.ඒ වගේ නීතියක් තියෙද්දි වෙළඳ සංගමය වෙනුවෙන් කතා කරනවා කියපු එක වැරදියි.එහෙම නම් ඒක වෙළඳ සංගමය නෙමේ වෙළඳ සේවක සංගමයෙන් ආපු යෝජනාවක් වෙන්න ඕනේ.

**සභාපතිතුමා :-**
අද දින සාමාන්‍ය මහා සභා රැස්වීම නිමාවට පත් වෙනවා.පැමිණි සියලු දෙනාටම සුභ සන්ධ්‍යාවක් කියලා ප්‍රාර්ථනා කරනවා.දැන් වේලාව ප.ව 5.15 යි

බන්ධුලසේන දුණුවිල,
සභාපති,
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභාව.

2026 ක් වූ..................................මස...........දින
ඇහැලියගොඩ ප්‍රාදේශිය සභා කාර්යාලයේ දී.